# බුදුසරණ

ධර්ම භාණ්ඩාගාරයක් - සාරධර්ම සංග්‍රහයක්     www.budusarana.lk     email:budusarana@lakehouse.lk

ශ්‍රී බුද්ධ වර්ෂ 2564ක් වූ නිකිණි අව අටවක පෝ දා, රාජ්‍ය වර්ෂ 2020 අගෝස්තු 11 අඟහරුවාදා, BUDUSARANA,TUESDAY AUGUST 11, 2020

55 වැනි කාණ්ඩය, 09 වැනි පත්‍රය, ආරම්භය 1965 - 06 - 13 , ප්‍රවෘත්ති පත්‍රයක් වශයෙන් ශ්‍රී ලංකාවේ ලියාපදිංචි කරන ලදී. පිටු 24     මිල රු. 40.00



# පුණ්‍ය මහිමයෙන් හිමි වන ඉහළම සම්පත් සතරක්

**මේ ලෝකයේ තිබෙන ප්‍රධාන කාරණා දෙකක් වශයෙන් සම්පත්තිය සහ විපත්තීන් සඳහන් කළ හැකි යි. කර්මය සම්බන්ධයෙන් බුදුන් වහන්සේ සම්පත්තීන් හතරක් වදළා. ගති සම්පත්තිය, උපධි සම්පත්තිය, කාල සම්පත්තිය සහ ප්‍රයෝග සම්පත්තිය ලෙසින්. මේ සම්පත්තීන් සතර ම විපත්ති බවට පත්වෙනවා. කෙසේද? ගති විපත්තිය, උපධි විපත්තිය, කාල විපත්තිය, ප්‍රයෝග විපත්තිය ලෙසින්.**



මුලින්ම සම්පත්තියට අයත් කරුණු සතර කුමන ආකාරද්’යි බලමු. මේ ලෝකයේ යමෙක් වාසනාවන්ත උපතක් ලබනවා නම්, ඒ උපත සැප සහිතයි. එය ධර්මයේ සඳහන් කරන්නේ සුගති නමින්. එනම් යහපත් උපත, මැනවින් ලත් උපත යන අදහස යි. එවිට ගති සම්පත්තියේ දී බුදුරජාණන් වහන්සේ පෙන්වා දෙන්නේ, මනු ලොව, දෙව් ලොව, බඹ ලොව ආදී ලෝකවල ඉපදීම ගති සම්පත්තිය ලෙස යි. ගති සම්පත්තිය ලැබීම වාසනා ගුණයක්.

‘මිනිසත් බව දුර්ලභය’ යන්න නිතර අපට ඇසෙන බණ පදයක්. එනම්, සාංසාරික සත්ත්වයන් යළි යළිත් මනුස්සයෙක් ලෙසින් සුගතියක උපත නොලබන අදහස යි. සුගතිය නම් මනු ලොව, දෙව් ලොව, බඹ ලොව, සුගතිය ආදිය යි. එවිට එය අප්පත්තියක් නිසා ධර්මයේ සඳහන් කරනවා, අති සම්පත්තිය වශයෙන්.

තවත් කාරණයක් වන්නේ උපධි සම්පත්තිය යි. එනම්, සුගති සම්පත් ලැබුණු කෙනාට පහසුවෙන් යැපෙන්නට, පහසුවෙන් ජීවත් වන්නට වටපිටාව සකස් වෙනවා. ඇති හැකි සෞභාග්‍ය සම්පන්න පවුල් පසුබිමක උපත ලබනවා. පාරම්පරික දේපළ වස්තුවකට උරුමකම් කියනවා. එහෙමත් නැතිනම්, මව්පියන් තම දරු පරපුර සැපවත් කරනවා, අන් අය පහදවන රූප සම්පත්තියක් ලැබෙනවා. අන් අයට අසා සතුටු වන්නට පුළුවන් තරම් හොඳ කට හඬක් ලැබෙනවා. හඬ පෞරුෂයක් ලැබෙනවා.

අප දන්නවා, මේ ලෝකයේ සෑම දෙනාට ම හඬ පෞරුෂය ලැබෙන්නේ නැහැ. ගායන ක්ෂේත්‍රයෙන් ගත්තත් ඇතැම් ගායකයන් මිය පරලොව ගිහින් දසක ගණන් ගත වුණත්, ඒ අය තවමත් අපේ සමාජය තුළ ජීවමාන කියන ගෞරවය ලබනවා. එය උපධි සම්පත්තියක් වශයෙන් හඳුන්වනවා.

භව භෝග සම්පත් ලැබීම, පහසුවෙන් ජීවත් වන්නට ලැබීම, සිත පහදින ආකාරයේ රූප සම්පත්තියක් ලැබීම, මනා හඬ පෞර්ෂය, නිරෝගී සම්පත් ලැබීම, අඟ පසඟ මැනවින් පිහිටන පරිපූර්ණ දේහයක් ලැබීම ආදිය සෑම දෙයක් ම උපධි සම්පත්තියට අයත් වෙනවා.

තවත් දෙයක් ධර්මයේ සඳහන් වෙනවා, ඇතැම් කෙනෙක් සුගතියේ උපත ලැබුවත් දුක් විඳින්නට සිදු වෙනවා. මනුස්ස ලෝකයේ මනුස්සයෙක් ලෙස දුර්ලභ මිනිස් දිවියක් ලැබෙනවා. හැබැයි, අන්ත අසරණ පීඩිත පන්තියේ පවුලක උපත ලබනවා. එවිට කුසගින්නේ, හරි හමන් වස්ත්‍ර නොමැතිව, අධ්‍යාපනය ලබන්නට උදව් කරන්නට කෙනෙක් නොමැතිව, හරි හමන් රැකියාවක් නැතිව, පිහිට වන්නට කෙනෙක් නැතිව ඉන්නට සිදු වෙනවා. ඒ අයගේ දුක කවුරුත් නොඅසා, ඒ අය ගණන් නොගෙන ජීවත් වෙනවා. එතන සුගති සම්පත්තියක්. එනම්, ගති සම්පත්තියක් තිබුණ ද උපධි සම්පත්තිය ලැබෙන්නේ නැහැ. ඒ නිසා ම එය විපතක් බවට පත් වන අවස්ථා තිබෙනවා.

එහෙමනම්, සුගති සම්පත්තියක් ලද පමණින් සෑම කෙනෙක් ම සමාන සෞභාග්‍ය සම්පන්න ජීවිතයක් ලබන්නේ නැහැ. එය තමන්ගේ ලැබීම නොලැබීම අනුව සිද්ධ වෙයි. තමන්ගේ පුණ්‍ය ගුණය බලවත් නම්, අප කරන වැඩපිළිවෙළට අපට උදවු උපකාර කරනවා. සුගති සම්පත් ලැබුණත් පින් බලය අඩුනම්, යම් යම්, ක්ෂේත්‍රවල, ඒ සමාජය වෙනුවෙන් යුතුකම් ඉටු කරන්න වෙන්නේ බාධා කම්කටොළු මැද යි.

තෙවන කාරණය වන්නේ කාල සම්පත්තිය යි. යුධ කලකෝලාහල නැති, ස්වභාවික විපත් නැති, වසංගත නැති පරිසරයක උපත ලබන්නට ලැබෙනවා. එවැනි රටක, එය කාල සම්පත්තිය යි. එහෙත්, ඇතැම් අවස්ථා තියෙනවා, සුගති සම්පත් ලැබෙනවා, එසේම උපධි සම්පත්තියත් ලැබෙනවා. හැබැයි, යුද්ධ කාලයක උපත ලබනවා. වසංගත කාල පවතින වකවානුවක උපත ලබනවා. ස්වභාවික ආපද බහුල ප්‍රදේශයක නාය යාම්, ගිනි කඳු පිපිරීම් සුනාමි තත්ත්වයන් ඇති පරිසරයක උපත ලබනවා. මිනිස් ආත්මයක් ලැබුවත්, සැප පහසුව ජීවත් වන්නට වාසනාව තිබුණත්, නැවත නැවතත් ආපදාවන්ට ලක්වීම නිසා, කාල විපත්තීන් නිසා දුකට පත් වෙන්නට සිදු වෙනවා. මේ එකකට එකක් පැහෙන්නේ නැහැ. පරස්පර යි. ඇතැම් අයට සුගති සම්පත්, උපධි සම්පත් ලැබී වාසනාවන්ත කාල සමයක උප්පත්තිය ලබනවා. හොඳම කාල සම්පත්තිය වන්නේ බුද්ධ ශාසනයක් ඇති කාලයක උපත ලැබීම යි. එවිට ත්‍රිවිධ රත්නය කෙරෙහි සිත පහද ගන්නට ලැබෙනවා. ත්‍රිවිධ පුණ්‍ය ක්‍රියා සිද්ධ කරනවා. ශීල, සමාධි, ප්‍රඥා, නිවන් මඟ ප්‍රගුණ කර ගන්නට ලැබෙනවා.

බුදුවරු සම්බුද්ධත්වයට පෙර ඇතිව තුසිත දිව්‍ය භවනේ මහා බෝධි සත්ත්වයෙක් ලෙස වැඩ වාසය කරද්දී උන්වහන්සේලා පස් මහ බැලුම්වලින් බලන ප්‍රධාන කාරණයක් වන්නේ කාලය යි. එය එතරම් ම වැදගත් කාරණයක්. එය ද කර්මානුරූපී ව සිද්ධ වන්නක්.

සිව් වැන්න ප්‍රයෝග සම්පත්තිය යි. එනම්, හොඳ ගතිගුණ පිහිටීම යි. දන් දෙන්න, සිල්වත් වෙන්න, භාවනා කරන්න , අසරණයන්ට පිහිට වන්නට , අන් අයගේ දුකට උණුවන සිතක් ඇති ව අසරණයන් වෙනුවෙන් පෙනී සිට පිහිට වන්නට සිතෙනවා. යහපත් ගතිගුණ, ගුණ ධර්ම පිහිටනවා. ඒ ප්‍රයෝග සම්පත්තිය කාරණය හේතු කරගෙනයි. කෙනෙකුට ගති සම්පත්තිය ලැබුණොත්, එනම් සුගතියේ උපත ලැබුවොත්, භව භෝග සම්පත්, එය උපධි සම්පත්තිය යි. ස්වභාවික විපත් නැති කාල එනම් කාල සම්පත්තිය, ලැබෙනවා. නමුත් දුෂ්ඨ ගතිගුණ පිහිටනවා. අසීලාචාර අමනෝඥ ගති ඇතිනම් මේ එකක්වත් වැදගත් වන්නේ නැහැ.



**කැලණියේ අජිත හිමි**

ඒ නිසා පින්වතුනි, භාග්‍යවතුන් වහන්සේ දේශනා කරන්නේ ගති සම්පත්, උපධි සම්පත්, කාල සම්පත් වගේම ප්‍රයෝග සම්පත් සතරම ලැබෙන්නේ ඉමහත් පුණ්‍ය බල මහිමය නිස යි. භාග්‍යවතුන් වහන්සේ වැඩ සිටි , ඇතැම් පළාවත්වල දුර්භික්ෂ හට ගත්තා. නියං හට ගත්තා. උන්වහන්සේ ඒවාට ඔරොත්තු දුන්නා. එහෙම නම්, බුදු කෙනෙක් පහළ වුණත් මේ කාරණා සතර අංග සම්පූර්ණ වන්නේ නැහැ. එය ලෝක ස්වභාවය යි.

ඊළඟ කාරණා සතර ගැන ධර්මයේ සඳහන් වන්නේ ගති විපත්, උපධි විපත්, කාල විපත් , ප්‍රයෝග විපත් යනුවෙනි. ගති විපත් යනු නරක, තිරිසන්, ප්‍රේත , අසුර ආදියෙන් සතර අපාගත වීම යි. ඒ දුර්භාග්‍ය සම්පන්න ගතිය, උප්පත්තිය ගති විපත්තිය වෙයි. දෙවන කාරණය වශයෙන් උපධි විපත්තිය යි. එනම්, සැප පහසුකම් නැති, සනීපයට ජීවත් වන්නට ඉඩ ලැබෙන්නේ නැති, උප්පත්තිය යි. එනම්, උපධි විපත්තියේ දී ඒකාන්ත වශයෙන් ම සතර අපාගත සත්ත්වයන් අතර ගත්විට, ඇතැම් සත්ත්වයන් තිරිසන් සත්ත්වයන් වනවා. එනම් ගති සම්පත්තිය නැති ගති විපත්තිය යි. උදාහරණයක් ලෙස ගත් විට ඇතැම් සුනඛයන් ජීවිතයෙන් සමුගත් පසුව පාංශකූල පින්කම් පවා සිදු කරනවා. එය ගැළපෙන නොගැළපෙන දේ මෙතනදී සඳහන් කරන්නේ නැහැ. නමුත් ඒ සතාගේ හිමිකරු එවැනි පින්කමක් කරන්නේ ඒ සතා තුළ ඇති යම්කිසි පුණ්‍ය බල මහිමයක් නිස යි. උප්පත්තියෙන් තිරිසන් වුවත්, සැප බහුල දිවියක් ගෙවන්න ඒ සත්ත්වයාට එම අවස්ථාව ලැබුණේ උපධි සම්පත්තිය නිස යි. එහෙමනම්, එය මිනිසුන්ට, දෙවියන්ට, බ්‍රහ්මයන්ට පමණක් බලපාන දෙයක් නොවෙයි. ඇතැම් තිරිසන් සත්ත්වයන්ටත්, උපධි සම්පත්තිය බලපාන අවස්ථා තිබෙනවා. ඇතැම් විට පීඩිත පන්තියේ මිනිසුන්ට එවැනි ආදර බර ගෞරවයක්, සැලකිල්ලක් ලැබෙන්නේ නැහැ. ඒ නිසා උපධි විපත්තිය යනු සැප සනීපෙට ජීවත් වන්නට ඉඩ අවස්ථාව නොලැබීම යි.

ලෙඩ රෝග බහුලව, මානසික දුක් පීඩා ඇති ආනුභාව සම්පන්න නැති රූප සම්පත්තිය, කටහඬ සම්පත්තිය නැති ස්වභාවය මෙතැනදී උපධි විපත්තිය වෙයි.

වර්තමාන පසුබිම ගත්විට, ගෝලීය වශයෙන් කාල විපත්ති සමයක්. කොවිඩ් – 19 වසංගතය හේතුවෙන් ලෝකයේ ස්වාධීන කලාප ඇතුළුව රටවල් රැසක් මේ වසංගතයට ගොදුරු වෙලා. මේ නිසා ලක්ෂ ගණන් පිරිස ජීවිත වලින් සමු අරගෙන. මිලියන දහයකට අධික පිරිසක් රෝගයට ගොදුරු වෙලා තිබෙනවා. අසල්වාසී ඉන්දියාවෙන් පවා දස ලක්ෂයකට ආසන්න රෝගීන් පිරිසක් වාර්තා කරනවා. ඒ නිසා කාල විපත්ති ඇති කාලයක වසංගත පැතිර යනවා. ගංවතුරු , නාය යාම්, ලැව් ගිනි, සුනාමි තත්ත්වයන්, යුධ කලකෝලාහල, සොර සතුරු විපත් ආදිය ඇති වන්නේ කාලවිපත්ති සමය තුළ යි.

සිව්වැන්න ප්‍රයෝග විප්තිය යි. පින් දහම් කිරීම, සංවරකම, දමනය වීම, ධර්මයට අනුගත ජීවිතයක් ගෙවීම, මෙත් සිතින් වාසය, කාරුණික බව, ඊර්ෂ්‍යා ඇත්තෙක් නොවිය යුතු යි. ද්වේශය, පළිගැනීම, වෛරය, අන් අය දුකට පත් කිරීම,අනුන්ගේ දියුණුවට ඊර්ෂ්‍යා කිරීම, හටගැනීම සිතකට මෙවැනි විපත්තියක් වී නරක , ගතිගුණ පිහිටීම හඳුන්වන්නේ ධර්මයේ ප්‍රයෝග විපත්ති වශයෙනි.

16 වන පිටුවට

# සුසිරිත සැප පිණිස ය



**හොඳ නරක යන මානව චර්යාවන් හැඳින්වීම පිණිස බුද්ධ දේශනාව විවිධ ව්‍යවහාරයන් භාවිත කරයි. කුසල, අකුසල යන යෙදුම් එහි දී ප්‍රමුඛ වේ.**


ඒ හැර පුඤ්ඤ – පාප, සාර – අසාර, සාධු – අසාධු, සාවජ්ජ – අනවජ්ජ, ධම්ම – අධම්ම, කරණීය – අකරණීය, සුකට – දුක්කට, තණ්හ – සුක්ක යනාදී යෙදුම් ද ඒ සඳහා යෙදී තිබේ. එලෙස හොඳ ක්‍රියාව මෙන් ම නරක ක්‍රියාව ද තීරණය කිරීමට මිනිසාට හැකියාව ඇති බව බුදු දහම පිළිගනියි.

එහිදී එයට අදාළ වන කරුණු සලකා බැලිය යුතු ය. ඒ සඳහා මිනිසාට නිදහස තිබේ. සර්ව බලධාරී ඊශ්වරයෙකුට අනුව හෝ ආත්මවාදී ව හෝ හුදෙක් තර්කයට ම වහල් වී හෝ, සමාජගත සාම්ප්‍රදායික මතවාදවලට යටත් ව හෝ හොඳ, නරක නිශ්චය කළ යුතු නැත. නරක ක්‍රියාවක් හැර පියා හොඳ ක්‍රියාවක් ප්‍රගුණ කිරීමේ හැකියාව අතින් මිනිසා ලොව අන් සියලු සත්ත්වයන්ට වඩා ඉදිරියෙන් සිටින බව පිළිගන්නා බුදුදහම සිතා මතා කරන හොඳ ප්‍රතිඵල සහිත වූ චර්යාවන් ඇරඹීමට ද (ආරම්භ ධාතු) පවත්වාගෙන යාමට ද (නික්ඛම ධාතු) එහිදී බාධක මැඩළමින් ඉදිරියට යාමට ද (පරක්කම ධාතු) පුද්ගලයාට අනුශාසනා කරයි.

එබැවින් ඒ සඳහා අරඹව් (ආරභථ) නික්මෙව් (නික්ඛමථ) යෙදෙව් (යුඤ්ජථ) යැයි මිනිසා ධෛර්යමත් කරයි. මෙසේ ස්ව ඡන්දය එනම් තම තමා සතු හැකියාව කැමැත්ත (ස්වච්ඡන්දතාව) අගය කරන දහමක් ලෙස බුදු සමය ප්‍රකට ය. කුසලා කුසල කර්ම පිළිබඳ කරුණු පැහැදිලි කිරීමේ දී බුදු සමය නිබඳ ව ම එකී ක්‍රියාවන්ට පාදකවන චේතනාව පිළිබඳ අවධානය යොමු කරයි. ඒ අනුව හොඳ ක්‍රියාවට, කුසලයට මුල් වන්නේ අලෝභය යි. ලෝභයෙන් ගිජුකමින් තොර බවයි. අද්වේශය යි. ද්වේශයෙන් පටිඝයෙන් තොර බවයි. අමෝහය යි. මුලාවෙන් මුවහ වීමෙන් තොර බවයි. යම් ක්‍රියාවකට එම චේතනාවන් පාදක වී තිබේ ද, එය අකුසල ය. මෙමඅර්ථයෙන් “මහණෙනි,මම චේතනාව ම කර්මය යැයි කියමි. කයින්, වචනයෙන් හා සිතින් සිතා මතා ක්‍රියාවෝ කරනු ලැබෙත්’ යැයි වදාරන ලදී.

චේතනා පූර්වංගම ක්‍රියාවෝ කම්ම යන්නෙන් සැලකෙන්නෝ ය. ලෝභ, ද්වේශ, මෝහා දී චේතනාවන් අකුසල මූල ලෙස හා අලෝභ, අද්වේශ, අමෝහ යන චේතනාවන් කුසල මූල ලෙස ද දක්වන බුදු සමය ඒ පිළිබඳව අවදිකමින් යුක්තවීම සම්මා දිට්ඨිය, නිරවද්‍ය වූ දැක්ම ලෙස හඳුන්වයි. එසේ ම කුසලාකුසල කර්ම තමන් විසින් ඇති හැටියෙන් දැන දැක ගත යුතු යැයි ද උගන්වයි. සිත විසින් ලොව ම හසුරුවනු ලැබේ. සියලු ධර්මයෝ සිතෙහි ආධිපත්‍යයට යටත් වෙති. මහණෙනි, වැඩි දියුණුවට පත් නො කිරීමෙන් මහත් වූ අනර්ථය සිදු කෙරෙන දේ අතුරින් ද සිතම ප්‍රධාන වේ. එතරම් ප්‍රධාන වූ වෙනත් එක ම ධර්මයක් මම නො දකිමි. සොරෙකු තවකෙකුට සිදුකරන අයහපතට වැඩි අයහපතක් නරකට යොමු වූ සිත විසින් සිදුකරන්නේ ය. මව, පියා හෝ වෙනත් ඥාතියෙකු කෙනෙකුට සිදු කරන යහපතට වැඩි යහපතක් හොඳට යොමු වූ සිත විසින් සිදු කරන්නේ ය.

සියල්ලට මනස ම ප්‍රධාන වේ. පූර්වංගම වේ. ඉඳින් පවිටු වූ මනස මුල්කොට ගත් කියුම්, කෙරුම් වේ ද එයින් දුක මැ උපදවන්නේ ය. දුක පසුපස එන්නේ ය. ගොනු අනුව ම එය රිය සක පරිද්දෙනි. ඉදින් ප්‍රසන්න වූ මනස මුල්කොට ගත් කියුම්, කෙරුම් වේ ද ඒවා සැපත ම උපදවන්නේ ය. දුක පසුපස එන්නේ ය. ගොනු අනුව ම එන රිය සක පරිද්දෙනි.ඉදින් ප්‍රසන්න වූ මනස මුල්කොට ගත් කියුම්, කෙරුම් වේ ද ඒවා සැපත ම උපදවන්නේ ය.කෙනෙකු පසුපස එන හෙවණැල්ල මෙනි. නොවේ නම් දුරාචාරයෝ වෙත්.



මහාචාර්ය
**දේවාලේගම මේධානන්ද හිමි**

මෙසේ කුසලා කුසල ධර්ම ඇගයුම් කිරීමේ දී අනුරූප පල

> කායික, වාචසික හා මානසික ක්‍රියාවල දී තමා ගැන, අනුන් ගැන මෙන් ම තමා, අනුන් යන උභය පක්ෂය ගැනම සලකා බැලිය යුතු ය. යම් ක්‍රියාවක් තමාට හානිකර වන්නේ ද, අනුන්ට හානිකර වන්නේ ද, දෙපක්ෂයට ම හානිකර වන්නේ ද එය අකුසලයකි. යම් ක්‍රියාවක් තමන්ට අනුන් හා තමන් යන උභය පක්ෂ යට ම හානිකර නො වන්නේ ද එය කුසලයකැයි සලකා ගත යුතු ය.

විපාක පිළිබඳ ව ද බුදු සමය ගැඹුරු අවධානය යොමු කරයි. යම් ක්‍රියාවක් අයහපත් ද, අවැඩදයක ද, දුක් උපදවයි ද, අහිත පිණිස මැ වේ. ද එය නරක ය. යම් ක්‍රියාවක් යහපත් වේ ද, වැඩදයක වේ ද, සැප උපදවයි ද, හිත පිණිස ම වේ ද එය හොඳ ය.

මෙම අර්ථයෙන් යම් ක්‍රියාවක ඵලවිපාක අරබයා විඩිමත් ප්‍රත්‍යවේක්ෂණයෙන් එය හොඳ හෝ නරක ලෙස විනිශ්චය කරනු පිණිස, බුදුසමය මඟපෙන්වන අවස්ථාවන් ද රාශියකි. ‘කාලාමයෙනි, ලෝභය අකුසල යැයි, ද්වේශය අකුසල යැයි, මෝහය අකුසල යැයි ඔබ විසින් ම (නිදහස් චින්තනය විමංසනය මගින්) දත යුත්තේ ය. එමතු ද නොව ලෝභය අහිත පිණිස, දුක් පිණිස වන්නේ ය. මෝහය අහිත, පිණිස දුක් පිණිස වන්නේ යැයි ඔබ විසින් ම නිදහස් වැ විමසුම්ශීලී ව දත යුතු ය. ‘මෙම බුද්ධ වචනය අවශ්‍යයෙන් ම කුසලාකුසල ධර්මයන්ගේ මානසික පදනම මෙන් ම පල විපාක ද සලකා බලා ඒවා ඇගයුම් කිරීමට මඟ පෙන්වයි. බුදුදහම වඩාත් ප්‍රකට ව ඇත්තේ හේතුඵල දහමක් ලෙස ය. හේතු ප්‍රත්‍ය ඇති කල, ඇතිවන්නා වූ සියල්ල හේතු ප්‍රත්‍ය නැති කල නැතිවන්නේ යැයි වටහා ගැන්මේ ආවශ්‍යකත්වය බුදුරජාණන් වහන්සේ නිබඳ ව ම පැහැදිලි කළහ.

“පව් කළ තැනැත්තේ මෙලොව ද තැවෙයි. පරලොව ද තැවෙයි. හෙතෙම මවිසින් පව් කරන ලද්දේ යැයි දුගතිගාමී වූයේ බෙහෙවින් මැ තැවෙයි.

පින් කළ තැනැත්තේ මෙලොව ද සතුටු වෙයි. පරලොව ද සතුටු වෙයි. මවිසින් පින් කරන ලද්දේ යැයි බෙහෙවින් ම සතුටු වෙයි. මෙම බුද්ධාවවදයන් ප්‍රජාව නරකින් මුදවා හොඳ වෙත යොමු කරලීම පිණිස මැ වදාරණ ලද්දේ ය.

මේ අනුව පව් කරන්නා විසින් නැවත නැවත පව් නො කළ යුතු ය. එය දුක් උපදවයි. පින් කරන්නා නැවත නැවතත් එය කළ යුතු ය. එයින් සැප උපදවන්නේ යැයි පෙන්වා දෙන ලදී.

බෞද්ධ මූලාශ්‍රය අනුව කායික, වාචසික හා මානසික ක්‍රියාවල දී තමා ගැන, අනුන් ගැන මෙන් ම තමා, අනුන් යන උභය පක්ෂය ගැනම සලකා බැලිය යුතු ය. යම් ක්‍රියාවක් තමාට හානිකර වන්නේ ද, අනුන්ට හානිකර වන්නේ ද, දෙපක්ෂයට ම හානිකර වන්නේ ද එය අකුසලයකි. යම් ක්‍රියාවක් තමන්ට අනුන් හා තමන් යන උභය පක්ෂයට ම හානිකර නො වන්නේ ද එය කුසලයකැයි සලකා ගත යුතු ය. බුදු සමයෙහි එන අත්තූපනායික ධර්ම පරියාය ද මෙකී උභයාර්ථ ම සලකා බැලීමේ උපදේශය ඉදිරිපත් කරයි. ඒ අනුව සියල්ලෝ, දඬුවමට තැති ගනිති.

මරණයට බිය වෙති. යම් සේ තමා දඬුවමට තැති ගන්නේ ද, බිය වන්නේ ද එලෙසින් ම, අනුන් ද එයට බිය වන්නේ යැයි සලකා, අනුන් වැනසීමෙන්, හිංසනයෙන් වැළකිය යුතු ය. සමාජයේ සෙස්සන් ඇසුරින් තමා පිළිබඳ ව අනුමාන කිරීමට මෙන් ම, තමන් ඇසුරින් අනුන් ගැන අනුමාන කිරීමට ද බුදුසමය මඟ පෙන්වයි. යම් පුද්ගලයෙක් පවිටු වූයේ ද, පාපී සිතුවිලිවලට වසඟ වූයේ ද, එම පුද්ගලයා මට අප්‍රිය ය. මම ද පාපී වූ කල්හි, පවිටු සිතුවිල්ලෙහි වසඟ වූ කල්හි අන් අයට අප්‍රිය අමනාප වන්නේ වෙමි. මම බොහෝ කල් ජීවත්වනු කැමති වෙමි. සුව විඳිනු කැමති වෙමි. දුක නො කැමති වෙමි. සෙස්සෝ ද බෝ කල් ජීවත් වනු කැමැත්තෝ ය. සුව විඳිනු කැමැත්තෝ ය. දුක නො කැමැත්තෝ ය. එබැවින් මවිසින් අනෙකෙකු දිවි තොර කෙරේ නම්, එය අනිකාට අප්‍රිය අමනාප වන්නේ යැයි සැලකිය යුතු ය.

ක්‍රියාවක හොඳ නරක නිශ්චය කිරීමෙහිලා කරුණු තුනක් සලකා බැලිය යුතු යැයි බුදුදහම උගන්වයි.

අත්තාධිපතෙය්‍ය – තමාගේ හෘද සාක්ෂිය

ලෝකාධිපතෙය්‍ය – ලෝක සම්මත

ධම්මාධිපතෙය්‍ය – ධර්මෝපදේශය

මේ කරුණු නො සලකන කල්හි තෙමේ තමාට ම උපවාද කෙරේ. හෘද සාක්ෂියෙන් ම දඬුවම් ලැබෙයි. නුවණැත්තන් අතර අපකීර්තියට ද පත්වෙයි. මුලාවීමෙන් මරණින් මතු දුගතිගාමී වෙයි. බුදු සමය අනුව මූලික වශයෙන් ම දුසිරිත දුක පිණිස හේතුවෙයි. දුක් උපදවයි. සුසිරිත සැප පිණිස හේතුවෙයි.

දුක වූ කලී දෙයාකාර ය. සංසාරික පැවැත්ම තුළ ආයුෂයෙන්, වර්ණයෙන්, සැපයෙන්, බලයෙන් හා නුවණින් පිරිහී පීඩාව උරුමවීම එක් පැත්තකි.

දුසිරිත ඊට තුඩුදෙයි. මෙලොව ද, පරලොව ද දුසිරිත හේතුවෙන් බොහෝ දුක් හට ගන්නේ ය. කර්ම විපාක පිළිබඳ බෞද්ධ ඉගැන්වීම මෙය මැනවින් පෙන්වා දෙයි. ජාති, ජරා, ව්‍යාධි, මරණාදී වශයෙන් සසර පැවැත්ම පිළිබඳ මූලික සත්‍යය දුක බව බුදුදහම පෙන්වා දෙයි.

# ශ්‍රද්ධාවේ පැවැත්මට ප්‍රත්‍ය වන ආහාරය සද්ධර්ම ශ්‍රවණයයි



**සමහර මිනිස්සු බුදුරජාණන් වහන්සේ ගේ කටහඬට , ශබ්දයට පැහැදිලා සිටියා. ඒ පැහැදීමෙන් ඇති වෙන්නෙත් ප්‍රසාද ශ්‍රද්ධාවක් විතරයි. ශබ්දය කෙරෙහි ඇලී ඇති වූ ප්‍රසාද ශ්‍රද්ධාව ඇති කෙනා මොන මොන ධර්ම කරුණු කිව්වත් ඒවා අහන්නේ නැහැ. සිහි කරන්නේ නැහැ. එවැනි අය ශබ්දයට , කටහඬට , පමණක් ඇලෙනවා. අදත් ස්වාමීන් වහන්සේලාගේ කට හඬට පැහැදීම් ඇති කර ගත්ත මිනිස්සු ඕන තරම් ඉන්නවා.**

ඒ නිසා තමයි කවි බණ, බෝධි පූජා, චෛත්‍ය පූජා , විවිධ මල් වර්ගවල නම් සඳහන් පූජා, විවිධ තෙල් වර්ගවල නම් සඳහන් පහන් පූජා සිදු කරන්නේ. දහස් ගණන් මිනිස්සු ඒවා පසු පස්සේ යන්නේ ඒ නිසයි. මේවා පින්කම් හැටියට හොඳයි. ඒත් මේවායින් ආර්ය මාර්ගයට කිසිදු අර්ථයක් නැහැ. හැමදාම පින්කම් කර කර සිටීමෙන් පමණක් ආර්ය මාර්ගයට ප්‍රවේශ වෙන්න නොහැකි බව මතක තබා ගන්න.

ගොඩක් මිනිස්සු භික්ෂූන් වහන්සේලා රුක්ෂ ප්‍රතිපදාවන් අනුගමනය කරනව නම් කැමැතියි. මිනිස්සු රුක්ෂ ප්‍රතිපදාවලට පහදින බව දන්න නිසයි දේවදත්ත හාමුදුරුවෝ බුදුරජාණන් වහන්සේගෙන් භික්ෂූන් වහන්සේලා උදෙසා පංච වරයක් ඉල්ලා සිටියේ.

භික්ෂූන් වහන්සේලා ජීවිතාන්තය දක්වා ආරණ්‍යවාසි විය යුතුයි.

භික්ෂූන් වහන්සේලා ජීවිතාන්තය දක්වා පිණ්ඩපාතික විය යුතුයි

භික්ෂූන් වහන්සේලා ජීවිතාන්තය දක්වා වෘක්ෂමූලික විය යුතුයි

භික්ෂූන් වහන්සේලා ජීවිතාන්තය දක්වා පාංශුකූල සිවුරු දැරිය යුතුයි

භික්ෂූන් වහන්සේලා ජීවිතාන්තය දක්වා මස්මාංශ පරිභෝජනයෙන් වැළකිය යුතුයි.

රුක්ෂ ප්‍රතිපද කියන්නේ මහා අමාරුවෙන්, වෙහෙසක් දරා ආරක්ෂා කළ යුතු දේවල්. අනුගමනය කළ යුතු දේවල්. මේ පංච වරය බැලූ බැල්මට ම පේනවා අනුගමනය කරන්න අමාරු බව. ඒ නිසා බුදුරජාණන් වහන්සේ මේවා පිළිගත්තේ නැහැ. ඒත් දේවදත්ත හාමුදුරුවෝ මේ රුක්ෂ ප්‍රතිපත්ති අනුගමනය කරන්න පටන් ගත්තා. ඒක දැකපු මිනිස්සු දේවදත්ත හාමුදුරුවෝ ගැන පැහැදිලා උන්වහන්සේ ගේ අනුගාමිකයෝ වුණා. මිනිස්සු විතරක් නෙවෙයි. භික්ෂූන් වහන්සේලාත් පන්සිය නමක් විතර බුදුරජාණන් වහන්සේගෙන් වෙන්වෙලා මේ අලුත් රුක්ෂ ප්‍රතිපද පුරන්න එකතු වුණා.

බුද්ධ කාලයේ විතරක් නෙවෙයි. අද වුණත් භික්ෂූන් වහන්සේලා අවම පහසුකම් යටතේ අමාරුවෙන් අපහසුවෙන් ජීවත් වෙනව නම් ගොඩක් මිනිස්සු පහදිනවා. ඒ නිසා තේ ගොඩක් අය ආරණ්‍ය සේනාසන වගේ තැන් සොය සොයා යන්නේ.

ගොඩක් මිනිස්සු භික්ෂූන් වහන්සේලා රුක්ෂ ප්‍රතිපදාවන් අනුගමනය කරනව නම් කැමැතියි. මිනිස්සු රුක්ෂ ප්‍රතිපදාවලට පහදින බව දන්න නිසයි දේවදත්ත හාමුදුරුවෝ බුදුරජාණන් වහන්සේගෙන් භික්ෂූන් වහන්සේලා උදෙසා පංච වරයක් ඉල්ලා සිටියේ.

මේ ළඟදී එක්තරා මහත්මයෙක් කියනවා" හාමුදුරුවනේ, මම වැඩිපුරම දන් දෙන්නේ, සිල් ගන්න ගියේ ආරණ්‍ය සේනාසනයට. (ප්‍රසිද්ධ ආරණ්‍යයක නමක් කිව්වා) පන්සල්වලට ගියේම නැහැ. දැන් නම් මම ආරණ්‍ය සේනාසනවලටත් යන්නේ නැහැ" කියලා. ඉතින් මම ඇහුවා මොකද? ඒ කියලා. මේ මහත්තයා කියනවා "හාමුදුරුවනේ සේනාසන දැන් පන්සල්වලටත් වඩා දියුණුයි. සැප පහසුකම් වැඩියි. උන්වහන්සේලාට කිසිම අපහසුවක් නැහැ" කියලා.


දැන් බලන්න මේ මහත්තයා මෙච්චර කල් ආරණ්‍ය සේනාසනවලට කැමැති වෙලා තියෙන්නේ අඩු පහසුකම්. අමාරුකම් නිසා. ඒ මහත්මයා ආරණ්‍ය සේනාසනවල වැඩ ඉන්න භික්ෂූන් වහන්සේලා ගේ සීලවන්තකමට, ගුණවන්තකමට නෙවෙයි පැහැදිලා සිටියේ. රුක්ෂ ප්‍රතිපදාවටයි. රුක්ෂ ප්‍රතිපදා කෙරෙහි පැහැදීමෙන් ඇති වෙන්නේ පසාද ශ්‍රද්ධාවක් විතරයි.

සමහර මිනිස්සු ධර්මයට වුණත් අලුත් අලුත් අර්ථ කථන දෙමින්, අලුත් අලුත් විදියට කියනව නම් කැමැතියි. ඒ අලුත් ධර්මයට. අලුත් ක්‍රමවලට පහදිනවා. බුදුරජාණන් වහන්සේ ගේ කාලයේත් සාති, මාලුංක්‍යපුත්ත. සුනක්ඛත්ත, අරිට්ඨ ආදි භික්ෂූන් වහන්සේලා ධර්මාර්ථ විකෘති කරමින් මිනිස්සුන්ට ධර්මය දේශනා කළා. බුදුරජාණන් වහන්සේ ඔවුන් ගෙන්වල සත්‍ය පහද දුන්නත් පිළිගත්තේ නැහැ.

ඔවුන්ට එහෙම පිළිගන්න බැරි වුණේ ඔවුන් පසුපසින් සිටින විශාල අනුගාමිකයෝ පිරිසක් මේ විකෘතිය පිළිගත්ත නිසයි.

බුද්ධ කාලයේ විතරක් නෙවෙයි අද වුණත් අවුරුදු දහස් ගණනක් ආව අපේ ථේරවාදීය සම්ප්‍රදාය විකෘති කරමින් ධර්ම දේශනා කරන ගිහි පැවිදි අය කොච්චර ඉන්නවද? ඒ විකෘතිය පිළිගන්න කොච්චර අනුගාමිකයෝ ඉන්නව ද? ධර්ම විනයධර ස්වාමීන් වහන්සේලා මේ විකෘතියේ ප්‍රකෘතිය පැහැදිලි කරල දුන්නත් ඒ අය පිළිගන්නේ නැහැ. මොකද ඒ විකෘති ධර්මය කෙරෙහි පසාද ශ්‍රද්ධාව ඇති කරගෙන තියෙන නිසා.

මේ සතර ආකාරයෙන් ඇති වන පසාද ශ්‍රද්ධාව ස්ථිර නැහැ. එය කොයි මොහොතේ වෙනස් වෙයි ද කියලා කියන්නත් බැහැ. හරියට තරාදියේ කොණ වගෙයි. තරාදි කොණ මඳක් එහා මෙහා වුණොත් උස් පහත් වෙනවා. ඒ වගේමයි පසාද ශ්‍රද්ධාව නිසා ඇති වී තියෙන පැහැදීම සුළු මොහොතකින් එහා මෙහා වෙනවා. එවිට ප්‍රසාදය ඇති වෙන්නත් පුළුවන්. නැත්නම් අප්‍රසාදය ඇති වෙන්නත් පුළුවන්. ඒ කොහොම වෙතත් ආර්ය මාර්ගයේ දී පසාද ශ්‍රද්ධාවට කිසිදු තැනක් හිමි නොවන බව මතක තියා ගන්න.



බලපිටිය ශ්‍රී ලංකා ප්‍රාචීන භික්ෂු විද්‍යාලයේ
මහෝපාධ්‍යාය රාජකීය පණ්ඩිත,
දර්ශනපති
**බලපිටියේ සිරිසීවලි හිමි**

සත්වයන්ගේ පැවැත්මට ආහාරය ප්‍රත්‍ය වෙනවා වගේම ඒ ඒ ධර්මයන්ගේ පැවැත්මටත් හේතු වන ප්‍රත්‍ය තියෙනවා. ශ්‍රද්ධාවේ පැවැත්මට ප්‍රත්‍ය වන්නේ සද්ධර්ම ශ්‍රවණය නැමැති ආහාරයයි. 'කොචාහාරො සද්ධාය සද්ධම්ම සවනන්තිස්ස වචනීයං" කිව්වේ එයයි. දැන් ඔබට පැහැදිලියි. ශ්‍රද්ධාව වඩන්න නම් නිතර ධර්මය අහන්න පුරුදු විය යුතු බව. ඊළඟට සත්පුරුෂයන් ඇසුරු කිරීම, සද්ධර්ම ශ්‍රවණය, යෝනිසෝමනසිකාරය හා ධර්මානුධර්ම ප්‍රතිපත්ති කියන සෝවාන් අංග හතර වඩන්න. මේවා ශ්‍රද්ධාවේ මූලයෝයි. "අපි ච සප්පුරිස සෙවනං සද්ධම්මසවනං යොනිසොමනසිකාරොධම්මානුධම්ම පටිපත්තීති චත්තාරි සොතාපත්ති අංගානි සද්ධාය මූලං නාම" කියල පාලියෙන් දැක්වූයේ එයයි.

සිල්වතුන් දැකීමට ඇති කැමැත්ත, බණ ඇසීමට ඇති කැමැත්ත හා දන් දීමට ඇති කැමැත්ත යන කරුණු තුන ශ්‍රද්ධාවට නියමිතයි. මේ නිමිති තුනත් පුළුවන් තරම් පුරුදු පුහුණු කරන්න. එවිට ඔබ තුළ ශ්‍රද්ධාව ඉන්ද්‍රිය ධර්මයක් ලෙස පිහිටාවි.

# තණ්හාව නිසා සියල්ල නැති කරගත් බැමිණිය

## ස්වර්ණහංස ජාතක කතාව

**තුන්ලෝකාග්‍ර වූ අප අමාමෑණී තථාගතයන් වහන්සේ දෙව්රම් වෙහෙර වැඩ වසන සමයේ එක්තරා උපාසකයෙක් වත්තක ලූණු වගා කළා. එතුමා බොහෝම ශ්‍රද්ධා සම්පන්න කෙනෙක්.**

ඒ නිසා බොහෝ භික්ෂූන් වහන්සේලාටත් ලූණු කඩා පූජා කළා. අවශ්‍ය අවශ්‍ය පරිදි ප්‍රමාණයත් නියම කොට උන්වහන්සේලාට ම කඩාගෙන යාමටත් අවස්ථාව ලබා දුන්නා. භික්ෂූණී වහන්සේ පමණක් නොව භික්ෂූණීන් වහන්සේලාටද ලූණු අවශ්‍ය ප්‍රමාණයත් කඩා දුන්නා. විටෙක උන් වහන්සේලාටම කඩා ගෙන යාමටත් ඉඩ දුන්නා.



අනුරාධපුර කුට්ටම්පොකුණ විහාරාධිකාරී
ශාස්ත්‍රපති රාජකීය පණ්ඩිත
**කිවුලතලාවේ සමිත හිමි**

මේ ආකාරයට කාලය ඉක්ම යද්දි දිනක් උත්සවයක් සඳහා බොහෝ දෙනා උපාසකයාගේ ගෙට පැමිණ ලූණු කඩාගෙන ගියා. එදා ම නන්දා නම් භික්ෂූණීන් වහන්සේ නමක් උපාසකයාගේ ගෙදරට පැමිණියේ ලූණු රැගෙන යාමටයි. "උපාසකයෙනි, මටත් ලූණු දෙන්න." යැයි ලූණු ඉල්නවා. නමුත් ඒ වෙලාවේ උපාසකයා පැමිණි අනෙක් අයට ලූණු ලබා දෙන අවස්ථාව වූ නිසා මෙහෙණියට ම කඩා ගන්න යැයි කිවුවා. "පින්වත් මෙහෙණින් වහන්ස, මම මේ වෙලාවේ අන් අයට ලූණු බෙදමින් සිටින්නේ. ඒ නිසා ඔබ වහන්සේ වත්තට ගොස් ලූණු තුනක් කඩා ගන්න."

යැයි කිවුවා. මෙහෙණින් වහ්නසේ තමන් වහන්සේ සමඟ පැමිණි අනික් මෙහෙණියත් කැටිව වත්තට ගොස් උපාසකයා නියම කළ ප්‍රමාණයටත් වඩා ලූණු කඩාගෙන ගියා. එය දුටු උයන්පල්ලා "මම සිටිත්දිත් අකටයුතුකම් සිදු වන එක නොවටිනා දෙයක්" යැයි සිතුවා. ඔහු කෑ ගහලා එම අකටයුත්ත ගැන උපාසකයාට කිවුවා. උපාසකයාගේ සිත කලකිරීමට පත් වුණා. ඒ ඇසූ බොහෝ භික්ෂූණීන් වහන්සේලාත් එම මෙහෙණියට දෙස් නැගුවා. භික්ෂූණී වහන්සේලාත් එම පුවත අසා කනගාටු වුණා පමණක් නොව "භික්ෂූණී වහන්සේලා නම් දුන් දෙයක් හැර නුදුන් දෙයක් කිසි විටක නොගත යුතු බව කියමින් දෙස් නැගුවා. බුදුරජාණන් වහන්සේ, "එසේ දැඩි තෘෂ්ණාවෙන් යුක්තව තමන්ට අයිති නොවන දේවල් ගැනීමෙන් සහ තමන්ට ලැබෙනවට වඩා නැතිනම් තමන්ට අවශ්‍ය ප්‍රමාණයට වඩා ලෝභ සිතින් උදුරා ගැනීමෙන් ද තමාට හිමිව තිබූ

වස්තුවත් විනාශ වී යනවා. ලැබෙන්න තිබෙන වස්තුවත් නැති වී යනවා. එනිසා ලැබුනු දෙයෙහි සතුට උපදවා ගතහැකි නම් බොහෝ දේ ඉදිරියට ලැබෙයි. එසේම දැනට ලැබී තිබෙන අත ඉතුරු වස්තුවත් ආරක්ෂා වෙනවා. නිතරම තමන් ලද දෙයින් සතුටු වන්න පුරුදු වන්න." යැයි

කියමින් භික්ෂූණීන් වහන්සේට අවවාද කොට "මහණෙනි, නන්දා මෙහෙණින් වහන්සේ පෙරත් බෝහෝ තෘෂ්ණා ඇත්තියෙකි." යැයි වදාරා ආරාධිත වූ තථාගතයන් වහන්සේ ඒ අතීත කතාව දේශනා කළා.

පෙර දඹදිව බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරු කෙනෙකුන් රාජ්‍යය කරන සමයේ අප මහා බෝධි සත්ත්වයෝ බමුණු කුලයක ඉපිද නන්දාය, නන්වතීය, සුන්දරීනන්දනී යයි දූවරු තුන් දෙනෙක් ලබා දැහැමෙන් සෙමෙන් බිරිඳ සමගින් ජීවත් වුණා.

දූවරුන් තුන් දෙනා අන්‍ය කුලයන් සඳහා විවාහ කරදීමටත් මත්තෙන් බෝධිසත්වයන් වහන්සේ හදිසියේ මිය ගියා. මරණින් මතු ස්වර්ණ හංසයෙකු ව ඉපදුණා. එම හංසයාට ජාතිස්මරණ ඥනය පහළ වුණා. අනතුරුව එම හංසයා තමන් හංසයෙකු ව ඉපදීමට පෙර භවය පිළිබඳව සිහිපත් කරන්නේ බමුණු කුලයක ඉපිද දූවරුන් තුන් දෙනා සමගින් ජීවත්ව සිටි අයුරු දැක්කා.

එහෙත් දැන් එම දරුවන් ඇතුළු තම බිරිඳ අනුන්ට බැලමෙහෙකම් කොට ජීවත් වන බව දැක ශෝකී වෙලා සිතන්නේ "රත්තරන්වලි න් මගේ පියාපත් සෑදී ඇති නිසා ඒවා ඔප දමා ආභරණ සැකසීමට සුදුසු ලෙස පවතිනවා. එබැවින් දෙමසකට වරක් දූන් තුන්දෙනාත් බැමිණියත් ජීවත් කරවීම සඳහා රන් පියාපතක් බැගින් ලබා දෙනවා." යි සිතා දවසක් තමන්ගේ ගෙදරට පැමිණියා.

පැමිණ පළයක් මත වසා සිටියා. දූන් තුන් දෙනා හංසයාව දැකලා අහනවා 'ඔබ කවුරුන් ද?' කියලා "දරුවෙනි මා පෙර භවයේ ඔබලාට පියා වූ බ්‍රාහ්මණයායි. මා මෙහි ආවේ ඔබලාටත් ඔබගේ

මෑණියන්ටත් සංග්‍රහ පිණිස යි. මේ මාගේ රන් පියාපත ගෙන විකුණා සැප සේ ජීවත් වන්න." යැයි කියමින් රන් පියාපතක් හෙළා නැවතත් හිමාලයට ඉගිළ ගියා. මේ අයුරින් දෙමසකට වරක් රන් පතක් ලැබුණා. ඔවුන් එය විකුණා සතුටින් ජීවත් වුණා.

ටික කලෙකට පසුව දිනක් බැමිණිය සිතන්නේ, "තිරිසන් සතා නම් එක් හිතක් නැති කෙනෙකි. අනාගතයේ සිත වෙනස් වී රන් පත් දීම නතර කළොත් වන්නේ මහත් නපුරක්. ජීවත් වීමට වෙන මගක් ඇත්තෙත් නැහැ. ඒ නිසා හංසයාගේ පියාපත් සියල්ල ලබා ගැනීම යහපත්" යනුවෙන් අදහසක් පහළ කරගෙන දූන් කැඳවා මෙහෙම කිවුවා. "ඔබලාගේ පියාණන් අප නැවත රක්ෂා කරනවා. නමුත් තිරිසන් ආත්මයක නිසා සිත් වෙනස් වෙන්න පුළුවන්. දිනක මෙහි නොඑන්නට සිතුවොත් අපි මොක ද කරන්නේ.

එ නිසා මාගේ ප්‍රිය දූවරුනි, අපි හංසයා මෙවර පැමිණි කල පියාපත් සියල්ල උදුරා ගනිමු." "මෑණියනි අපගේ පියාණන්ගේ ශරීරයට එය මහත් වේදනාවක් වේවි. එබැවින් අපි කිසිවිටෙක එසේ නොකරමු."


බැමිණිය කෙසේ කීවත් දරුවන් එම නොමනා කටයුත්තට කැමති කරවා ගත නොහැකි වුණා.

මේ අතර හංසයා නිවසට පැමිණියා. බැමිණිය උපන් දැඩි තෘෂ්ණාවෙන් පෙළෙන්නේ තම දූවරුන්ට නොහැකි නම් මම් ම විසින් පියාපත් උදුරා ගන්නවා යැයි සිතා. හංසයාට ආදරයෙන් කතා කළා. "මා පිය ස්වාමි පුත්‍රය, මා කරා පැමිණෙන්න." යැයි කීවා. බෝසතාණෝත් තම

පෙර බිරිඳ බැවින් ඇය සමීපයට ගියා. සැණින් හංසයා අල්ලා ගත් බැමිණිය වහා වහා රන් පියාපත් ගලවා ගත්තා. බෝධි සත්වයෝ ද එය මහත් වේදනාවෙන් නමුත් ඉවසා සිටියා. එහෙත් ගැලවූ රන් පියාපත් කාළවර්ණ වුණා. බෝධි සත්වයෝ යා නොහැකිව වේදනාවෙන් ගෙහිම සිටියා.

පසුව දෙවෙනිව ආ පියාපත් සුදු පාට බැවින් හංසයා අත හැරියා. බෝධි සත්වයෝ නැවත එම නිවසට නොඑන සිතින් නික්ම හිමාලයට ම ගියා. "මහණෙනි තණ්හාව නම් අත ඇති ධනයත් ලැබෙන්නට ඇති ධනයත් විනාශ කරනවා නොවේ ද? ලද දෙයින් සතුටුව දැහැමෙන් සෙමෙන් ජීවත්වීම මොන තරම් වටිනවා ද?" යනුවෙන් අනුශාසනා කළා.

"එසමයෙහි තණ්හා අධික වූ බැමිණිය නම් මෙකල නන්දා භික්ෂූණීන් වහන්සේයි. දරුවන් තුන් දෙනා මෙසමයෙහිත් දූවරුවන් තිදෙනාමයි. එකල ස්වර්ණ හංසව උපන්නේ ලොව්තුරා බුදු වූ මම් ම නොවේදැයි" වදාරා ස්වර්ණහංස ජාතක කතාව නිමවා වදාළා.



දුටුගැමුණු රජතුමා -03

# රට බේරා ගැනීමට දේවි කුමරිය මුහුදට බිලි වෙයි



**බමුණු ආචාර්යවරු ඔවුන්ගේ අදහස් ඉදිරිපත් කිරීමට කිහිපවරක් උත්සාහ කළ ද එය අසාර්ථක විය. ඔවුන් ගේ මුවට වචන නොනැඟිණි. කතාකරගත නොහැකි විය. “ඔබේ තීරණය වන්නේ මා කළ වරදට මගේ ජීවිතය පුද කළ යුතු බව නම් මා ඊට කැමැත්තෙමි. ඒ සඳහා මට අවස්ථාව ලබා දෙන්න.” රජතුමා පැවසී ය.**

නමුත් පුරෝහිතවරුන් ගේ නිමිති පාඨ අනුව තීරණය වූවේ නිර්දෝෂී රහත් තෙර නමක් උණු තෙල් කටාරමක බහා වධ දී ඝාතනය කොට මුහුදට දැමීම නිසා මුහුදු දේවතාවුන් කෝපයට පත්ව රජුත්, රටත් විනාශ කිරීමට ස්වභාව ධර්මය විසින් ලබාදුන් අණ කිරීමක් බවයි. තව ද මේ විපතින් රට බේරා ගැනීමට නම් කන්‍යා කුමරියක් මුහුදට බිලි කළ යුතු බවත් පැවසී ය.

රජු ඊට එකඟ වුවත් එවැනි කන්‍යා කුමරියක් මේ මොහොතේ සොයා ගන්නේ කෙසේද? යන්න ඊළඟ ගැටලුව විය. රාජ සභාවේ සිටි පිරිස විවිධ යෝජනා ඉදිරිපත් කළහ. ඒ මොහොතේ ඉදිරියට පැමිණි රජතුමාගේ දියණිය වන “දේවී” කුමරිය “ඔබතුමා අතින් සිදු වූ වරදට මුහුදට බිලි විය යුත්තේ අන් කිසිදු තරුණියක නොව ඔබගේ දියණිය වන මේ දේවි කුමරියයි. තවදුරටත් මුහුද ගොඩ ගලමින් ගම් බිම් යට කරන්නට ඉඩ නොතබා මේ විපතින් රට බේරා ගැනීමට මා හට අවස්ථාව ලබා දෙන්නැ’යි ආයාචනය කරමින් පිය රජු දෙපා මුල වැඳ වැටුණා ය.

“දේවි” කුමරියගේ අප්‍රතිහත ධෛර්යය සහ නිර්භීත භාවය පිළිබඳ සියල්ලෝ ම පුදුමයට පත්වූහ. ඇමැතිවරු සහ ආරක්ෂක නිලධාරින් ඇමතූ කුමරිය මාලිගාවේ ආරක්ෂක ඔරුව සූදානම් කරන ලෙසත්, එය මුහුදු වෙරළ වෙත ගෙනගොස් තමාට එහි යාමට සූදානම් කරන ලෙසත් දැන්වී ය.

දියණියගේ වදන් ඇසූ රජතුමා බොහෝ සේ කම්පාවට පත්විය. තමාගේ ප්‍රාණ සමාන දියණිය මුහුදට බිලි දෙන්නේ කෙසේදැයි දස අතේ කල්පනා කළේ ය. පිය රජතුමා ගේ ශෝකී වත දුටු දේවී කුමරිය ශෝක නොවන ලෙස ඇයැද සිටියා ය. තමා බිල්ලක් වී රටත්, ජනතාවත්, පියාණනුත් බේරා ගැනීම සඳහා මේ යන ගමනට ආශිර්වාද කරන ලෙස ද ඉල්ලා සිටියා ය. කුමරියගේ මේ ඉල්ලීමත් සමඟ ම මුළු රාජ සභාවම තුෂ්ණිම්භූත ව කුමරිය දෙස බලා සිටියහ.

රට බේරා දෙන ලෙසට දෙවියන් යදිමින් සිටි පූජකවරු මුහුදු දේවතාවුන් ගේ ඉල්ලීම ඉටු කිරීමට වෙරළට පැමිණෙන දේවී කුමරියට ආශිර්වාද කරන ලෙස ජනතාවගෙන් ඉල්ලා සිටියහ. රජතුමා ද ආරක්ෂක සෙනෙවිවරු සමඟ මුහුදු වෙරළට යන විට එහි එකම හිස් ගොඩකි. එහි ඉතා සුන්දර ලෙස සරසන ලද ඔරුවක බඳෙහි “කැලණිතිස්ස රජතුමාගේ දියණියයි” යනුවෙන් ලියා තිබිණි. එහි සුව පහසු යහනක් තනවා කුමරියගේ ආහාරපාන, ඇඳුම් පැළඳුම් තැන්පත් කොට තිබිණි. මුහුදු වෙරළට පැමිණි කුමරිය පිය රජතුමා වෙත ගොස් දෙපා අල්ලා වැඳ ආශිර්වාද ලබා ගත්තා ය. සියලු දෙනාට ම දෑත් ඔසවා ආචාර කළ කුමරිය ඔරුවට නැගුණා ය. ආරක්ෂක සෙබලු විසින් ඔරුව මුදා හරින ලදී.

දේවි කුමරිය මුහුදේ පාකර හැරිය පසු මුහුදු ඝෝෂාව, සැඩ සුළඟ, කුණාටුව නතර විය. වැස්ස තුරල් විය. මහජනතාව සාධු කාර දෙමින් සතුට පළ කළහ. රජතුමා පුදුමයට පත්විය.

දේවී කුමරිය රැගත් ඔරුව කෙමෙන් රළවැල් අතරට මැදිවී පාවී ගියේ ය. ඔරුවෙහි සුව පහසු යහනෙහි සිට අවට නැරැඹූ ඇයට දසතින් මුහුද මිස අන් කිසි දෙයක් දක්නට නොලැබිණි.

එහෙත් ඇයට බියක් නොදැනිණි. පාළුව තනිකම නොදැනිණි. ඔරුව සත්සුන් ගමනක යෙදේ. බොහෝ වෙහෙසට පත් ව සිටි කුමරිය නින්දට වැටුණා ය.

ඔරුව කෙමෙන් පාවී අවුත් ලක්දිව දකුණු ප්‍රදේශයේ කිරින්ද වෙරළට ගොඩ ගැසී ය. පසුද ඇය අවදිවූයේ මිනිස් කටහඬ කිහිපයක් ඇසීමෙනි. මොහොතක් කල්පනා කළ ඇය තමා දැන් සිටින්නේ මුහුදු වෙරළක බව තේරුම් ගත්තා ය. වෙරළට පැමිණෙමින් තිබූ ඔරු දුටු ඇය තමා දැන් සිටින්නේ ධීවර ගම්මානයක බව අවබෝධ කරගත්තා ය. පසුගිය රැය පුරා තමා රැගත් ඔරුව බොහෝ දුරකට පාවී ඇති බව ද තීරණය කළා ය.

මෙම යාත්‍රාවත්, එහි පාවී ආ කුමරියත් දුටු ප්‍රදේශවාසීහු ඒ බව තම ධීවර ප්‍රධානියාට දැනුම් දුන්නෝ ය. ඔහු රජතුමා හමුවට පැමිණ “දෙවඟනක් බඳු රූමත් කුමාරිකාවක් කිරින්දේ වෙරළට පැමිණ සිටින බව“ පැවසී ය. මේ ආරංචිය ඇසූ රජතුමා බොහෝ සතුටට පත්විය. පැමිණි පිරිසට තුටු පඩුරු වශයෙන් රන් කහවණු ප්‍රදානය කෙරිණි. රජතුමා පැමිණෙන තෙක් ඇයට ආරක්ෂාව සපයන ලෙසට අණකර චතුරංග සේනාව එහි පිටත්කර හරින ලදී.

සිව්සැට බරණින් සැරසී රජ පෙරහරේ ඉදිරියෙන් ම පැමිණි කාවන්තිස්ස රජතුමා ඔරුව අසලට පැමිණියේ ය. ඔරුවේ සිටි කුමාරියගේ රූප සම්පත්තියෙන් වශී විය. ඇය කැලණිතිස්ස රජුගේ දියණිය බව හඳුනා ගත්තේ ය. මාගම රජු තමා බව හඳුන්වා දුන් රජතුමා මෙසේ ඔරුවක නැඟී තනිව ම එන්නට හේතුව විමසී ය. පිය රජතුමා ගේ වරදක් නිසා මුහුද ගොඩ ගලන්නට පටන් ගත් බවත්, රටත් ජනතාවත් බේරා ගැනීම සඳහා මුහුදට බිලි වූ බවත් පැවසුවාය. එහෙත් මුහුද මා බිලි නොගෙන මේ ප්‍රදේශයට රැගෙන විත් තිබෙන බවත් පැවසුවාය.

ඔබේ සපැමිණීම දේවාශිර්වාදයක්. බොහෝ සතුටට කරුණක්. එම නිසා ඔබ කැමැති නම් මාගේ අග මෙහෙසිය ලෙස ඔබ අභිෂේක කිරීමට කැමති බව ප්‍රකාශ කළේ ය. තම රජ මාලිගයේ දී බොහෝ ප්‍රභුවරුන්, ඇමැතිවරුන්, ප්‍රසාදයෙන් කතා කරන ආරෝහපරිනාහ දේහ සම්පත්තියෙන් යුතු කාවන්තිස්ස රජු දෙස කුමරිය මොහොතක් බලා සිටියා ය. ඔහු කෙරෙහි පැහැදුණේ ය. මුනිවත රකිමින් සිය කැමැත්ත පළ කළා ය.

සේවිකාවන් පැමිණ කුමරිය ඔරුවෙන් බස්සවා කැඳවාගෙන යන ලදී. ඉනික්බිතිව සුවඳ පැනින් නහවා වටිනා වස්ත්‍රාභරණයෙන් සරසා අභිෂේක මණ්ඩපය වෙත ගෙන යන ලදී. දේවී කුමරිය දෙවඟනක් බඳු රූප ශ්‍රීයෙන් බැබළිණි. රජතුමා බොහෝ සතුටට පත් විය. පුරෝහිත බමුණන් විසින් දේවි කුමරිය මාගම රජුගේ අග මෙහෙසිය ලෙස අභිෂේක ගන්වන ලදී. දේවි කුමරිය අභිෂේක ගන්වන ලද ස්ථානයේ විහාරයක් තනවන ලදී. මේ නිසා ඇය විහාරමහා දේවිය නම් වූවා ය.

විහාර මහා දේවිය ලා බාල වයසේ පසු වුවද දැනුමෙන් පිරිපුන් වූවා ය. රාජ්‍ය තාන්ත්‍රික කටයුතු පිළිබඳ පරිචයක්, නිපුණත්වයක් දැක්වූවා ය. රජ මැදුරේ සියලු දෙනාගේ සිත් දිනා ගත්තා ය. ඇයගේ විධානයන්ට සියලු සේවක සේවිකාවෝ අවනත වූහ. ඇය ගේ ප්‍රධානත්වයෙන් දිනපතා රජ මාලිගයේ මහා සංඝයා වහන්සේ විෂයෙහි දන් පිරිනැමුණි. ඊට අමතරව සිතුල් පවු විහාරය, තිස්සමහා විහාරය සිලාපස්ස පිරිවෙන ඇතුළු අවට විහාරස්ථානවල විසූ රහතන් වහන්සේලාට ඇප උපස්ථාන කෙරිණි; දන් පිරිනැමිණි. මෙසේ මහා සංඝයා වහන්සේට උපස්ථාන කරන ආකාරය, දන් පිරිනමන ආකාරය දුටු, ත්‍රිපිටක තිස්ස මහතෙරුන් වහන්සේ එතුමියට ආශීර්වාද කළහ.

> සේවිකාවන් විසින් කුමරිය ඔරුවෙන් බස්සවා කැඳවාගෙන යන ලදී. ඉනික්බිතිව සුවඳ පැනින් නහවා වටිනා වස්ත්‍රාභරණයෙන් සරසා අභිෂේක මණ්ඩපය වෙත ගෙන යන ලදී. දේවී කුමරිය දෙවඟනක් බඳු රූප ශ්‍රීයෙන් බැබළිණී. රජතුමා බොහෝ සතුටට පත් විය. පුරෝහිත බමුණන් විසින් දේවි කුමරිය මාගම රජුගේ අග මෙහෙසිය ලෙස අභිෂේක ගන්වන ලදී.

**අයන්ති විතාන**



බොදු ගීයක මිහිර

# ජය සිරිමා හාමුදුරුවනේ...

**දරමිටි බැන්දා - රෑ නිදි වැරුවා**
**ගිනිමැල ගහගෙන රැක සිටියා...**
**එහෙව් අපට අද එන්ඩ තහංචි ද**
**ජය සිරිමා බෝ හාමුදුරුවනේ...**

**වැලි මළුවේ හිඳ සාධු කියන කොට**
**අහිතක් නොහිතා ඉන්ඩ හොඳයි**
**ඉස්සර වාගෙම දාඩිය මුසු වුණු**
**අපේ බාර පිළිගන්ඩ හොඳයි**
**ජය සිරිමා හාමුදුරුවනේ...**

**රන්වැට පාමුල සාධු කියන කොට**
**ළෙන්ගතුකම් නොහිතන්ඩ හොඳයි**
**බුදු හාමුදුරුවො වූවා වාගෙයි**
**දුක ඉවසා වැඩ ඉන්න හොඳයි**
**ජය සිරිමා හාමුදුරුවනේ...**

**ගායනය – දීපිකා ප්‍රිදර්ශනී**
**පද රචනය – මහින්ද චන්ද්‍රසේකර**
**සංගීතය – රෝහණ වීරසිංහ**

බුද්ධත්වයට සෙවණ සැලසූ ජය ශ්‍රී මහා බෝධීන් වහන්සේට කළගුණ දැක්වීමට බුදුන් වහන්සේ අනිමිස ලෝචන පූජාවෙන් ද පිදූම් දුන් සේක. ඒ උතුම් පූජනීය වස්තුව සැදැහැවත් බෞද්ධයන් විසින් දැක සංවේගය උපදවා ගත යුතු බව දීඝනිකායේ මහා පරිනිබ්බාන සූත්‍රයේ ද සඳහන් ය.

මේ උතුම් බෝධීන් වහන්සේගේ දක්ෂිණ ශාඛාව ලංකා භූමියට වඩමවා ගැනීමට ඇප කැප වුණ අනුබුදු මිහිඳු මාහිමියන්ගේ පින්බර ඔවදන් ද ,සඟමිත් තෙරණියගේ ලංකා ගමනය ද ,දඹදිව් තලයේ දම් සෝ නිරිඳු සහ ලක්දිව් තලයේ දෙවනපෑතිස් රජුදැක්වූ රාජ අනුග්‍රහය ද විශිෂ්ට ය.

බුදුන් වහන්සේ පිරිනිවන් මඤ්චකයේ දී දේශනා කළ බුද්ධ අධිෂ්ඨානයන් ගැන මොග්ගලීපුත්ත මහ රහතන් වහන්සේගෙන් දැනුවත් වූ දම්සෝ නිරිඳු බුද්ධාලම්භන ප්‍රීතියෙන් ඔද වැඩී ගියේ ය.

කාලය එළඹි කල දඹදිව් තලයේ දම්සෝ නිරිඳුන් බෝධීන් වහන්සේ දෙස බලා සැදැහැයෙන් දෑගිලි බැඳ සත්‍යය ක්‍රියා කළේ ය. එම බලයෙන් බෝ සමිඳුන්ගේ දක්ෂිණ ශාඛාව බැඳි සතර රියන් පෙදෙස හැර සියලුම ශාඛාවන්ගෙන් විහිදුණු ඍද්ධි ප්‍රාතිහාර්යයන් අසිරිමත් ය. මුල් සියයක් අද්දවමින් දක්ෂිණ ශාඛාව රන් කටාරමෙහි පිහිටන විට හිම වළා ගැබක් අතරට වැදී ප්‍රාතිහාර්ය දැක්වූයේ මහ පොළොව කම්පිතව ය. දෙවි , මිනිසුන්ගේ මහත් වූ බහුමානයන් මධ්‍යයේ බෝධීන් වහන්සේගේ එලයන් හා පත්‍රවලින් සවණක් රැස් විහිදෙමින් මුළු දඹදිව් තලය ම ඒකාලෝක විය. මේ අසිරිමත් දසුනින් ධර්මාශෝක රජුට ඇතිවූයේ අපරිමිත බුද්ධාලම්භන ප්‍රීතියකි.

ඒ නිසා ම දම් සෝ නිරිඳුන් දඹදිව් රාජ්‍යය ම බෝ සමිඳුන්ට පිදුවේ බෝධි රාජයාණන් වෙන්වීමේ දුක දරාගත නොහැකි ව, ශෝකයෙන් කඳුළු වගුරවමිනි. සැදැහැබර දම් සෝ නිරිඳුන් බෝධි රාජයාණන් ඔසවාගෙන නෞකාවෙහි තැම්පත් කළේ ග්‍රීවය දක්වා වූ ජලයෙහි බැස ගනිමිනි.

ශාසන වංශ කතාවල සඳහන් සේ බෝධීන් වහන්සේගේ රැකවරණයට අටළොස් කුලයක පිරිස සමඟ සංඝ මිත්තා මහ රහත් තෙරණිය ලංකාගමනය ඇරැඹූ අයුරු ද අසිරිමත් ය.

ගංගා නම් නදිය මත්තේ සැරැසිල්ලෙන් අලංකාර වූ යාත්‍රාව රාජ්‍ය දූත පිරිස රැගෙන වින්ධ්‍යා වනය පසු කරමින් තාමු ලිප්ති නැව් තොටට පැමිණියේ සත් දිනක් මුළුල්ලේ ය. මහ සයුර තරණය කරද්දී රළ සිඳි සත්වනක් පියුම් පිපී මේඝ වර්ෂා වසිමින් මහා ප්‍රාතිහාර්ය දැක්වී ය. ගුවනේ තූර්යයෝ වැයුණ හ. නාග සේනාවෝ මහා බෝධිය ලබා ගැනීමේ අදිටනින් ඍද්ධි විකුර්ණය කළහ. අභිඥාබල සම්පන්න සංඝමිත්තා මහ රහත් තෙරණියන් වහන්සේ ගුරුළු වෙස් ගෙන නාගයන් දමනය කළ බව මහා වංශයෙහි සඳහන් ය.

මෙවන් අසිරිමත් සිදුවීම් පෙළක් මධ්‍යයේ ශ්‍රී මහා බෝධීන් වහන්සේගේ දක්ෂිණ ශාඛාව වඩා හිඳුවාගෙන ලක්දිව් තලයේ දඹකොළ පටුනට වැඩම කළ සඟමිත් තෙරණියගේ ලංකා ගමනය සනාථ කිරීමට සාංචි ස්ථූපයේ නැගෙනහිර වාහල්කඩ මුදුනේ නිරූපිත කැටයම ද සාක්ෂි දරයි. එය ගෲන්ඩ්වේල් විසින් පෙන්වා දෙනු ලැබූ බව මහාචාර්ය ගෛගර් පඬිතුමාගේ මහාවංශ ඉංග්‍රීසි පරිවර්තනයේ ද සඳහන් ය.

විශේෂ මණ්ඩපයක වඩා හිඳ වූ ශ්‍රී මහා බෝධි රාජයාණන්ගේ දක්ෂිණ ශාඛාව නොයෙකුත් පුෂ්ප මාලාවන්ගෙන් ද, ධජ පතාක ආදියෙන් ද, සැරැසූ සුදු වැලි අතුල අලංකාර මාවත දිගේ ගෞරව බහුමානයෙන් යුක්තව මහා පෙරහරින් අනුරාධපුර මහමෙව්නාවට වැඩම කරවීය. අනුරාධපුර මහමෙව්නා උයනේ සීරුවෙන් වඩා හිඳවා ලූ බෝ සමිඳුන් අසූ රියනක් උස් ව ගුවන් ගැබේ සවණක් රැස් විහිදුවාලමින් දැක්වූ ප්‍රාතිහාර්ය ද ආශ්චර්යවත් ය. එයින් පැහැදුණු දේවානම් පියතිස්ස රජු ලංකා රාජ්‍යය ම සිරිමා බෝ සමිඳුන්ට පුදනු ලැබුවේ දෙහොත් මුදුන් දී නමස්කාර පූර්වකව ය. මෙවන් සුවිශේෂී සිදුවීම් රැසකින් සුපෝෂිත වූමෙම පූජනීය වස්තුවට බෞද්ධයන් ගරු බුහුමන් කරන්නේ ජීවමාන බුදුන් සේ ය.පෙර බුදුවරුන්ගේ බෝධි ශාඛා ද මෙම පුදබිමේ ම රෝපණය කළ බව සමන්ත පාසාදිකාවේ සඳහන් වීම බෞද්ධයා ලද ඉමහත් භාග්‍යයකි.

ආගමික, සංස්කෘතික වශයෙන් ලක්බිම පහන් කළ අනුබුදු මිහිඳු මහ රහතන් වහන්සේ, සංඝමිත්තා මහ රහත් තෙරණියන් නිසා සිංහල බෞද්ධ සාහිත්‍යයට ලබා දුන් ජීවය සදාතනික ය.ඒ නිසා මබෝධි සාහිත්‍ය පදනම් ව ලියැවුණු ගීත සාහිත්‍ය පවා දෝලනය වූයේ බොදු ඇසිනි. ඒ අතුරින් නිර්මිත වූ 'ජය සිරිමා බෝ හාමුදුරුවනේ' ගීතයද විශේෂිත ය. එය ගායනා කරන්නී දීපිකා ප්‍රිදර්ශනී ය. එයටම සරිලන ගීපදවැල් සපයන්නේ මහින්ද චන්ද්‍රසේකර ය. සංගීතය ප්‍රවීණ සංගීතවේදී රෝහණ වීරසිංහයන්ගේ ය.

**'ජය සිරි මා බෝ හාමුදුරුවනේ**
**දර මිටි බැන්ඳ – රෑ නිදි වැරුවා**
**ගිනිමැල ගහගෙන රැක සිටියා'**

එදා රජ රට වැසියෝ,බෝධීන් වහන්සේ සොර සතුරන්ගෙන් , වන සිවුපාවුන්ගෙන් සුරැකීමට දිවිහිමියෙන් සටන් කළේ ගිනිමැළ ගසාගෙන, රැය පහන්වනතුරා ය. එයට අවශ්‍ය දරමිටි රැගත් පෙරහර පැවැත්වූ 'නිකිණි පුර පසළොස්වක' පෝ දිනය 'දරමිටි පොහොය' නමින් හැඳින්වීම ද විශේෂිත ය.

සංගීතයේ මුසු වුණු දුක්මුසු ගීත රාවය ද, අර්ථාන්විත පදවැලින් ද සමාජයේ යම් අසාධාරණයක් පෙන්වා දෙන බව ද හැඟේ. 'එහෙව් අපට අද එන්ඩ තහංචි ද' ගී පැදි පෙළ එයට උචිත ය. විටක එය ශ්‍රී මහා බෝධිය රැකගත් වැසියන්ගේ සුසුම් වැලෙහි රාව ප්‍රතිරාවයක් ද විය හැකි ය. එය 'වැලි මළුවේ හිඳ සාදු කියනකොට අහිතක් නොහිතා ඉන්ඩ හොඳයි' යනුවෙන් අර්ථාන්විත ය.

මේ පූජනීය වස්තුව අදටත් සුරැකිව ඇත්තේ එදා මේ අසරණ පිරිසගේ ඇප කැප වීම නිසා ම ය. ඔවුන් බාහිරෙන් අසරණ වුව ද ආධ්‍යාත්මයෙන් පොහොසත් ය. එය උඩමළුවේ වැඩ සිටිනා ජය සිරිමා බෝ සමිඳුන් දන්නා සේ මේ පිරිසගේ දුක් ගැනවිලි පිළිගන්නේ ද ඒ සැමට ම සෙත සලසා දෙමිනි.

**'ඉස්සර වාගෙම දාඩිය මුසු වුණු**
**අපේ බාර පිළිගන්ඩ හොඳයි**
**ජය සිරිමා හාමුදුරුවනේ'**
**යනුවෙන් පසක් වෙයි.**

එදා බෝ සමිඳු රැකගත් පිරිසත්, අද රන්වැට පාමුල සාධු නාද නගන ප්‍රභූ පිරිසත් දෙස සම සිතින් දෙසවන් යොමන්නා සේ බෝ සමිඳුන් නිසලව වැඩ සිටී. එය මෙත් සහගත ව වැඩ සිටිනා අසම සම බුදුන් වහන්සේගේ දසුන මෙනි.

**'රන්වැට පාමුල සාධු කියන කොට**
**ළෙන්ගතුකම් නොහිතන්ඩ හොඳයි**
**බුදු හාමුදුරුවො වූවා වාගෙයි**
**දුක ඉවසා වැඩ ඉන්න හොඳයි**
**ජය සිරිමා හාමුදුරුවනේ'**

**ජම්මික ප්‍රබෝධනී වැලිකල**

බුදු සරණ

35, ඩී. ආර්. විජයවර්ධන මාවත, ලේක්හවුස් - කොළඹ.

ටැලිෆෝන් - 2429598, 2429429 ෆැක්ස් - 2429329, 2449069

නිකිණි අව අටවක 2020.08.11

# සැබෑ දියුණුව

ජීවිතයේ දියුණුව, සාර්ථකත්වය අපේක්ෂා කිරීම පොදු මිනිස් ස්වභාවය වන්නේ ය. බොහෝ දෙනා දියුණුව, සාර්ථකත්වය ලෙස අර්ථ දක්වන්නේ මිල මුදල්, යාන වාහන ආදී භෞතික සම්පත්හි අසීමාන්තික බව ය. ඒ සම්පත් ළඟා කර ගන්නට බොහෝ පිරිසක් හැල්මේ දිවයති. නැවතීමක් නැතිව ම යති. ඒ අධිවේගය තුළ බොහෝ විට හොඳ නරක තෝරා බේරා ගැනීමක් නැත. උත්සාහය කෙසේ හෝ තමන්ගේ ගොඩ වැඩි කර ගැනීම ය. සමාජය විවිධ අපරාධයන්ට, අපචාරයන්ට, වංචා දූෂණයන්ට යොමු වන්නේ ඒ හේතුව නිසා ය.

විවිධ කූඨෝපක්‍රම මඟින් මුදල් උපයන්නට ඇතැම් පිරිස් මොන තරම් නින්දිත පෙළඹවීම්වලට ලක්වී ද යත් පසුගිය දිනයන්හි උකුස්සන්, බළලුන් වැනි සතුන් පවා යොදා ගනිමින් මත් ද්‍රව්‍ය ප්‍රවාහනය කිරීමට ගත් උත්සාහයන් දැකිය හැකි විය. එය කෙසේ හෝ මිල මුදල් උපයා ගැනීමේ පරමාර්ථය පමණක් මුල් කරගත් අසීමාන්තික ආශාවේ ප්‍රතිඵලයකි. මෙවැනි අශීලාචාරකම් අඩු වැඩි වශයෙන් සමාජය තුළ විද්‍යාමාන ය.

බුදු දහම අනුදත් සැබෑ දියුණුව නම් පුද්ගලයා ආධ්‍යාත්මික ව ලබන්නා වූ දියුණුව ය. ආධ්‍යාත්මික ගුණ ධර්ම ගරු කරන පුද්ගලයා ජීවිතයට අවශ්‍ය කරන භෞතික සම්පත් උපයා ගන්නේ ධාර්මිකව ය. ඒ උත්සාහයන් මල්ඵල ගැන්වෙන්නේ තමන්ට ද, අනුන්ට ද අනර්ථයක් නොවෙමිනි. එවැනි මිනිසුන් වෙසෙන සමාජය සැබැවින් ම ගිහි ප්‍රතිපදාවට පිළිපන්, එනම් පංච ශීලය ගරු කරන සමාජයකි. අප උත්සාහ කළ යුතු එවැනි සමාජයක සාඩම්බර සාමාජිකයෙක් වීමට ය.

අයහපත බැහැර ලා යහපතට මුල් තැන දෙන දියුණු පුද්ගලයෙක් බවට පත්වීමට විශේෂ හැකියාවක් තිබිය යුතු ය. ඒ අතර උත්සාහය මුල් තැන ගනී. මිල මුදල්, ධන සම්පත් සේ ම තමන් තුළ හොඳ ගුණ ධර්ම වැඩි දියුණු කර ගැනීමට ද උත්සාහයක්, නොපසු බස්නා වීර්යයක් තිබිය යුතු ය. ඒ වෙනුවෙන් නිරන්තර ව සිත කය වෙහෙස විය යුතු ය. සමාජ විරෝධී බොහෝ කටයුතුවලට මුල් වන්නේ ඇතැමෙක් අලස ව හිඳ පහසුවෙන් මුදල් උපයා ගැනීමේ ක්‍රමෝපායන්වලට අනුගත වීම නිසා ය.

එවැනි වැරැදි සහගත ක්‍රියාකාරකම්වලින් බැහැර වීමට නම් එළඹ සිටි සිහිය ඉතා වැදගත් ය. එනම් හරි වැරැදි දැක, අවබෝධ කොට ගැනීමට යහපත් කල්පනාවක් තිබිය යුතු ය. යහපත් කල්පනාවක් ඇති කර ගැනීමට නිරන්තර දහම් ශ්‍රවණය ඉතා වැදගත් ය. යහපත් පුද්ගලය ආශ්‍රය ද වැදගත් ය.

පිරිසුදු බව දියුණුවන්නා තුළ තිබිය යුතු සුවිශේෂී ම ගුණාංගයකි. සිත, කය, වචනයෙහි පිරිසුදු බව දියුණු වන්නා තුළ තිබිය යුතු සුවිශේෂී ම ගුණාංගයකි. එනම් සිත, කය, වචනය තුළින් නිදෙස් දේ ම කිරීම ය. පව බැහැර පිනට යොමු වීම ය.

දක්ෂ වෛද්‍යවරයෙක් ප්‍රතිකාර කරන්නේ රෝගයට නොව රෝග නිදානයට ය. දියුණුව බලාපොරොත්තුවන පුද්ගලයා ද එවැනි ය. ඔහු නුවණින් පිරික්සා විමසා බලා කටයුතු කරන්නෙකි. ඒ තුළ දෙස් නිදෙස් සොයා බලා නිදෙස් දේ ම කිරීමට පෙළඹේ. ඒ ක්‍රියාකාරීත්වයෙහි දී සමාජ විරෝධී දේ, අන්‍යයන් විනාශ වන දේ සිදු වන්නේ නැත. සිත, කය දමනය කර ගත් පුද්ගලයෙක් වීම, දැහැමිව ජීවත් වීම, සියලු යහපත් කාර්යයෙහි ප්‍රමාදී නොවන පුද්ගලයකු වීම දියුණුවන තැනැත්තාගේ ලක්ෂණ ය.

තමාත් විනාශයෙහි ගිලී, අනුන් ද විනාශයට කැඳවාගෙන යන පුද්ගලයෙකු නොවී තමන්ගේ ද අනුන්ගේ ද යහපත, දියුණුව බලාපොරොත්තු වන්නෙකු වීම සැබෑ බෞද්ධයාගේ ස්වභාවය ය. එසේ දැහැමෙන් සෙමෙන් ගෙවන දිවි පැවැත්ම යහපත් සමාජයකට දොරගුළු විවර කරන්නේ ම ය. අන්‍යයන්ට ද ආදර්ශයක් වන්නේ ය. දියුණුවෙහි සැබෑ අරුත වටහා ගනිමු.

# ජීවිතයක වටිනාකම

**අප භාග්‍යවත් බුදුරජාණන් වහන්සේ ලොව අතිශයින් ම දුර්ලභ සම්පත්තීන් හතරක් ඒකරපත්ත නා රජුට දක්වාලූ සේක. පින්වත් ඒකරපත්තය, මනුෂ්‍ය ජීවිතය දුර්ලභ ය. ලබාගත් ජීවිතය යහපත් ව පවත්වාගෙන යෑම ද දුර්ලභ ය. සද්ධර්ම ශ්‍රවණය ද දුර්ලභ ය. බුදුරජාණන් වහන්සේලාගේ ඉපදීම ද දුර්ලභ ය.**



ඇමරිකා එක්සත් ජනපදයේ කැලිෆෝනියා ප්‍රාන්තයේ ක්ලාරා නුවර බුද්ධි විහාරයේ රාජකීය පණ්ඩිත

**කොටපොල චන්දිම හිමි**

අපාය, ප්‍රේත, දිව්‍ය හා මිනිස් තල අතුරින් ධර්මය පුහුණු කොට නිවනින් නිවෙන්නට අඩිතාලම දැමිය හැක්කේ මනුෂ්‍ය ලොවෙහි ඉපදීමෙන් පමණි. මනුෂ්‍ය ලොව ජනගහනය තිරිසන් ජීවීන්ගේ ගණනින් පමණක් සංසන්දනය කළ ද, මනුෂ්‍ය ජීවීන් බිලියන හය ගණනත් ගන්නටවත් නොහැකි ඉතා කුඩා අංශු මාත්‍රයකි. ඇතැම් එක් කඩිගුලක පමණක් බිලියන ගණනාවක කඩියන් පමණක් ඇතැම්විට අපි දකිමු. ඉතුරු සියලු ලෝකවල ජීවීන් හා ගතහොත් මනුෂ්‍ය ජීවිතයේ දුර්ලභ බව හිතාගත නොහෙන තරම් ය. අපේ බුදුරජාණන් වහන්සේ එය කණ කැස්බෑවා විය සිදුරෙන් අහස බැලීමට සමාන කර තිබේ.

“පින්වත් මහණෙනි, විය දණ්ඩක් මුහුදෙහි උතුරට, දකුණට, නැගෙනහිරට, බස්නාහිරට සුළඟින් ගසාගෙන යමින් ඒ මේ අත පාවෙයි. මුහුදේ ජීවත්වන එකැස් කණ කැස්බෑවෙක් අවුරුදු සියයකට වරක් උඩට එයි. ඒ එන වරෙක ඌ විය සිදුරෙන් අහස දකියි.

මහණෙනි, මෙය සිදුවිය හැකි දෙයක් ද?

භික්ෂූන් වහන්සේලා ඉමහත් ගෞරවයෙන් මෙසේ පිළිතුරු දුන්හ. “ස්වාමීනි, එය ඉතා දුර්ලභව විය හැකි දෙයකි. විය දණ්ඩ ඇළක, දොළක, ගඟක, තොටක නොරැඳී මුහුදට ආ යුතු ය. කණ කැස්බෑවා ද එය ඇති තැනින් මතුව, විය සිදුරටම, කණ නොවූ ඇහැ තබා, ඇස් නොපියා අහස බැලිය යුතු ය. මෙය සිදුවෙතොත් ඉතා කලාතුරකිනි. ‘ම නි බාලපණ්ඩිත සූත්‍රය)

අප බුදුරජාණන් වහන්සේ මද සිනා පහළකොට කරුණාවෙන් මෙසේ වදාළහ. “පින්වත් මහණෙනි, නරක, තිරිසන්, ප්‍රේත, අසුර නිරයවලට වැටුණ මිනිසා ද මෙබඳු ය. එබන්දෙකු යළිත් මිනිසෙකු වීම ද, එතරම්ම දුර්ලභව විය හැක්කකි”

අප ලැබූ මනුෂ්‍ය ජීවිතය කෙතරම් දුර්ලභදැයි ඔබට වැටහුණි ද? ඇතැම් හු මේ දුර්ලභව ලබාගත් මනුෂ්‍ය ජීවිතය අකාලයේ අහිමි කර ගන්නේ සිය දිවි නසා ගැනීමෙනි.

බොහෝ දෙන දිවි නසා ගන්නේ මානසික ආතතිය නිසා ය. දූෂණය, ශාරීරික හිංසනය, යුද්ධයේ අමිහිරි අත්දැකීම්, ආදර සබඳතා බිඳවැටීම්, විරැකියාව, මුදල් හිඟකම, සමාජ තත්ත්ව නැතිවීම, දේපළ අහිමිවීම, අධ්‍යාපනික අසමත්වීම්, පවුලෙන් කොන්කිරීම්, සමාජ අසාධාරණ, සිරගතවීම්, වැනි කරුණු ගණනක් නිසා මිනිසුන් සියදිවි නසා ගනිති. එහෙත් මේ සියලු අහිමිවීම් මැද එක ඉතා දුර්ලභ කල්පයකට තියා ඇතැම්විට කල්ප සිය ගණනකටත් මෙහායින් නොලැබුණ, මිල කළ නොහැකි මනුෂ්‍ය ජීවිතය තවමත් තමන් සතු බව ඔවුහු නොසිතති. සැබෑ අවාසනාවන්ත තත්ත්වය එයයි.

බාහිර තාවකාලික දේ අල්ලා ගන්නා අපි එයින් ඇතිවීමක් ගැන නොසිතමු. එය බොහෝ දෙනෙකුට පොදු සාධකයකි. කෙතරම් ධනය, බලය, යසස, කීර්තිය, ප්‍රශංසාව තිබුණ ද ඒවා තාවකාලික බව ද, තමාගේ සාමාන්‍ය මිනිසත් බව බාහිර ලැබීම් නිසා වෙනස් නොවන බව ද අප දැන සිටිය යුතු ය. කුමක් ඇතත්, නැතත් අපේ සිතත්, ගතත්, මොහොතක් පාසා ඉපදෙයි. මැරෙයි. බාහිර ලැබීම් තණ්හාවෙන් ‘මම මගේ’ යැයි අල්ලාගෙන දුක් විඳින්නට එය තේරුම් ගත් තැනැත්තා තුළ කෙනෙකු ඉතුරු නොවේ.

සිය දිවි නසා ගැනීමට සිත් පහළ වන තැනැත්තා මුලින් ම ඒ සිතිවිලි එන විටම සිහියෙන් සිට වෙනත් දෙයක් කල්පනා කළ යුතු ය. එයට ද අසමත් වේ නම් සියදිවි නසා ගැනීමේ ආදීනව පිළිබඳ සිතිය යුතු ය. මනුෂ්‍ය ජීවිතයේ වටිනාකම සිතිය යුතු ය. ධර්මය පිළිබඳ සිතිවිලි අපහසුවෙන් වුව ද ගොඩනගා ගත යුතු ය.

එම සිතිවිලි බුර බුරා එන්නේ නම් දත්මිටි කමින් ඉවසා මම බුදුරජාණන් වහන්සේට ද, ධර්මයට ද, මහා සංඝයා වහන්සේට ද, මව්පියන්ට ද දිවි කැප කරමි යි සිතිය යුතු ය. සංසාරේ කොහිත් ඇත්තේ මීටත් වඩා අනන්ත දුක් බවත් මේ නම්, ඒ හා ගත්විට ඉතා කුඩා දුකක් බවත් සිතිය යුතු ය. ධර්මය පුහුණු කිරීමට ජීවිතය පුදමියි සිතමින් උතුම් අධිෂ්ඨානයක් කරන විට දුක තුනී වී එබඳු සිතිවිලි ටික ටික පහවී සිත ශාන්ත වනු ඇත.

එසේම, එබඳු සිතිවිලි ඇති තැනැත්තා තම සන්තකයේ ඇති වස විෂ, ආයුධ ආදී දෑ නිවසින් බැහැරලා, වෛද්‍ය ප්‍රතිකාර නිසි සේ භාවිත කරමින් මෛත්‍රී භාවනාව ප්‍රගුණ කළ යුතු ය. මත් ද්‍රව්‍ය භාවිත නොකොට සිටීම ද යහපති. තම ගැටලු විහාරස්ථ මහ සඟරුවන හා කතාබහ කරන අතර ම ජීවිතයේ සුබවාදී බව සිතිය යුතු ය. එබඳු සිතිවිලි එන කල තම සමීපම ඤාතියෙකු හෝ යහළුවෙකු සමඟ ඒ ගැන කතාබහ කළ යුතුම වේ.

සියදිවි නසා ගැනීමේ අවසන් මොහොත තුළ ඇතිවන්නේ බොහෝදුරට ද්වේෂ සිතකි. ද්වේෂ සිතින් මිය යන්නෝ උපදින්නේ ම නිරයෙහි ය. මෙකී කර්මය හා විපාක ස්වභාවය නිතර සිතින් මෙනෙහි කළ යුතු ය. මෙසේ සිතිවිලි පැමිණීම ද, තමන්ගේ පැරණි කර්මයක දුර්විපාකයක් බව ද, දැඩි චිත්ත ශක්තියෙන් එය දුරුකළ හැකි බව ද දැනගත යුතු ය.

මිනිසත් බව ලැබීම සේ ම පවත්වාගෙන යාම ද දුෂ්කර ය. අතීත කුසලයක් නිසා ලැබූ මේ මිනිස් දිවියට සරිලන ධාර්මික ස්ථාන පැවැත්මක් නිවැරදි ධර්මානුකූල ජීවිත දැක්මක් ඔස්සේ ගොඩනගා ගත යුතු ය. ඒ සඳහා උපකාරී වන කල්‍යාණ මිත්‍රයන් නිතර ආශ්‍රය කළ යුතු ය.

මේ අපේ සංසාරික මනුෂ්‍ය ජීවිතවල වටිනාම දිවියයි. ධර්මය යළිත් මුණ ගැසේ ද, නොවේද? යන්න සැක සහිත ය. එහෙයින් අඥණ, ළඟ පමණක් දකින තීරණ නොගෙන, මේ ධර්මය පවතින යුගයක අප ලැබූ මිනිස් දිවියේ අග්‍ර ඵලය වූ නිවන් සුව සාක්ෂාත් කරගන්නට ඔබ මොහොතින් මොහොත නොපමා ව කටයුතු කළ යුතු සේ ම අන් සැම ද එහිලා උත්සුක කළ යුතු ය.

# බුදු දහමේ අගයන 'ශ්‍රමය' වටිනා සම්පතකි



ගාල්ල දිස්ත්‍රික්කයේ උප ප්‍රධාන සංඝ නායක ඉමදුව වල්පොල ශ්‍රී ගෞතමාරාම පුරාණ මහා විහාරාධිපති ගෞරව ශාස්ත්‍රවේදී
**වල්පොල ගුණරතන නා හිමි**

**මෙලොව ජීවත්වනු ලබන පුද්ගලයෙකුගේ ලෞකික දියුණුව සලසා ගැනීම පිණිස තමාගේ කායික ශ්‍රමය නිවැරදි ව වැය කළ යුතු ආකාරය ව්‍යග්ග පජ්ජ සූත්‍රය තුළදී බුදුරදුන් කරුණු පැහැදිලි කර දී ඇත.**

උත්සාහයෙන්, වීර්යෙන් සිය බාහු බල මෙහෙයවා, දහඩිය මුගුරු වගුරුවා , දැහැමෙන් සෙමෙන් නිවැරදි ධනයක් ඉපයීම පිණිස තම ශ්‍රමය වැය කළ යුතු බව උගන්වා ඇත.

අංගුත්තර නිකාය තුළින්ද කායික ශ්‍රම විභජනය වඩාත් ඵලදයි වන අන්දමින් වැය කළ යුතු අන්දම එහි සඳහන් කරුණු අටක් මගින් පෙන්වාදී ඇත.

ඉදිරියට කරන්නට ඇති වැඩ ගැන සිතා දැන් කළ යුතු දේ දැන් කරන්න

වැඩක් කර අවසන් වූ විට එම වැඩ කරන කාලය තුළදී අතපසු වූ යමක් ඇත්දැයි සිතා එයද ඉටු කරන්න

ගමනක් යාමට ඇති විට කළ යුතුව ඇති වැඩ අවසන් කර යෑමට උත්සාහ කරන්න.

ගමනක් ගොස් ආපසු ආවිට ඒ කාලය තුළදී මඟ හැරුණු කටයුතු ඉටු කරන්න ප්‍රමාණවත් වන ආහාරයක් නොලද විට තවමත් මාගේ කය ශක්තිමත්ය දුබල වීමට පෙර වැඩ කටයුතු අවසන් කිරීමට උත්සාහ කරන්න ප්‍රමාණවත් වන ආහාරයක් ගත් කල්හි දැන් මාගේ ශරීරය ශක්තිමත් යැයි සිතා වැඩ කරන්න මද ගිලන් බවක් දැනෙන විට රෝගය උත්සන්න වීමට පෙර කළ යුතු වැඩ නිමා කිරීමට උත්සාහ කරන්න රෝගයකින් සුවය ලද පසු රෝගී ව සිටි කාලයෙහි අතපසු වූ වැඩ සොයා බලා ඉටු කිරීමට උත්සාහ කරන්න යනුවෙන් කායික ශ්‍රමයෙන් උපරිම ඵල නෙළා ගැනීමට අවශ්‍ය උපදෙස් එමගින් ලබා දී ඇත. ඒවා සාර්ථක ලෞකික දිවියක් ගෙවන්නෙකු සඳහා ඉවහල් වන වැදගත් උපදේශයෝ ය.

කායික ශ්‍රමය පුද්ගල යහපත පිණිස මෙන්ම, සමාජ යහපත පිණිස ද වඩාත් නිවැරදිව යෙදවිය යුතු වන්නේ ය. එහිදී බුදුරජාණන් වහන්සේ පෙන්වා දෙනු ලැබූ ආර්ය අෂ්ටාංගික මාර්ගයෙහි දැක්වෙන "සම්මා වායාමය" මගින් ද උගන්වා ඇත. එහි දැක්වෙන සතර "සම්‍යග් ප්‍රධාන වීර්ය" මගින් ද උගන්වා ඇත්තේ ශ්‍රම විභජනය උභයාර්ථ සාධනය පිණිස ම ඉවහල් වන්නක් වන බවයි.

උපන් කුසල් දියුණු කර ගැනීමට උත්සාහ කිරීම, නූපන් කුසල් උපදවා ගැනීමට උත්සාහ කිරීම, උපන් අකුසල් නැති කර ගැනීමට උත්සාහ කිරීම හා නූපන් අකුසල් නූපදවීමට උත්සාහ කිරීම ය, වශයෙන් එම කරුණු පෙන්වා දිය හැකි ය.

> යමකු වීර්යය අත්හැර උකටලී ව මෙලොව අවුරුදු සියයක් ජීවත් වුව ද ඉන් පලක් නොවන බවත්, යමෙකු වීර්යවන්ත ව ලොව එක් දවසක් ජීවත් වන්නේ ද එය වඩාත් ශ්‍රේෂ්ඨ වන බවත් ඉහත දේශනාව මගින් පෙන්වා දී ඇත. ඒ අනුව දෙලොව දියුණුව සලසාලනු ලබන පුද්ගල ශ්‍රමය නිවැරදි දෑ සඳහාම යොදවා ශ්‍රමයේ ඵලදායිතාව උපරිමයෙන් නෙළා ගැනීමට අපි සැම උත්සාහවන්ත වෙමු.

නූතන සමාජය තුළ වෙසෙන බොහෝ දෙනෙකු තමාගේ අගනා කායික ශ්‍රමය අනර්ථය පිණිස ම යොදවන බවක් දැකිය හැකි ය. එමගින් ලෞකික දිවිය මෙන්ම ආධ්‍යාත්මික දිවි පෙවෙත ද නිසරු එකක් බවට පත් කරනු ලැබේ.

සිඟාලෝවාද සූත්‍ර දේශනාව මගින් ද ශ්‍රමය නිවැරදි ව නොයොදන තැනැත්තාගේ ස්වභාවය පැහැදිලි කොට දී ඇත. එහි දැක්වෙන පරිදි "ථීනමිද්ධ" නීවරණ ධර්මය පවතින පුද්ගලයාගේ ස්වභාවය මනා ලෙස විග්‍රහ කොට දී ඇත. "ථීන" යනු සිතෙහි ඇති වන්නා වූ උදාසීන බවයි. "මිද්ධ" යනු සිතුවිලි තුළ ඇතිවන්නා වූ උදාසීන බවයි එවැනි ලක්ෂණයන්ගෙන් යුතු වූ තැනැත්තා නිතර ඇනුම් ඇරීම, නිතර ආහාර අනුභව කිරීම, නිරත නිදගැනීම ආදියෙහි නිරතවන බව ද පෙන්වා දී ඇත. එමෙන් ම කායික ශ්‍රමය වැය නොකොට උදාසීන ව ක්‍රියා කරනු ලබන පුද්ගලයෙකු හඳුනා ගත හැකි දේෂ හයක් ද එමගින් දේශනා කොට ඇත.

දැන් උදෑසන වැඩි යැයි සිතා වැඩ කල් දැමීම, දැන් සවස් වැඩි යි සිතා වැඩ කල් දැමීම, දැන් සීතල වැඩි යැයි සිතා වැඩ කල් දැමීම, දැන් උෂ්ණ වැඩියැයි සිතා වැඩ කල් දැමීම, දැන් කුසගිනි වැඩියැයි සිතා වැඩ කල් දැමීම, දැන් කුස පිරුණ වැඩි යැයි සිතා වැඩ කල් දැමීම.

යනු එම දේෂයෝ ය.

මෙවැනි ලක්ෂණයන්ගෙන් යුතු පුද්ගලයන් සමාජයේ බහුල ව දක්නට ලැබෙන අතර ඔවුන් දියුණුවක් නොලබන බවත්, දෙලොව පරිහානිය ඇති කර ගන්නා බවද දැකිය හැක.

පුද්ගල ශ්‍රමය සමාජ යහපත පිණිස ම යොදවන්නා නිරතුරුවම කරන කාර්යයෙහි දක්ෂයෙකු විය යුතු වේ අනලස් අයෙකු විය යුතු වේ ස්ථානෝචිත ප්‍රඥවෙන් ද විය යුතු වේ

එමගින් තම අභිමතාර්ථයන් මුදුන් පමුණුවා ගැනීමට ද හැකියාව උදවනු ඇත. පුද්ගලයෙකු වැය කරනු ලබන, ශ්‍රමය ලෞකික දියුණුව නැතහොත් මෙලොව අභිවෘද්ධිය සලසා ගත හැකි පරිදි යෙදවිය යුතු බවත්, එමෙන් ම ආධ්‍යාත්මික දියුණුව සලසා ගත හැකි පරිදි තම මානසික ශ්‍රමය ද නිවැරදිව යෙදවිය යුතු වේ.

මානසික ශ්‍රමය වඩාත් නිවැරදිව යෙදවීම මගින් කෙලෙස් ධර්මයන් ද නැතිකොට නිවන් අවබෝධ කර ගත හැකි වන බව දේශනා කොට ඇත. එහෙත් බුද්ධ කාලයේ විසූ ඇතැම් දෙනා මානසික ශ්‍රමය නිවැරදිව වැය නොකොට උකටලී ව ක්‍රියා කර ඇති අන්දම ඇතැම් චරිත මගින් ද ප්‍රකට කෙරේ. යමෙකු මානසික ශ්‍රමය වැය කිරීමේ දී එය උපරිමයටත් වඩා වැය කළහොත් එමගින් මානසික නොසන්සුන් බවක් ද ඇති කෙරේ. ඒ බව චක්ඛුපාල තෙරුන්ගේ කතා පුවත සාක්ෂි දරයි.

බුදු දහමෙහි අගයනු ලබන ශ්‍රමය අගනා සම්පතක් වන්නේය. එය වඩාත් නිවැරදිව කළමනාකරණය කරගත යුතු වේ. ආදර්ශමත් බුදු සිරිත තම ශ්‍රමය වඩාත් ඵලදයි ලෙස යෙදවූ අන්දම දවසේ පැය 22 ක් ම දෙව් මිනිසන්ගේ හිත සුව පිණිස ශ්‍රමය කැප කිරීමෙන් ම පසක් කෙරේ.

වර්තමාන සමාජය තුළ බෙහෙවින් ම පුද්ගල ශ්‍රමය වැය කෙරෙනුයේ ස්වාර්ථය හෙවත් ආත්මාර්ථයම පාදක කොට ගෙන ය. එහෙත් එය පරාර්ථය හෙවත් අන්‍යයාගේ යහපත පිණිස ද යෙදවිය යුත්තක් බව බුද්ධ දේශනා මගින් ද ප්‍රකට කොට ඇත. මහාවග්ග පාලියේ දැක්වෙන පරිදි

"මා ඒකේන ද්වේ අගමිත්තං" යන දේශනාවෙන් සනාථ කරනුයේ ද ශ්‍රමයෙන් උපරිම ඵල නෙළා ගන්නා ලෙසත් එය සමස්තය වෙනුවෙන් ම වැය කළ යුතු එකක් වන බවත් ය.

"අප්පමාදේන සම්පා දේථ"

"අප්පමාදෝ අමත පදං"

යනාදි බුද්ධ දේශනා පාඨ මගින්ද පුද්ගල ශ්‍රමයෙහි අගය පහදා දී ඇත.

යමෙකු වීර්ය අත්හැර උකටලී ව මෙලොව අවුරුදු සියයක් ජීවත් වුවද, ඉන් ඵලක් නොවන බවත් යමෙකු වීර්යවන්ත ව ලොව එක් දවසක් ජීවත් වන්නේ ද එය වඩාත් ශ්‍රේෂ්ඨ වන බව ඉහත දේශනාව මගින් පෙන්වා දී ඇත. ඒ අනුව දෙලොව දියුණුව සලසාලනු ලබන පුද්ගල ශ්‍රමය නිවැරදි දෑ සඳහාම යොදවා ශ්‍රමයේත් ඵලදායිතාව උපරිමයෙන් නෙළා ගැනීමට අපි සැම උත්සාහවන්ත වෙමු.

# අමා මහා නිවනට වැඩි මුත්තා මහ රහත් තෙරණිය

**මුත්තා මහ රහත් තෙරණිය අප ගෞතම බුදු සසුනේ සියලු කෙලෙස් නසා රහත්බවට පත් තවත් එක් තෙරණි නමක්.**

ඇය සංසරේ මිනිස් ජීවිතයක් ලද සෑම ආත්මයක ම සුවසේ පින් දහම් කළා. කිසිදක පිනට නිගා කළේ නැහැ. එකම පින නැවත නැවත කළා. පින ගැන වර්ණනා කළා. බොහෝ දෙනා පිනෙහි සමාදන් කළා. සෑම බුදු සසුනක දීම වාගේ ඇය සසර දුකෙන් එතෙර වීමට ප්‍රාර්ථනා කරමින් දහමෙහි හැසිරුණා.

විපස්සී බුදු රජාණන් වහන්සේගේ බුදු සසුන බැබළෙන කාලයේ දී ඒ ගමේ ම එක නිවසක සුන්දර නුවණැති දියණියක් ව ඉපදුණා. ඇය ඒ ජීවිතයේ දී ද සසරේ පුරුද්දට මෙන් බොහෝ පින් දහම් කළා. දුකෙන් පිරුණ මේ සසරින් එතෙර වේවා!යි නිතරම ප්‍රාර්ථනා කළා.

එක් දිනක් විපස්සී ශාස්තෲන් වහන්සේ මාවතක වඩිනු දුටු ඒ දියණිය පහන් සිත උපදවාගෙන පසඟ පිහිටුවා වන්දනා කළා. පසුකලක මරණයට පත් ඇය, ඒ කරගත් පිනට දෙව්ලොව දෙවඟනක් ලෙස ඉපදුණා. එයින් චුතව නැවත නැවත දෙව්ලොව ඉපදීමට තරම් ඇයගේ ඒ චිත්තප්‍රසාදය බලවත් වුණා.

අපගේ ගෞතම බුදුරජාණන් වහන්සේගේ බුදු සසුන ලොව බබළන කාලයේ ඇය දෙව්ලොවින් චුතව සැවැත්නුවර බමුණු කුලයට නෑකම් කියමින් ඉතාමත් පින්වන්ත දියණියක් ලෙස උපත ලැබුවා. ඇගේ නම මුත්තා යි.

තරුණ වයසේ දී මුත්තා ගිහි ගෙය ගැන කලකිරුණා. පැවිදි ජීවිතේ සුන්දරබව වැටහුණා. දිනක් ඇය මව්පියන්ට මෙහෙම කිව්වා.

”ගිහි ගෙදර වෙසෙන අප හරියට මොනරු වගේ කියලයි බුදුරජාණන් වහන්සේ උපමා කරලා තිබෙන්නේ. මොනරා ඉතා සුන්දරයි. විශාල පිල් කළඹක් තිබෙනවා. ඒ පිල් කළඹ ලස්සන වුණත් මහා බරක්. ඒ වගේ යි අපේ මේ ගිහි ජීවිතේ. බැඳීම් නිසා හරි බරයි. සැහැල්ලුවක්, සංසිඳීමක් ඇත්තේ ම නැති තරම්. ඇස, කන, නාසය, දිව, කය කෙතරම් පිනවුවත් ඇතිවීමක් නැහැ. සිත අප මුලා කරන්නේ වැද්දෙක් මහා වටුකුරුලු රංචුවක් ක්ෂණයකින් දැලට හසුකර ගන්නවා වගෙයි. නමුත් පැවිදි බව ඉතා සුන්දරයි. සහැල්ලුයි. සරලයි. වගකීම් නැති නිසා ඒ ජීවිතේ බරක් නැහැ. හරියට දිය මත පා වෙවී සිටින හංසයෝ වගේ. ඒ නිසා අම්මේ, තාත්තේ මට බුදු සසුනේ පැවිදිවීමට අවසර දෙන්න” කියා ඇය ඉල්ලා සිටියා.

මව්පියන් තම දියණියගේ මහා නුවණැති බව දැක “දියණිය, අපේ සතුටත් ඔබ සතුටින් සිටිනවා නම් පමණයි. ඔබ කැමැති දේ කරන්න” යි අවසර දුන්නා. ඇය මහා ප්‍රජාපති ගෝතමී මහ රහත් තෙරණිය වැඩ සිටි ආරාමයේ පැවිදි වූවා. තෙරණින් වහන්සේලාට උපස්ථාන කළා. උන්වහන්සේගෙන් කමටහන් ලබා ගත්තා. හුදකලාවේ භාවනාවේ යෙදුණා.


බුදුරජාණන් වහන්සේ දුටවා ඇගේ පින හොඳින් මෝරා ඇති බව. එතුමිය දැන් සිත එකඟ කරගෙනයි සිටින්නේ. භාග්‍යවතුන් වහන්සේ ජේතවනාරාමයේ වැඩ සිටිය දීම එතුමිය සිටි ස්ථානයට ආලෝක ධාරාවක් විහිදුවා ඇයගේ ඉදිරියේ පෙනී සිටින්නා ලෙස ඍද්ධියක් පා ගාථාවක් වදාළ සේක.

”මුත්තාවෙනි, මඟ පිළිවෙළින් තිබේ. එනිසා කාමාදී යෝගයන්ගෙන් මිදෙන්න. එයින් මිඳුණ සිත් ඇත්තියක් වන්න. රාහු ග්‍රහයාගෙන් සඳ ගැලවී යන්නාක් මෙන් කෙලෙස්වලින් මිදෙන්න. මාරයාගෙන් ගැලවෙන්න. කෙලෙස් නමැති ණය දුරුකර ණයෙන් නිදහස් වී රට වැසියාගේ දනය වළඳන්න. යමෙක් කෙලෙස් දුරු නො කර සිව්පසය වළඳයි නම්, ඔහු ණයකාරයෙක් වෙනවා” යැයි අවවාද කළ සේක.

ඒ අවවාදය මත පිහිටා මුත්තා තෙරණිය නොබෝ කලෙකින් අරහත්භාවයට පත්වුණා.

දිනක් එතුමිය උදානයක් ලෙද මෙම ගාථාව වදාළා. මුදිතා ගුණයෙන් සමන්විත සත්ත්වයා සසර සයුරෙන් එතෙර කරවන්නා වූ ලෝවැසියන්ට ශ්‍රේෂ්ඨයා වූ විපස්සි බුදුරජාණන් වහන්සේ වීදියේ වඩිනු දැක, මම ඒ මාවතට පැමිණ උන්වහන්සේ ඉදිරිපිට යටිකුරු ව වැතිරුණෙමි. අනුකම්පා සහගත වූ ලෝකනාථයන් වහන්සේ මාගේ කෙසඟ පාගමින් වැඩි සේක. එයින් මා තුළ හටගත් පැහැදීම චේතනාවෙන් මම දෙව්ලොව ඉපදුනෙමි. මේ ජීවිතයේ දී සියලු කෙලෙස් දවා බුදුරජාණන් වහන්සේගේ අවවාදය ඉටු කළෙමි”.

එතුමිය පිරිනිවන් පානතෙක් ම මෙම ගාථාව නැවත නැවත වදාළා.



නයනා නිල්මිණී

Part - 2

# why should I do bhavana



Battaramulla
Siri Sudassanarama
sadaham senasuna
**Ven. Dr. Mirisse Dhammika thero**

Many people are burdened with the question "why should I do bhavana"? The following advantages of bhavana may provide the answer to this particular question.

1. If one is a busy person, one is able to find physical and mental relaxation.
2. If one is bereaved with sadness, one is able to find physical and mental relaxation and relief.
3. If one's life is confused and problems are piling up, one is able to find physical and mental relaxation, relief, energy and courage.
4. If one lacks confidence, bhavana enables one to develop self-confidence and lead a successful life.
5. If one lives under constant fear and doubt, bhavana enables one to get rid of fear and doubt.
6. If one is unable to satisfy oneself with what one has, bhavana teaches one to achieve satisfaction with what one has and value what one has.
7. If one has shattered dreams, bhavana enables one to realize the impermanent nature of things and how to achieve success through courage and determination.
8. If one is wealthy, bhavana helps one to realize the true nature of wealth and to use it for the benefit of oneself and others.
9. If one is poor, bhavana helps one to feel happy with what one has and to embark on the right path of life to achieve success.
10. If one is young, bhavana helps one to learn how to control one's mind and not get carried away by sense desires.
11. If one is an elder, one is able to spend the golden years with happiness through bhavana.
12. If one cannot control anger, bhavana teaches one to gain control of it and to get rid of jealousy while transforming one to be a person with patience, calmness and contentment.
13. If one thinks that one is controlled by the mind, bhavana will help one to gain control of the mind.
14. If one is addicted to wrongful sex, alcohol and drugs, bhavana will help one to recover from addictions and abuse.
15. If one has mental or cardiovascular illness or nightmares, bhavana helps one to get rid of those problems.
16. If one is intelligent, bhavana helps one to acquire wisdom and begins to realize by experience that the world is quite different to what one sees superficially.






## පිරිවෙනටත් බුදුසරණ

අප රටේ පුරාතන සම්භාව්‍ය අධ්‍යාපන ක්‍රමය වූ පිරිවෙන මුල්කරගෙන එහි සුවිශේෂී අනන්‍යතාව මේ යැයි විදහා දක්වමින් දිගහැරෙන "පිරිවෙන" පිටුව සතිපතා බුදුසරණ පුවත්පත තුළින් ඉදිරිපත් කෙරෙයි. ඒ අනුව ලංකාවේ 829 ක්වූ පිරිවෙන් හා සීලමාතා අධ්‍යාපන ආයතන පිළිබඳ තොරතුරු පුවත් හා පිරිවෙන් අධ්‍යාපනය හා අදාළ සුවිශේෂී ලිපි සඳහා මෙම පිටුව වෙන් කෙරෙන අතර සියලු ලිපි, තොරතුරු හා ඡායාරූප සඳහා මෙම පිටුව වෙන් කෙරේ.

**පිරිවෙන්වලට අදාළ පුවත්, ඡායාරූප සහ ලිපි අප වෙත යොමු කරන්න.**
budusarana@lakehouse.lk
**බුදුසරණ කර්තෘ මණ්ඩලය , ලේක්හවුස්, කොළඹ**

## භික්ෂූන් වහන්සේ

අත් සෙළවීම් ආදියක් නැති හෙයින් හා අතින් අනුන්ට පැහැරීම් ආදියක් නැති හෙයින් අතින් සංයත ද, පා සැලීම් ආදිය නැති හෙයින් හා පයින් අනුන්ට පැහැරීම් ආදියක් නැති හෙයින් පයින් සංයත ද,

මුසාවාදය නොකියන හෙයින් වචසින් සංයතද, හිස් සැලීම් ආදී කාය විකාරයක් නැති හෙයින් කයින් සංයත ද, සතිපට්ඨානා දී කර්මස්ථානය භාවනාවෙහි ඇලුණේ ද, උපචාර සමාධි, අර්පණා සමාධියෙන් එකඟ වූ සිත් ඇත්තේ ද, සිව් ඉරියව්වෙන් ම ඒක විහාරී ද, විදර්ශනාව පටන් ගත් තැන පටන් තමන්ගේ අධිගමයෙන් සතුටු ද, නැතහොත් සිව්පසයෙහි යථාලාභ සන්තෝෂ ආදියෙන් සතුටු ද, භින්න වූ කෙලෙස් ඇති හෙයින් ද ඒ උතුමන්ට භික්ෂුව යැයි බුද්ධා දී මහා ප්‍රාඥයෝ පවසති.



ජාතික පිරිවෙන් උපදේශක ශාස්ත්‍රපති
**දෙඩම්පහළ ශ්‍රී රාහුල හිමි**

## ප්‍රාචීන විභාග සඳහා දින නියම කෙරේ.....

ප්‍රාචීන භාෂෝපකාර සමාගම හා විභාග දෙපාර්තමේන්තුව මගින් වාර්ෂිකව පවත්වන ප්‍රාචීන ප්‍රාරම්භ, මධ්‍යම හා අවසාන විභාග 2020 ජූලි 20 වැනිදින ඇරඹීමට නියමිත ව තිබුණි. එහෙත් කොවිඩ් 19 වසංගත රෝගී තත්ත්වය යළි උත්සන්න වීම හේතුවෙන් එය දින නියමයක් නැතිව කල්දමා තිබුණි.

එම විභාග අගෝ. 24 වැනි දා ආරම්භ කිරීමට තීරණය කොට තිබේ. ඒ අනුව අගෝ. 24 වැනිදින ප්‍රාචීන මධ්‍යම හා අවසාන විභගයන් ද අගෝ. 29 ප්‍රාචීන ප්‍රාරම්භ විභාගය ද ආරම්භවන බවත්, විභාග කාල සටහන පසුව ප්‍රසිද්ධියට පත් කරන බවත්, නව විභාග අයදුම්පත්‍රයක් නිකුත් කරන බවත් ශ්‍රී ලංකා ප්‍රාචීන භාෂෝපකාර සමාගමේ ලේකම්, සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ (ප්‍රාචීන) බණ්ඩාරවෙල රතනසාර හිමියෝ පිරිවෙණට පැවසූහ.

## පිරිවෙන් මූලික ශ්‍රේණියටත් පෙළ පොතක්

මූලික පිරිවෙන්වල මූලික ශ්‍රේණිය ඉගැන්වීම සඳහා මෙතෙක් පිරිවෙන් පෙළ පොතක් නොතිබීම හේතුවෙන් එම ශ්‍රේණිවල උගන්වන ගුරුවරු ස්වකීය අභිමතය පරිදි යෝග්‍ය ඉගැන්වීමේ ක්‍රමවේදයක් මෙතෙක් අනුගමනය කළහ. එබැවින් 2021 වසරේ සිට ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත මූලික ශ්‍රේණිය විෂය නිර්දේශයක්, පෙළ පොතක් මෙන් ම ගුරු අත්පොතක් සම්පාදනය කිරීමට අධ්‍යාපන අමාත්‍යාංශයේ පිරිවෙන් ඒකකය කටයුතු සංවිධානය කොට ඇත. පිරිවෙන් අධ්‍යාපන අධ්‍යක්ෂ වටිනාපහ සෝමානන්ද හිමියන්ගේ අධීක්ෂණය පරිදි සමස්ත ලංකා හසුරුකුසලතා විෂය අධ්‍යක්ෂවරුන් වන තමාඩුවේ පුඤ්ඤනන්ද, ජූලංගැටේ චන්දිම යන හිමිවරුන්ගේ සම්බන්ධීකරණයෙන් මෙය සම්පාදනය කෙරේ.

මෙතෙක් මූලික පිරිවෙන් 01 ශ්‍රේණියේ සිට 05 ශ්‍රේණිය දක්වා සියලුම විෂයන් ආවරණය වන පරිදි සකස් කළ විෂය නිර්දේශයන් හා පෙළපොත් පැවතිණි. එසේ ම ඉකුත් වසරේ සිට මෙම සියලු වසරවල සෑම විෂයක් ම ආවරණය වන පරිදි ගුරු අත්පොත් ද සම්පාදනය කෙරිණි. ඒවා මේ වසරේ සිට ක්‍රියාත්මක කෙරිණි.

මූලික පිරිවෙන් මූලික ශ්‍රේණිය සඳහා ද මෙසේ විෂය නිර්දේශයක් හා පෙළ පොතක් සම්පාදනය කිරීම තුළින් එම ශ්‍රේණියේ අධ්‍යාපන කටයුතු ද වඩාත් විධිමත් භාවයකින් පවත්වාගෙන යාමට හැකිවන බව ජාතික පිරිවෙන් උපදේශක දෙඩම්පහළ ශ්‍රී රාහුල හිමියෝ පවසති.

## පිරිවෙන් අධ්‍යාපනයේ ස්වර්ණමය යුගය

**බැමිණිතියා සාය නිසා බුදු දහම විනාශ වේය යන බියෙන් මාතලේ අළුවිහාරයේදී ත්‍රිපිටකය ග්‍රන්ථාරූඪ කරන තුරු භාණක පරම්පරා ත්‍රිපිටකය කටපාඩමින් අවිච්ඡින්නව පවත්වාගෙන ඒමට ක්‍රියා කොට ඇත.**

### පිරිවෙන් අධ්‍යාපනයේ ආරම්භය හා විකාශය

04

බැමිණිතියා සාය නම් වූ වළගම්බා රාජ්‍ය සමයේ දෙළොස් අවුරුද්දක් තිස්සේ පැවති සාගතය හේතු කොට ගෙන ධර්මය කටපාඩමින් රැකගෙන ආ සමහර භික්ෂූන් වහන්සේ අපවත් වූහ. සමහර භික්ෂූන් වහන්සේලා විදේශ ගත වූහ.

ඒ අතර බොහෝ දුෂ්කරතා මැද සමහර භික්ෂූන් වහන්සේලා ගුරු පරපුරෙන් තමන්ට අයත් ව තිබූ දහම් කොටස් කටපාඩමින් රැකගෙන ආහ. දෙළොස් වසරකින් පසු සාගතය අවසන් වී විදේශ ගතව සිට වැඩම කළ භික්ෂූන් වහන්සේලා හා ඉතා දුක සේ ජීවිතය රැකගත් භික්ෂූන් වහන්සේලා එකතු වී ධර්මය ග්‍රන්ථාරූඪ කළ යුතු යැයි තීරණය කළහ. ඒ අනුව ථූපාරාම විහාරයේ වැඩසිටි කුන්තගත්තතිස්ස තෙරුන් වහන්සේගේ ප්‍රධානත්වයෙන් වළගම්බා රජතුමාගේ අනුග්‍රහයෙන් මාතලේ අළුවිහාරයේදී ත්‍රිපිටකය ග්‍රන්ථාරූඪ කරන ලදී.

මෙම සංගායනාව අපේ පිරිවෙන් අධ්‍යාපනය නව මගකට යොමුකළ සන්ධිස්ථානයක් ලෙස නම් කළ හැකිය. මෙතෙක් කලක් කටපාඩමින් භාණක පරම්පරා මගින් රැකගෙන ආ එම අධ්‍යාපන ක්‍රමවේදය ධර්මය ග්‍රන්ථාරූඩ කිරීමෙන් පසු ලේඛන කලාවත් සමග ගමන් කරන අධ්‍යාපන රටාවක් බවට පරිවර්තනය විය. එය ලේඛන කලාවේ ගුණාත්මක වෙනසක් වුව ද භාණක පරම්පරාවේ පරිහානියකි. ඒ තුළින් අපේ භාණක පරම්පරා අභිමිවී ගියේ ය. කටපාඩම් කිරීම වෙනුවට ලියන කියවන සමාජයක් බිහිවිය. අද පිරිවෙන් අධ්‍යාපනය ලබන භික්ෂූන් වහන්සේලා පවා කටපාඩම් කිරීමට මැලිකමක් දක්වන්නේ එහි ප්‍රතිඵලයක් නිසාවෙනි.

පිරිවෙන් අධ්‍යාපනයේ ස්වර්ණමය යුගයක් ලෙස කෝට්ටේ යුගය හඳුන්වාදිය හැකිය. මෙම යුගයේ දී අධ්‍යාපන ආයතන කිහිපයක් ම බිහි විය. එසේ ම සුවිශේෂී හැකියාවන්ගෙන් සුසැදි භික්ෂූන් වහන්සේලා කිහිප නමක් ද බිහි විය. මෙකල ග්‍රාමවාසී හා වනවාසී ලෙස පිරිවෙන් වර්ග දෙකක් විය. ඒ අතර

1. තොටගමුවේ විජයබා පිරිවෙන
2. කැරගල පද්මාවතී පිරිවෙන
3. වීදාගම ශ්‍රී ඝණානන්ද පිරිවෙන
4. දෙවුන්දර ඉරුගල්කුලතිලක පිරිවෙන
5. පැපිළියාන සුනේත්‍රා දේවී පිරිවෙන
6. එරබත්තොට ධර්මරාජ පිරිවෙන යනාදී

පිරිවෙන් කිහිපයක් ම පැවතිණ.

මෙම අධ්‍යාපන ආයතනවල භික්ෂූන් වහන්සේලා මෙන් ම ගිහි පිරිස් ද දේශීය මෙන් ම විදේශීය ශිෂ්‍යයින් ද අධ්‍යාපනය ලබා ඇත. එදා අධ්‍යාපනය කෙතරම් දියුණුව පැවැතියේ ද යන්න ලබාදුන් උපාධි මෙන් ම ලියා ඇති පොත පත විමසුමෙන් මොනවට පැහැදිලි වේ. තොටගමුවේ ශ්‍රී රාහුල හිමියන් එදා ෂට්භාෂා පරමේශ්වර උපාධිය ලබාගත්තා සේ ම තමන් ලෝකයේ ම උගතා ලෙස ප්‍රසිද්ධියේ ප්‍රකාශ කිරීමට පවා නොබිය ව ඉදිරිපත් වී ඇතිබව පෙනේ.

සව්සත කෙළ පැමිණී –
ගුරුවන්දෙරණ සැපැමිණී
පිරිසිදු සිල් ගිහිණී –
සියල් ලෝ වියතුනට සිළුමිණී

යනුවෙන් ලෝකයේ වියතුන්ට තමන් වහන්සේ සිළුමිණක් වැනි යැයි නොබියව ප්‍රකාශ කළේ තමන් සතු වූ බුද්ධි ප්‍රභාවය නිසාවෙනි. එවන් ශ්‍රේෂ්ඨ භික්ෂු පරපුරක් අදත්, හෙටත් පිරිවෙන් අධ්‍යාපනයෙන් බිහිකිරීමේ අවශ්‍යතාව දැඩිව මතු වී ඇත.

එසේම වනරතන සංඝරාජ හිමියන්ගේ ප්‍රධානත්වයෙන් පැවති වනවාසී භික්ෂූන් වහන්සේගේ අධ්‍යාපන ආයතන විය. එදා ග්‍රාමවාසී හා අරණ්‍යවාසී ලෙස බෙදී කටයුතු කිරීම සැබැවින් ම අධාර්මික, හෝ ශාසන විරෝධී ලෙස සිදු වූ බෙදීමක් නොවේ. එය ප්‍රතිපත්ති මත සිදු වූ බෙදීමකි. එමගින් ඉතා විශාල සාහිත්‍ය දියුණුවක් ඇතිවීමට ද එය පිටුබලයක් විය.


එදා භික්ෂූන් වහන්සේට "විනය" අධ්‍යයනය කිරීම අනිවාර්ය වී තිබූ බව පෙනේ. සිකවළඳ හා සිකවළඳ විනිස, සමන්තපාසාදිකාව, විනය කර්ම, විනය විභංග ආදි පොත්පත් උන්වහන්සේලාට හැදැරීමට සිදුවිමෙන් ඒ බව සනාථ වේ.

දස්කම් දැක්වූ භික්ෂූන් වහන්සේට උපාධි ප්‍රදානය කිරීම ද පැවැති තවත් විශේෂ දෙයකි. තෙවලා වදනසුරු (ත්‍රිපිටක වාගීශ්වර), ෂඩ්භාෂා පරමේශ්වර ආදී උපාධි නාමයන් මෙකල භාවිත වූ බව පෙනේ. එසේ ම ගිහියන් සඳහා වෙන් වූ තවත් විෂය ධාරවක් ද විය. ඡන්දස් අලංකාර, තර්ක ශාස්ත්‍රමය, නක්ෂත්‍ර, වෛද්‍ය ශාස්ත්‍ර වැනි විෂයන් මෙම යුගයේ දී ඔවුන්ට උගන්වා ඇත.

**කොටනෙළුවේ පුඤ්ඤදනන්ද හිමි**
**උඹරුගමුවේ අස්සජී හිමි**

# ස්වර්ණමාලි දෙවඟනගේ ඉල්ලීම

ලංකාවේ බෞද්ධ ස්තූප 06



**අනුරපුරයට ඊසාන දිගින් තුන් යොදුනක් ගිය තැන ආචාරවිටි නම් ග්‍රාමයේ නොයෙක් ප්‍රමාණයේ රන්බිජු පහළ වී තිබුණි. ඒ රන්බිජු අතර වියතක් පමණ, අඟලක් ප්‍රමාණ වූ ස්වර්ණ බීජයෝ අති විශාල බිම් කඩෙක පැතිර තිබුණි.**

ඒ සියලු ස්වර්ණ බීජයන් මහා ස්තූපය සඳහා රජතුමා විසින් වෙන්කරන ලද්දේ ය. අනුරපුරෙන් නැගෙනහිරදිශාවේ සත් යොදුනක් ගිය තැන මහවැලි ගඟෙන් එතෙර ව තඹවිටි නම් ගමෙන් මහා සෑය උදෙසා තඹ සහ යකඩ ලැබුණි. අනුරපුරයට ඊසාන දිගින් යොදුන් සතරක් ගිය තැන සමන් වැව නම් විය. එහි වැව් තෙර වැල්ලෙහි අති විශාල වූ බොහෝ මාණික්‍යයෝ උපන්නාහු ය.

අනුරපුරයෙන් දකුණු පසට අට යොදුනක් ගිය තැන අම්බට්ඨකෝල නම් ජනපදයේ එක්තරා ගල් ලෙනක මහා රිදී කඳක් පැන නැංගේ ය. අනුරපුරයේ බටහිර දෙසට පස් යොදුනක් ගිය තැන උරුවේල නම් පටුනෙහි වර්ණයෙන් මෙන් ම, ප්‍රමාණයෙන් නෙල්ලි ගෙඩි තරම් විශාල වූ මුතු ද, පබළු ද මුහුදෙන් ගොඩ ගසන ලද්දේ ය. අනුරපුරයෙන් උතුරු දිශාවට සත් යොදුනක් පිය මැන්න තැන පෙලවැව් නම් ජනපදයකි. එම වැවට වැටෙන ඇදිය කඳුරැලියක වැලි අතරේ ඇඹරුම් ගල් ප්‍රමාණයෙන් විශාල දියබෙරලිය මල් පැහැ එනම් තද නිල් පාටින් යුතු අතිසුන්දර වූ නිල් මැණික් සතරක් උපන්නේ ය. ඒ මැණික් දුටු සුනඛ වැද්දෙක් රජතුමා බැහැ දැක තමා දුටු මහා මැණික් සතර පිළිබඳ ව දැනුම් දුන්නේ ය. මේ සියලු වස්තූන් පිළිබඳ ව තොරතුරු එක්දිනක් ඇතුළත ම දැන ගන්නට ලැබුණි. ඒ තොරතුරු රැගෙන ආ සියලු දෙනාට ම දුටුගැමුණු රජතුමා ආදර ගෞරව දක්වා මැනැවින් සත්කාර කළේ ය. ඒ සියලු වස්තුව ම රුවන්වැලි මහා සෑය උදෙසා ම දේවානුභාවයෙන් පහළ වූ පූජාවන් ම ය.

මේ ලෙසින් මහා ස්තූපය කරවන්නට සියලු වස්තුව සම්පූර්ණ වූ කල,වෙසක් පුන් පොහෝ දවසේ වීසා නැකතේ දී මහා සෑයේ කටයුතු ආරම්භ කරන ලද්දේ ය. එහි දී මහා සෑ බිමෙහි පිහිටි එක්තරා රන්තෙලඹු ගසක් ඉවත් කළ යුතු වූයේ ය. එහි විමන් තනා සිටි ස්වර්ණමාලී නම් පිනැති දෙව් දුවක්, රහතන් වහන්සේලා මුණ ගැසී ඇයගේ දිව්‍ය විමානය පිහිටි රන්තෙලඹු ගස ඉවත් නො කරන ලෙස ඉල්ලා සිටියා ය. රහතන් වහන්සේලා එම දෙවඟනට මහා ස්තූපයේ ආනුභාව පිළිබඳ ව පවසා වෙන විමානයකට යන ලෙස සුදුසු රුකක් පෙන්වා දුන්හ.

ස්වර්ණමාලී දෙව්දුව රහතන් වහන්සේලාගෙන් තමා ගේ නාමයෙන් මහා සෑය බඳිනා ලෙස ඉල්ලා සිටිමින්, රහතන් වහන්සේලාගේ ආයාචනයට සතුටු වී රන් තෙලඹු ගසින්ඉවත් ව වෙනත් විමානයකට යන්නට කැමැත්ත පළ කර සිටියා ය. ඇයගේ ඉල්ලීමට සවන්දුන් රහතන් වහන්සේලා 'ස්වර්ණමාලී' යන නාමය සහිත ව මහා ස්තූපය කරවීම සුදුසු යැයි දුටුගැමුණු රජතුමාට දැනුම් දුන්නාහු ය.

මහා සෑය ස්ථාපනය කරන භූමියෙහි සත් රියනක් යටට සාරවා පස් ඉවත් කරන ලද්දේ ය. විචක්ෂණ නුවණ ඇති මහා ප්‍රඥාවන්ත වූ දුටුගැමුණු මහ රජතුමා යෝධයන් ලවා සුනු හා ගල් ගෙන්වා, ඒවා කුඩු කරවා එම භූමියෙහි ඇතිරුවේ ය. ඉන් අනතුරු ව ඝන සමින් වසන ලද පතුල් ඇති හස්තිරාජයන් ලවා මැනැවින් පාගවන ලද්දේ ය. ඒ මත ඇතිරීමට ආකාශ ගංගාව ගලා වැටෙනා කල්හි නිරන්තරයෙන් තෙත් වූ තිස් යොදුනක් භූමියක පිහිටි, සියුම් සුවඳ මැටි ඇති, නවනීත හෙවත් වෙඬරු මැටි නම් වූ සියුම් මැටි ඍද්ධිමත් රහත් සාමණේරයන් වහන්සේලා හිමාලයෙන් ගෙන වැඩි සේක. සෑය පිහිටුවන බිමෙහි ගල් අතුරා හස්තිරාජයන් ලවා තලවන ලදී.

එහි සිදුරු වැසෙන්නට නවනීත මැටි මැනවින් අතුරන ලද්දේ ය. ඒ මත දෙවියන් විසින් මවන ලද ගඩොල් අතුරන ලද්දේ ය. ඒ මත ඉතා පිරිසුදු වූ කරගල් ද, ඒ මත කුරවින්ද නම් විශේෂ පාෂාණයක් ද අතුරා ඒ මත සවිමත් යකඩ දැලක් එළන ලද්දේ ය. ඒ යකඩ දැල වැසෙන්නට බොරළු දමන ලද්දේ ය. එය ද සමකොට තලවා ඒ මත ඍද්ධිමත් රහත් සාමණේරයන් වහන්සේලා හිමාලයෙන් ගෙන එනු ලැබූ පළිගු මැණික් ගල් අතුරනු ලදහ. එහි ද සියලු සිදුරු වැසෙන්නට නවනීත මැටි අතුරන ලද්දේ ය.

ඉන් අනතුරුව රජතුමා රසදිය නම් රසායනයෙන් මිශ්‍ර කරන ලද මැලියම් තවරන ලද්දේ ය. ඒ මත අඟල් අටක් පමණ ඝනකම් වූ ලෝහ තහඩුවක් මැනැවින් අතුරන ලද්දේ ය. ඉන් අනතුරුව ඒ ලෝහ තහඩුව මත තල තෙලින් පදම් කොට ගත් රත්සිරියල් අතුරන ලද්දේ ය. ඒ මත අඟල් හතක් ඝණ වූ රිදී තහඩුවක් මැනැවින් අතුරන ලද්දේ ය. මේ ආකාරයෙන් අපගේ දුටුගැමුණු මහ රජතුමා ඉතා පහන් සිතින් යුතුව මහා සෑය පිහිටුවන ස්ථානයේ කළ යුතු මූලික කටයුතු සිදුකළ සේක.

මේ ලෙසින් ගෞතම බුදුරජාණන් වහන්සේ කෙරෙහි පිහිටි අපමණ ශ්‍රද්ධාවෙන් යුතු ව අප ගේ දුටුගැමුණු මහ රජතුමා ඒ රිදී තහඩුව මත ගොඩනැගෙන මහ සෑය පිණිස මුල් ගල් තබන පින්කමට මහා විහාරයේ බෙර හසුරුවා මහා සංඝ රත්නය රැස් කරවා මෙසේ ආරාධනා කර සිටියේ ය.

"පින්වත් ස්වාමීන් වහන්ස, අපගේ තථාගත බුදුරජාණන් වහන්සේ උදෙසා මහා සෑය කරවන්නට වූ මංගල ගඩොල හෙට උදාවන වෙසක් පුන් පොහෝ දිනයේ මම පිහිටුවන්නෙමි. ආදර බැතියෙන් යුතුව පින්වත් ස්වාමීන් වහන්සේලා සෑ බිමට වඩින සේක්වා'යි, භික්ෂු සංඝයා වහන්සේට ඇරයුම් කළේය. ඉන් අනතුරුව ලංකාවාසී සැදැහැවතුන් හට ද "පින්වත් ජනතාවනි, හෙට දිනයේ අපගේ තථාගත බුදුරජාණන් වහන්සේට පුදපූජාවන් පවත්වා පෙහෙවස් සමාදන් ව සුවඳ මල් ආදිය ගෙන මහ සෑය පිහිටුවන පුණ්‍ය භූමිය වෙත පැමිණෙත්වා" යැයි ආරාධනා කර සිටියේ ය. එලෙස ම ඇමතිවරුන්ද මහා සෑ භූමිය සැරසීමේ කටයුතු කරවන්නට කියා යෙදවීය. රජතුමාගෙන් ලැබුණු ආඥාවට අනුව, අප තථාගත බුදුරජාණන් වහ්නසේ කෙරෙහි ප්‍රිය ගෞරවාදර ඇති ඔවුහු පැමිණ නොයෙක් ආකාරයෙන් මහා සෑය පිහිටන බිම අලංකාර කළහ.

දීපා පෙරේරා

# ජීවිතය විනාශ කරන මලකඩ ගැන දන්නවා ද?





කැලණිය විශ්ව විද්‍යාලයේ වාග් විද්‍යා අධ්‍යයන අංශයේ ආචාර්ය

**කපුගොල්ලෑවේ ආනන්දකිත්ති හිමි**

**කාලය නවතින්නේ නැත. එය නොනැවතී ගෙවී යයි. උදා වූ හිරු නිශ්චිත කාලයක් තුළ අවරට ගොස් නොපෙනී යන්නේ දවස නිමා කරමිනි. ගලා බසින දිය පාරක ස්වභාවය ද එසේ ම ය. ගෙවී ගිය කාලය ද, දිවා කාලය නිමා කළ හිරු ද, ගලා ගිය දිය දහර ද කිසිවෙකුටත් නැවත ලබාගත නොහැක.**

ජීවිතය ද කාලය මෙන් ගෙවී යන, හිරු මෙන් මොහොතින් මොහොත අවරට ළං වන,දිය දහර මෙන් ක්ෂණයක් ක්ෂණයක් පාසා උත්පාද ඨිති භංග තත්වයට පත් වන ලෝක යථාර්ථය තුළ සදාකාලික නොවූ තාවකාලික ගමන් කිරීමකි. එනිසා ඒ මොහොතේ කළයුතු යම් යම් කාර්යයන් ඒ මොහොතේ ම කළ යුතු ය. එලෙස නොකරන්නේ නම් නැවත එම කාර්යයන් සම්පූර්ණ කිරීමට ඒ ගෙවී ගිය කාලය ජීවිතය අවසන් වන තුරු නැවත ලැබෙන්නේ නැත. එලෙස ජීවිතයේ අතපසු වූ වැඩ අසීමිත සංඛ්‍යාවක් ගොඩ ගැසෙන්නේ පමාව හෙවත් ප්‍රමාදය හේතුවෙනි.

බොදු පිළිවෙත තුළ ප්‍රමාදයට කිසිදු අවකාශයක් ලැබෙන්නේ නැත. එය සහමුලින් උදුරා දැමිය යුතු, ඉවත් කළ යුතු ජීවන ස්වභාවයක් බව බෞද්ධ දර්ශනයේ මොනවට විස්තරවේ. පිළිවෙළක් නැති අසාර්ථක ජීවිත තුළ තිබඳ ව ප්‍රකට වන්නේ ප්‍රමාදය යි. යමෙක් ජීවත් වුව ද ප්‍රමාදයෙන් යුක්ත නම් මිය ගිය තැනැත්තෙකු ලෙස සැලකිය යුතු බව පමාදෙ මච්චුනො යන්නෙන් සහ 'යෙ පමත්තා යථා මතා' යන බුද්ධ භාෂිතයන්ගෙන් පැහැදිලි වේ. අප ජීවත් වන සමාජයේ එලෙස සැරිසරන මෘත භාවයට පත් මිනිසුන් කොතෙකුත් හමු වීමෙන් මේ බුද්ධ භාෂිතයන්හි ඇති යථාර්ථය නැවත නැවතත් පැහැදිලි කිරීමට අවශ්‍ය නැත.

'ප්‍රමාදය' යම් තැනැත්තෙකු ජීවත් වුවත් මියගිය තැනැත්තෙක් බවට පත්කිරීමට තරම් ප්‍රබල වූයේ කවරහෙයින් ද? යන්න විමර්ශනශීලී ව, ගැඹුරින් අධ්‍යයනය කිරීම බෙහෙවින් ප්‍රයෝජනවත් වේ.

ප්‍රමාදය සියලු කාර්යයන් අතපසු වීමට හේතු වේ. පමාවීමෙන් වැඩ සංඛ්‍යාවක් ගොඩගැසී එකී කාර්යයන් කරගත නොහැකි ව දිනෙන්දින මග හැරී යයි. ඇතැම්විට එකී කාර්යයන් කිසිදා සම්පූර්ණ කළ නොහැකි ව 'අතපසු වූ වැඩ' නැමැති ගොඩට එක්වන අවස්ථා ද නැත්තේ නොවේ.

එලෙස මග හැරුණු සමහර කාර්යයන් ජීවිතය අවසන් වන තුරුත් ඇතැම්විට සම්පූර්ණ කර ගත නොහැකි ය. මේ ආකාරයට ජීවිතයේ එදිනෙදා කළ යුතු කාර්යයන් නොකෙරෙන්නට බලපාන ප්‍රධානම හේතුව ප්‍රමාදීබවයි. මිනිසා එකී ප්‍රමාදයට ගොදුරු වන්නේ 'කෝසජ්ජ' හෙවත් කුසීතකමේ අතුරු ඵලයක් ලෙසිනි.

මැලි, කම්මැළි, අලස, උදාසීන යන වචනවලින් ගම්‍ය වන්නේ ද ඉහත සඳහන් කුසීතකමයි. ශාන්ති නායක බුදුපියාණන් වහන්සේ කුසීතකම මල ධර්මයක් බව දෙසූහ. මල ධර්ම යනු මලකඩයි. මලකඩ ඇතිවන්නේ ලෝහ හෙවත් යකඩ මත ය. මල බැඳුණ යකඩය එකී මලකඩින් ම විනාශයට පත් වේ. මලකඩ යකඩ විනාශ කරන දිලීරයකි. මෙලොව ඇති අනෙක් සියලු වස්තූන් ද ඒ ඒ වස්තූන්ට අයත් මලකඩ හෙවත් දිලීර මඟින් අනුක්‍රමයෙන් විනාශ වීම සියලු වස්තූන්ට පොදු ය.

ඒ අනුව සියලු වස්තූන් විවිධ මලකඩයන්ගෙන් විනාශවන බව මොනවට පසක් වේ. යකඩයක වේවා වෙනත් වස්තුවක වේවා, විනාශයට හේතු වන්නේ එක් වර්ගයක දිලීරයක් හෙවත් මලකඩක් පමණි. එහෙත් මිනිසා විනාශ කිරීමට පාදකවන මලකඩ වර්ග හතක් ඇති බව ශාන්ති නායකයාණන් වහන්සේ පෙන්වා දී තිබේ. කෙසේවුව ද මේ ලිපියේ අරමුණ එම හත අතුරෙන් එකක් වන කුසීතකම නැමැති මලකඩ පමණක් විමසීමයි.

කුසීතකම නැමති මලකඩ අපේ ජීවිතයේ කවර අංගයක් කා විනාශ කරන්නේ ද යන්න පළ මුව වටහාගත යුතු ය. 'මලං වණ්ණස්ස කෝසජ්ජං' යන බුද්ධ භාෂිතය විමසීමෙන් එයට පිළිතුරු ලැබේ. පුද්ගලයාගේ රූපවත් බව, නිරෝගි බව, පිරිසුදු බව කම්මැලිකම නැමැති මලකඩ විසින් කා විනාශකරන බව ඉහත සඳහන් බුද්ධ භාෂිතයෙන් ප්‍රකාශ වේ. පිරිසුදුකම නිරෝගි බවට හේතු වේ.


නිරෝගි තැනැත්තාගේ සියලු අඟපසඟ මැනවින් පවතින අතර නිරෝගි පුද්ගලයා ළ ගන්නා සිරුරකින් යුත් රූපවත් තැනැත්තෙකි. ඒ අනුව පුද්ගලයාගේ සුන්දරත්වය සහ සෞඛ්‍ය සම්පන්න බව නැති වීමට කම්මැලිකම හේතුවන බව සක්සුදක් සේ පැහැදිලි ය. කම්මැලිකම පුද්ගලයා සම්පූර්ණයෙන් විනාශ කරන හලාහල විෂ හා සමාන පුද්ගලනාශක මලකඩකි. කම්මැළියා වෙලාවට අවදි නොවේ. නිදන්නේ ද නිදිය යුතු වෙලාවේ නොවේ. කම්මැලියාට තින්දට රාත්‍රිය, දවාල වශයෙන් වෙනසක් ඇත්තේ ම නැත. කම්මැලිකමෙන් නිතර නිතර නිදන තැනැත්තාගේ සෞඛ්‍ය තත්වය කෙසේදැයි තවදුරටත් පැහැදිලි කිරීමට අවශ්‍ය නොවේ.

කම්මැළියා තමාගේ පැවැත්මට අවශ්‍ය ආහාර පාන පවා නිසි වෙලාවට පිළිවෙළකට ගන්නේ නැත. ඇඳුම් පැළඳුම් ද සෝදන්නට පිරිසුදු කරගන්නට ඔහුට වෙලාවක් නැත. සතියකට දින කීපයක් පමණක් දත කට මැදීම, නා පිරිසුදු වීම ඔහුගේ දින චරියාවයි. දිනපතා දත කට මැද නා පිරිසුදුවීමක් කම්මැළියාට ඇත්තේ ම නැත. අපිරිසුදු, දුගඳ හමන ඇඳුම් නොසේදීම නිසා කම්මැළියා අප්‍රිය අප්‍රසන්න තැනැත්තෙක් වෙනවා පමණක් නොව විවිධ චර්ම රෝග ආදී ලෙඩ රෝගවලින් පීඩා විඳින්නෙක් බවට ද පත්වේ.

කම්මැලිකම නැමැති මලකඩ පුද්ගලයාගේ රූපවත් බව සහ ශරීර සෞඛ්‍යය කා විනාශ කරන්නේ ඒ ආකාරයෙනි. නිසි වෙලාවට අවදි නොවන, ආහාර පාන නොගන්න, දත කට මැද නා පිරිසුදු නොවන කම්මැළියා යම් බෝවන රෝගයක් වේ නම් ක්ෂණයෙන් ඊට ගොදුරු වේ. එපමණක් නොව ශරීර පැවැත්මට අවශ්‍ය නිසි ව්‍යායාම කරන්නට කම්මැළියාට කොහෙත්ම වෙලාවක් නැත. එනිසා ඔහු දියවැඩියාව, හෘදයාබාධ, රුධිර පීඩනය ආදි බෝ නොවන රෝග රැසකට නිතැතින් ගොදුරු වන්නෙකි. වර්තමානයේ මෙරට බෝ නොවන රෝගීන් සංඛ්‍යාව ඉතා ඉහළ මට්ටමක පවතින්නේ කම්මැලිකම නැමැති මලකඩය හේතුවෙනි.

කම්මැලිකමෙන් යුත් ගෘහණියක් තම ස්වාමි පුරුෂයාට සහ ආදරණීය දරුවන්ට මෙරට ඇති පෝෂ්‍යදායී ආහාර වෙහෙස මහන්සිවී උයාපිහා දෙනවා වෙනුවට චූන් පාන් ආදී ක්ෂණික ආහාර ලබා දෙන්නේ කම්මැලිකම නැමැති මලකඩ නිසා ය. මෙරට අනාගතය බාර ගන්නා දරුවන් නිතැතින් ලෙඩ රෝගවලින් යුත් පිරිසක් වීමට එකී මලකඩය හේතුවන බව මොනවට පසක්වේ. කම්මැලිකම ඇතැමෙකුට හුදු සරල දෙයක් ලෙස පෙනුණ ද එය පින්වත් ඔබේ සිරුරේ නිරෝගි රූපවත් බවත්, පිරිසුදු ප්‍රසන්න බවත් නිතැතින් ඇත් කරයි. එපමණකින් නොනවතින කම්මැලිකම නැමැති මේ මලකඩ, එදිනෙදා පින්වත් ඔබ කළ යුතු කාර්යයන් නොකිරීමට පොළඹන අතර අන්‍යයන්ට පමණක් නොව ඔබට ම, ඔබ ප්‍රයෝජනයක් නැති, ප්‍රමාදී, අසාර්ථක හිස් පුද්ගලයෙක්වීම කිසිසේත් වැළැක්විය නොහැකි ය.

# නිවනට උපකාරවන දිවි පෙවෙත



අනුරාධපුර ලංකාරාමාධිකාරී උතුරු මධ්‍යම දිශාවේ ප්‍රධාන අධිකරණ සංඝ නායක

**රැළපනාවේ ධම්මජෝති නා හිමි**

**බුදුන් වහන්සේ තරම් ජන ජීවිතය යථාර්ථයෙන් දුටු තවත් ශාස්තෘන් වහන්සේලා නැත. උන්වහන්සේ නිරන්තරයෙන් ම ජන ජීවිතය අධ්‍යයනය කරමින්, එහි යහ පැවැත්ම සහ අපචාරී පැවැත්ම ප්‍රත්‍යක්ෂ ලෙස ම දැක ඒවා පිළිබඳ ව ධර්ම දේශනා පවත්වමින්, ජන සමාජය සුමගට පත් කිරීමට ඇප කැප වූ සේක. සම්බුද්ධ ශ්‍රාවකයන් හැටියට, මහා සංඝ රත්නය අදත් බුදු බණ අනුව යමින් මානව සමාජය සුගතියට පත් කිරීමට බුදු බණ ජනතාවට පැහැදිලි කර දෙති.**

දානය, ශීලය, පරිත්‍යාගය, ඍජු බව, මෘදු බව, තාපස ගුණය, අක්‍රෝධය, අවිහිංසාව, ඉවසීම, විරෝධතා කල්ප නොවීම යන කරුණු දසරාජ ධර්මය ලෙස නම්කර ඇත්තේ විශේෂයෙන් රටේ පාලකයන් වන රජවරුන් මේ දස ගුණය අනුගමනය කළ යුතු බැවිනි. එසේ වුව ද මෙම දස ගුණයන් රජවරුන්ට පමණක් සීමා වන්නේ නැත. විශේෂයෙන් ආයතන පාලකයන් තුළ සේවක පලකයන් තුළ මෙන් ම, පොදුවේ ජනතාව තුළ මෙම දස ගුණය පවතින්නේ නම්, මහජන සේවාවන් මොන තරම් ආකර්ශණීය වන්නේ ද? මේ ගුණ දහම් ජන සමාජය තුළ සජීවී ව පවතින්නේ නම් සැබැවින් ම වෘත්තීය අරගල, සේවක ගැටුම්, රටවැසි ගැටුම් ඇති වන්නේ නැත.

දස රාජ ධර්මය සේ ම රාජ්‍ය පාලනයට මෙන්ම ජන ජීවිතයේ පැවැත්මට යහපත් වන සතර සංග්‍රහ වස්තු බුදුන් වහන්සේ විසින් දේශනා කර ඇත. ඒවා මෙසේ ය. "දානය, ප්‍රිය වචන, අත්තචරියා හා සමානත්තතා" මේ සම්බුදු වදනයි. ත්‍රිපිටකයෙහි අංගුත්තර නිකායේ චතුක්ක නිපාතයට අයත්, "සංගහ වත්ථු" සූත්‍රය දේශනා කළ බුදුන් වහන්සේ මෙම සතර ගුණයෙන් පොදු ජනතාවට සංග්‍රහ කරන විට නැණවත් අය උසස් බවට ද, සම්මානයට ද, ලෝක ජනයාගේ ප්‍රසාදයට ද පත්වන බව දේශනා කළ සේක. මේ වස්තු හතරෙන් මිත්‍රයන්ට සැලකීමෙන් ජනප්‍රියත්වයට පත්වන බව සිඟාලෝවාද සූත්‍රයෙන් පෙන්වා දී තිබේ. දීඝ නිකායේ 'ලක්ඛණ' සූත්‍රයේ දී මේ සතර සංග්‍රහ වස්තුවෙන් ලෝකයාට සංග්‍රහ කළ අය මරණින් මතු සුගතියට පත්වන බව බුදුන් වහන්සේ දේශනා කර ඇත. මේ ගුණ ධර්මවලට අනුගත වෙමින් ජීවත් වන අය මරණින් මතු මිනිසත් බවක් ලැබූ විට මහා පුරුෂ ලක්ෂණ දෙකක් ලබන බව උන්වහන්සේ විස්තර කර තිබේ.

'සතර සංග්‍රහ වස්තුවල දී පළමු කාරණය දානයයි. දෙවන කාරණය වන ප්‍රිය වචනය යන්නෙන් අදහස් කරන්නේ අනුන්ගේ සිත් සතුටුවන ආකාරයට ප්‍රිය වචන කතා කිරීම ය. සැඩ පරුෂ, අසභ්‍ය, අප්‍රිය, ක්‍රෝධ වචන අසන්නට කිසිවෙකු කැමති නැත.

හැම විටම, හැම තැනක දී ම, හැම දෙනාට ම ප්‍රිය වචනයෙන්, මටසිළිටි වචනයෙන්, සුහදශීලී වචනයෙන් කතා කරන්නේ නම්, හෙතෙම සමාජය තුළ ඉක්මනින් ගරු බුහුමනට පත්වන තැනැත්තෙකු බවට පත්වේ. තමන් සමාජයෙන් ගරු බුහුමන් ලබන්නට නම්, ඊට පෙර අනුන්ට ගරු බුහුමන් දැක්විය යුතු යැයි බුදු බණෙහි විස්තර වේ.

"අර්ථචරියා" යනු ලෝකයාගේ යහපැවැත්ම සඳහා හොඳ නරක, ගුණ දෙස් කියාදීමයි. අපචාරී ගති පැවැතුම්වලින් වැළකී මිනිස්කමට ගැළපෙන යහපත් ගුණ දහම්වලින් ජීවිතය ගොඩනගා ගැනීමට ලෝකයාට කියා දීම 'අත්ථචරියා' ලෙස විස්තර වේ. සංඝ රත්නයෙන්, ගුරුන්ගෙන්, දෙගුරුන්ගෙන් මෙම සාමාජීය මෙහෙවර සමාජයට ඉටුවිය යුතු ය. එසේ කියා දෙන ගුරුහරුකම් අඳබාල ලෝකයා විසින් පිළිගෙන ඒ අනුව සිය දිවි පෙවෙත හසුරුවා ගත යුතු ය.

"සමානත්තතා" යනුවෙන් අර්ථවත් කෙරෙන්නේ තමා මෙන් ම, සෙසු අය ද දුකට කරදරවලට, විපත්වලට අකැමැති බව ය. එසේම තමා මෙන්ම සෙසු අය ද සැපතට, නම්බුවට, කීර්තියට, ගෞරවයට කැමති බව ය. මේ අනුව තමන් තත්ත්වයෙහිලා සෙසු අය පිළිබඳව ද සම ගුණයෙන්, යහපත් කල් ක්‍රියාවෙන් කටයුතු කිරීම මෙහි අදහස වේ. තමා දුකට, දඬුවමට, විපතට කැමති නැතිනම් සෙසු අය ද කැමති නැත. තමා සැපතට කැමති නම් සෙසු අය ද සැපතට කැමති ය.

මේ යථාර්ථය තේරුම් ගෙන ඒ අනුව සිය දිවි පෙවෙත හසුරුවා ගන්නේ නම්, එම දිවි පෙවෙත බුදු දහමට අනුගත සේ ම නිවනට ද උපකාර වේ.



# දීපංකර බුදුරජාණන් වහන්සේ පිටදුන් පළොල් බෝධිය



**ත්‍රිපිටකයෙහි දීඝ නිකායේ බුද්ධ වංශයෙහි බුදුරජාණන් වහන්සේලා පිළිබඳ ව තොරතුරු සඳහන් ව ඇති බවට ඉහත ලිපි මාලාවෙහි අන්තර්ගත විය. විපස්සී බුදුරජාණන් වහන්සේ, සිඛී බුදුරජාණන් වහන්සේ, වෙස්සභූ බුදුරජාණන් වහන්සේ, කකුසඳ බුදුරජාණන් වහන්සේ, කෝණාගමන බුදුරජාණන් වහන්සේ, කස්සප බුදුරජාණන් වහන්සේ හා ගෝතම බුදුරජාණන් වහන්සේ යන තථාගතයන් වහන්සේලා පිළිබඳ දීඝ නිකායේ මහාපදාන සූත්‍රයේ විස්තර වේ.**

බුදුරජාණන් වහන්සේලා සත් නමක් හා බුදුරජාණන් වහන්සේලා 18 නමක් වශයෙන් පස්විසි බුදුරජාණන් වහන්සේලා පිළිබඳව බුද්ධවංශ පාලියේ විස්තර සඳහන් ය.

එම තථාගතයන් වහන්සේලාට පෙර වැඩ විසූ බුදුරජාණන් වහන්සේලා තෙනමක් පිළිබඳව බුද්ධවංශ පාලියේ බුද්ධ ප්‍රකීර්ණක භාණ්ඩයෙහි සඳහන්වේ.

එනම්, තණ්හංකර බුදුරජාණන් වහන්සේ, මේධංකර බුදුරජාණන් වහන්සේ සහ සරණංකර බුදුරජාණන් වහන්සේ යනුවෙන් වැඩ සිටි බව ය. එම බුදුරජාණන් වහන්සේලා තුන් නම පිළිබඳ පහත සඳහන් ගාථාවෙන් තවදුරටත් පැහැදිලි වේ.

**අපරිමෙය්‍යෙ ඉතො කප්පේ චතුරෝ**
**ආසුං විනායකෝ**
**තණ්හංකෙරෝ මේධංකරෝ අථොපි**
**සරණංකරෝ**
**දීපංකරෝච සම්බුද්ධෝ ඒකක ප්පම්හි තෙ**
**ජිනා**

යනුවෙන් බුද්ධ වංශ පාලියෙහි 240වන පිටුවෙහි සඳහන් ය. ඉහත සඳහන් කළ තණ්හංකර, මේධංකර, සරණංකර යන තථාගතයන් වහන්සේලා තෙනම පිළිබඳ විස්තර ත්‍රිපිටකයෙහි ඇතුළත් නොවන අතර, ඒ පිළිබඳව නාම මාත්‍ර වශයෙන් සඳහන්ව ඇත. සතර බණ වර හෙවත් පිරිත් පොතේ උප ග්‍රන්ථයෙහි

**තණ්හංකරෝ මහා වීරෝ – මේධංකරෝ මහායසෝ**
**සරණංකරෝ ලෝකහිතො දීපංකරෝ ජුතින්ධරෝ**

ආදී වශයෙන් අටවිසි පිරිත නමින් විශේෂ පිරිතක් ඇතුළත් වේ. එම අටවිසි පිරිත සතර බණවරයට අයත් නොවේ. සතර බණ වරයට අයත් නොවන එම අටවිසි පිරිත පිරිත් පොතේ උප ග්‍රන්ථයෙහි සඳහන් වේ. එය දඹදෙණි යුගයෙන් පසු රචනා වූවක් බවත්, එම අටවිසි පිරිත

## අටවිසි බෝධි පුරාණය 05

දඹදෙණි යුගයෙන් පසුව පිරිත් පොතට එකතු වූ බවත් ඇතැම් පඬිවරුන්ගේ අදහස ය.

එම අටවිසි පිරිත හේතුකොටගෙන අටවිසි බුදුරජාණන් වහන්සේලා බෞද්ධ ජන සමාජයේ ප්‍රචලිත විය. අප බුදුරජාණන් වහන්සේලා පිටදුන් බෝධීන් පිළිබඳව තොරතුරු නාම මාත්‍රයෙන් මෙසේ සඳහන් වේ.

**නන්දා චෙව සුනන්දා ච අහෙසුං අග්ගසාවිකා**
**බෝධි තස්ස භගවතෝ පිප්ඵලීති පවුච්චති**

ඒ භාග්‍යවතුන් වහන්සේගේ බෝධිය පළොල් යැයි කියනු ලැබේ යැයි ඉහත බුද්ධ වංශයෙහි සඳහන් ගාථාවෙන් ප්‍රකට වේ. දඹදෙණි යුගයේ ධර්මසේන හිමියන් විසින් රචනා කරන ලද සද්ධර්මරත්නාවලියෙහි සූවිසි විවරණයේ දීපංකර බුදුරජාණන් වහන්සේ දිවකුරු බුදුන් වශයෙන් සිංහලට බිඳගෙන ඇත. දිවකුරු බුදුරජාණන් වහන්සේ යනුවෙන් සිංහලට බිඳගත් වචනය දීපංකර බුදුරජාණන් වහන්සේ ව හඳුන්වන බව තවදුරටත් මෙහිදී සඳහන් කළ යුතුව ඇත. එසේම පිප්ඵලී යන පාලි නාමය පළොල් යනුවෙන් බුද්ධ ජයන්ති ත්‍රිපිටක පරිවර්තනයෙහි සඳහන් ය. එහෙත් සද්ධර්මරත්නාවලියෙහි එය පුලිල යනුවෙන් සඳහන් කොට ඇත.

**හේමමාලා රන්දුනු**

# කාමයෝ සර්ප හිසක් බඳු වෙති

විසකුරු සර්පයෙකුගේ හිසක් පැගුණහොත් එමගින් විෂ ශරීරගත ව මහත් දුකක් ඇතිවිය හැකි ය. ඇතැම් විට මරණය ද එමගින් සිදු වේ. එසේම සත්වයන් ඇලුම් කරන කාමයන් ද සර්ප හිසක් මෙන් අනතුරුදායක වේ. දැකීම්, ඇසීම්, සිප වැළඳ ගැනීම්, රස විඳීම් ආදියෙන් ලබන කම් සුවය චිත්ත පීඩාවන් ගණනාවකට මුලපුරයි. ඔවුනොවුන් මරාගන්නා තාක්ම කාමවිෂ පිරි සිතක් වියරු වේ. ද්වේෂය කෝපය පළිගැනීම ඇති වන්නේ කාමයන්ගෙන් බව දත් බුදුරජාණෝ, සර්ප හිසක් බඳු කාමයන් දුරුකොට දැමීමට අනුශාසනා කළහ.

සියලු කාම වස්තූන් අනිත්‍ය වශයෙන් මෙනෙහි කිරීම කාම උමතුවෙන් බේරීමේ උපායකි. දුක් වශයෙන් බැලීම ද තම වසඟයෙහි පැවැත්විය නොහැක්කක් ලෙස බැලීම ද නිසා කාමයන් නිසා යම් ආයාසයක් වේ නම් එය ප්‍රහාණය වනු ඇත. බොහෝ ආදීනවයන්ට දුක් විපත්වලට මරණින් මතු නිරයට හේතුවන බව මෙනෙහි කිරීම ද කාමාග්නියෙන් බේරීමට හේතුවන බව බුදුරජාණන් වහන්සේ පෙන්වා වදාළහ. තම ශරීරය දෙස අශුභ වශයෙන් බැලීමෙන් ද කාම දැවිල්ල සංසිඳෙන බව ප්‍රත්‍යක්ෂ කරුණකි.

සත්ත්ව පුද්ගල ප්‍රඥප්තියෙහි පිහිටා ලෝකය දෙස බලන වාරයක් පාසා නූපන් රාගය, කාමය ඇති වේ. රූපාදී ස්කන්ධ සමූහයක් ලෙස හෝ හේතූන් නිසා හට ගත් ඵල ධර්ම සමූහයක් ලෙස තම ජීවිතයත්, බාහිර සංස්කාරයනුත් දෙස බැලිය හැකි නම් එමගින් ඔහුට යථාභූත ඤාණ දර්ශනය කරා යා හැකි ය.

මෝහය නිසා චතුරාර්ය සත්‍යය වැසී ඇති බව වදාළ බුදුරජාණන් වහන්සේ, මොහඳුර සිඳ බිඳ ඤාණාලෝක ධාරා උපදවන අමා ධර්මය බ්‍රහ්මස්වර මිහිරෙන් මුසුකොට වදාළේ අපමණ කරුණාවකිනි. මිනිස් කාමයන් ඉක්මවා දිව්‍යමය කාමයන් පවා පා මුලට කැන්දා දෙන මාණික්‍ය. රත්නය බුදුරජාණන් වහන්සේම ය. බුදුසරණ ලබා එහි අයිතිය ඔබට ද ලබාගත හැකි ය. එවිට ඔබ ලොව ඇති තාක් සැපයන්ට හිමිකරුවෙක් වන අතර ලෝකෝත්තර නිවන් සුවය ද නොබෝ කලකින් ලබනු ඇත. ඒ උදෙසා කාමයන් හි නපුර ඔබට වැටහේවා! කාමච්ඡන්දය ප්‍රහාණය කොට දුගතියෙන් අත මිදෙත්වා! චතුරාර්ය සත්‍යය අවබෝධ වේවා!



බෙලිහුල්ඔය සීලසමාහිත
යෝගාශ්‍රමවාසී
ත්‍රිපිටකාචාර්ය, ත්‍රිපිටක විශාරද
අභිධර්මය පිළිබඳ කථිකාචාර්ය
ශාස්ත්‍රපති, රාජකීය පණ්ඩිත
**බලංගොඩ රාධ හිමි**

# දළදා වහන්සේ වැඩසිටි රාජධානි සහ පුදබිම්

**මෙම ලිපියේ මුල් කොටස නිකිණි පුර පසළොස්වක (04) පත්‍රයේ පළවිය.**

දඹදෙණියේ රජ කළ දෙවැනි පරාක්‍රමබාහු රජු තම පුත් බුවනෙකබාහුට යාපහුව භාරදුන් අතර ඔහු එය ඉතා ශක්තිමත් බලකොටුවක් බවට පත් කළේ ය. රාජධානිය වටා බැඳි තාප්ප දිය අගල් ආදියෙහි නටබුන් අදත් දක්නට ලැබේ. දළදා මාළිගයට පිවිසෙන පඩිපෙළ හා දෙරටු අලංකාර නිර්මාණයකි. එහි දෙරටු උළුවහු, ගල්කණු විශාල කේශර සිංහරූප , ගජසිංහ රූප, හස්තිරූප හා මකර තොරණ ද ඒ මැද නෙලා ඇති හිඳි බුදු පිළිමය ද මේ යුගයේ කැටයම් කලාවේ ස්වරූපය පෙන්වයි.දළදා මාළිගාවේ මකර තොරණ යට ගලින් නෙළා ඇති බුදු පිළිමය ගැන සඳහන් කරන මහාචාර්ය එච්.ටී.බස්නායක මහතා බුදුපිළිමයේ නිර්මාණාත්මක භාවය ගැන සඳහන් කරයි. යාපහුවේ දළදා මාළිගයට නැගෙන පඩිපෙළ දෙපස දැක්වෙන කැටයම් විශේෂ අවධානයට යොමුවිය යුතු ය.

## කුරුණෑගල රාජධානිය

කුරුණෑගල රාජධානි කාලයේ කලා ශිල්ප නිර්මාණ හතරවන පරාක්‍රමබාහු රජ කාලයේදී සංස්කෘතික දියුණුවක් පැවැති බව එකල රචිත ග්‍රන්ථවල සඳහන් වේ. මේ රජුගේ අනුග්‍රහයෙන් ආගමික ගොඩනැගිලි ගණනාවක් ඉදිවිය. කුරුණෑගල නගරය වටා සාදන ලද පවුරෙහි නටබුන් තැනින් තැන හමුවෙයි. මෙකල ලියන ලද දළදා සිරිතෙහි සඳහන් වන පරිදි රාජමාළිගය හා දළදා මාළිගය උසස් ගණයට අයත් කලාත්මක වටිනාකමින් යුතු ගොඩනැගිලි විය. ඉන් මෙකල දක්නට ලැබෙන්නේ අඩිතාලමක් හා ටැම් කීපයක් ඇති ගොඩනැගිල්ල පමණි.

## ජයවර්ධනපුර කෝට්ටේ රාජධානි සමය

කෝට්ටේ ශ්‍රී ජයවර්ධනපුර රජ මාළිගය අසලම දළදා මාර්ගය ද තිබුණු බව සැළලිහිණි සන්දේශය ලියූ තොටගමුවේ ශ්‍රී රාහුල හිමියෝ මෙසේ සඳහන් කරති.

ලොව විහිද සුදු පැහැසඳ රැසෙව් සැදී
දෙන නොමදා සිරිසග මොක් සැප නිසැදී
ලද මුනිඳු දම් කඳ පහස මන බැදී
වඳු දළදා හිමි තෙමහල් පහය රැදී
(සැළලිහිණි සන්දේශය)

කෝට්ටේ රජ මාළිගය පිහිටියේ දළදා මාළිගයේ අසල ම ය. මේ කාලයේ දී කෝට්ටේ මාළිගාවත්ත නමින් හැඳින්වෙන ස්ථානයේ පිහිටි බැව් පුරාවිද්‍යා චක්‍රවර්ති රණසිංහ මහතා සඳහන් කරයි. තොටගමුවේ ශ්‍රී රාහුල සංඝරාජ හිමියන්ගේ ආරාමය තිබුණේ ද මේ අසල ම ය. එයින් අද ඉතිරිවී ඇත්තේ ගල්කණු දෙකක් පමණි.

එය අද පැරකුම්බා පිරිවෙනෙහි දෙරටුව දෙපස පිහිටුවා ඇත. ඒ කාලයේදී මෙහි දියවඩන නිලමේ ලෙසින් සිටියේ හිරිපිටියේ රාළ ය. ඔහු දුටු සිහිනයක් පිළිබඳ (දළදා වහන්සේ ගැන) මෙසේ ය. නිල්පාට ඇඳුමකින් සැරසුණු පුරුෂයෙකු ඔහුගේ දකුණු අතේ තිබුණු කඩුව නැගෙනහිර පැත්තට දිගුකර "කෝට්ටේ කලාලේ කිසිල්ලේ දත මැදගත් රාළේ" කියා නොපෙනී ගියේ ය. සුනේත්‍රාදේවි පිරිවෙනෙහි වැඩ සිටි නාගසේන හිමියන්ට මේ බව පැවසූ හිරිපිටියේ රාළට එම සිහිනය තෝරා දුන්නේ මෙසේය. "කිසිල්ලේ කසළට ගියේ දත මැදගත් රාළේ. දන්ත ධාතුව රට මැදට ගන්න රාළේ යනුවෙනි. මෙය තෝරාදුන් අවස්ථාවේ දී හිරිපිටියේ රාළ සිනාසී එසේ නම් මා සිහිනය තෝරාගත් සැටි නිවැරැදියි කියා තම බඩතුරේ සඟවා ගෙන සිටි කුඩා කරඬුව අතට ගෙන විවෘත කොට එහි මද්‍යයෙහි ස්වර්ණමය නෙළුම් මල මත සවිකර තිබූ ධවලකාන්ති විහිඳුවන සිරි දළදා වහන්සේ ඒ ස්වාමීන් වහන්සේට පෙන්වා ඇත. එදිනම රහසිගත ව ශ්‍රී දළදා වහන්සේ සීතාවක රජු වන මායාදුන්නේ රජුගේ ආරක්ෂාවට පත්විණි. කෝට්ටේ ශ්‍රී ජයවර්ධනපුර දළදා මාළිගය පිළිබඳ සැළලිහිණි සන්දේශය පමණක් නොව හංස, ගිරා හා පරෙවි යන සන්දේශ කාව්‍යවල ද සඳහන් වේ. අද කෝට්ටේ එම නටබුන් විනාශයට පත්වී ඇත්තේ ඒ කාලයේ පෘතුගීසින්ගේ ආක්‍රමණ නිසා ය. ඉහතින් සඳහන් කළ සීතාවක මායාදුන්නේ රජු දළදා වහන්සේ සුරක්ෂිත ව දෙල්ගමුවේ රජ මහා විහාරයේ කුරහන් ගලක් යට සඟවා ආරක්ෂා කළ බව සඳහන් වේ. (DALADA MALIGAWA THE TEMPLE OF THE SECRED TOOTH RELIC IN KANDY -SRI LANKA prof-ANURADHA SENEVIRATNA p 23-24-1990)

> "කෝට්ටේ ශ්‍රී ජයවර්ධනපුර දළදා මාළිගය පිළිබඳ සැළලිහිණි සන්දේශය පමණක් නොව හංස, ගිරා හා පරෙවි යන සන්දේශ කාව්‍යවල ද සඳහන් වේ. අද කෝට්ටේ එම නටබුන් විනාශයට පත්වී ඇත්තේ ඒ කාලයේ පෘතුගීසින්ගේ ආක්‍රමණ නිසා ය."

## සෙංකඩගල රාජධානියේ දළදා මාළිගය

පෘතුගීසින්ගේ ආධාර ඇතිව මහනුවර දේශපාලන බලය යමසිංහ බණ්ඩාර දොන් පිලිප් නමින් බලයට පත් වූයේ ය. දන්තුරේ සිදුවූ සටනින් පෘතුගීසින් පරාජය කර යමසිංහ බණ්ඩාර පරාද කර කොණප්පු බණ්ඩාර බලයට පත්වූයේ ය. ඔහු පළමුවන විමලධර්ම නමින් 1593 දී සෙංකඩගල රජ වූයේ ය. ඔහු මෙතෙක් දෙල්ගමුව රජමහ විහාරයේ ආරක්ෂාව සහිතව වැඩසිටි දළදා වහන්සේ සෙංකඩගල පුරයට වැඩම කළේ දැනට ඇති දෙමහල් දළදා මාළිගාව නිර්මාණය කිරීමෙනි. මේ අසලම රජ මාළිගය ද පිහිටියේ ය. දළදා මාළිගාව ඉදිරිපිට පිහිටි පත්තිරිප්පුව නිර්මාණය කරන ලද්දේ ශ්‍රී වික්‍රම රාජසිංහ රජුගේ අනුග්‍රහයෙනි.
විමලධර්මසූරිය රජුගේ රජකම තහවුරු කර ගැනීමට ද දළදා වහන්සේ වැඩමවා දළදා මාළිගයක් සෑදීම බලපෑවේ ය. කන්ද උඩරට පැවැත්වූ ප්‍රථම දළදා පෙරහර ද ඒ රජුගේ අනුග්‍රහයෙන් පැවැත්වුණි. මේ රජු ආරක්ෂක දෙවිදේවතාවුන් ලෙසින් පිළිගැනුණු නාථ, විෂ්ණු, කතරගම හා පත්තිනි දෙවිවරුන් උදෙසා ද ඇසළ පෙරහර ආරම්භ කරන ලදී. එදා සෙංකඩගල රාජධානියෙහි පැවැති ඇසළ පෙරහර දළදා වහන්සේට පුජෝපහාර සඳහා ම විශේෂ දළදා පෙරහරක් ලෙස පැවැත්වීමට වැලිවිට ශ්‍රී සරණංකර සංඝරාජහිමියෝ අනුශාසනා කළහ.



පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ
හිටපු සහකාර පුරාවිද්‍යා
අධ්‍යක්ෂ
**සිරිසමන් විජේතුංග**
පුරාවිද්‍යා Msc පර්යේෂණ

# සතියට මුල් තැන දෙන වස්සානය

**මෙම ලිපියේ මුල් කොටස නිකිණි පුර පසළොස්වක (04) පත්‍රයේ පළවිය.**

මේ අතර ඇතැම් උපසම්පන්න භික්ෂූන් වහන්සේ නමකට වෙනත් කිසියම් බාහිර බාධකයක් නිසා සෙනසුනක් සපයා ගැනීමේ අපහසුතාවක් වැනි කරුණකදී පෙරවස් එළඹීමට අපොහොසත් වුවහොත් උන්වහන්සේට පසුවස් එළඹීමේ හැකියාව පවතිනවා. එසේ වූ භික්ෂුව නිකිණි මස(අගොස්තු) පුරපසළොස්වක දා පොහොය කර්ම සිදු කොට පසුදින අවපෑලවියදින වස් විසිය යුතුය එම භික්ෂුව එතැන් සිට ඉල්මස(නොවැම්බර්) පුරපසළොස්වකදින පසුවස් පවාරණය සිදු කළ යුතු වෙනවා. එහෙම වුණත් එවැනි භික්ෂූන් වහන්සේට කඨින චීවරයක් ලබා ගැනීමේ අයිතිය අහිමි වෙනවා. එයට හේතුව වන්නේ චීවර මාසය(ඔක්තෝබර්) වප් පුරසළොස්වකදිනෙන් ආරම්භ වී ඉල්පුර පසළොස්වක (නොවැම්බර)දිනෙන් අවසන් වන නිසා යි.

මාසයට පුර පොහොයදිනය බැගින් පොහොයදින 12ක් වෙනවා. සමහර වර්ෂවල එක මාසයකට පොහෝදින 2ක් යෙදී වර්ෂයට පොහොයදින 13 වන විට මේ වස් විසීමේ කාල වකවානු සංඝ සම්මතයේ ප්‍රකාශයට පත්වෙන අවස්ථා යෙදෙනවා. 2020 වර්ෂයේ ඔක්තෝබර් මාසයේ පුර පොහෝදින දෙකක් යෙදී තිබෙනවා. මේ නිසා වප් පොහොය දෙකක් වෙනවා. මේ අනුව එය අධිවප් පෝය හා වප් පෝය වශයෙන්දින දර්ශනවල සටහන් වී තිබෙනවා. ඉතින් එය අධිමාසපතනයක් වන නිසා මෙවර වස්විසීම ආරම්භ වන්නේ ඇසළ පොහෝදින පොහොය කර පසුදින නොව නිකිණි පොහොයදින පොහොය කර පසුදින සිට යි. එනම් ව්‍යවහාර ක්‍රමයට අගෝස්තු මස 4 වැනි දා පෙරවස් විසීම ආරම්භ වී ඔක්තෝබර් මස 30 වැනි දා හෙවත් වප් පුරපසළොස්වක් දා පෙරවස් පවාරණයෙන් පෙරවස් කාලය අවසාන වී එතැන් සිට නොවැම්බර් මස 29 වැනිදාට යෙදෙන ඉල්පුර පසළොස්වක දා දක්වා චීවර මාසය වෙනවා. මේ කාලය කඨින පින්කම් සිදු කෙරෙන මාසය බවට පත් වනවා. මේ ක්‍රමයෙන් ම පසුවස් කාලය ආරම්භ වන්නේ බිනර පුර පසළොස්වකදිනය යෙදී ඇති සැප්තැම්බර් මස 01 දා පොහොය කොට පසුදින හෙවත් අවපෑලවියදින සිට යි. උඳුවප් පුර පසළොස්වකදින යෙදී ඇති දෙසැම්බර් මස 29 වැනි බදාදා දක්වා පසුවස් කාලය යි. එදින පෙරවස් පවාරණය සිදු කළ යුතු වෙනවා.

බුදුරජාණන් වහන්සේ භික්ෂූන් වහන්සේට බුද්ධත්වයෙන් වසර විස්සක් ගිය තැන මෙම වස් විසීමේ විනය නීතිය අනුදැන වදාරා තිබීමෙන් පසුව අද දක්වාත් මෙම නියමයන්ට අනුව භික්ෂූන් වහන්සේගේ වස් විසීම හා වස් පවාරණය සිදු වෙනවා.

මෙහිදී තවත් ඉතා වැදගත් කරුණක් තිබෙනවා. එනම් ගිහි ජනතාව මෙම වස් කාලය තුළ භික්ෂූන් වහන්සේට සෙනසුන් පිළියෙළ කොට වස් ආරාධනා කළ පසු එම ආරාධනාව පිළිගන්නා භික්ෂූන් වහන්සේට සිවුපසයෙන් උපස්ථාන කරමින් වෙනත් කාර්යයන්ට වඩා වෙහෙර විහාරස්ථාන ඇසුරු කරමින් ආගමික කටයුතුවලට වඩ වඩාත් පෙළඹෙමින් පින් සිදු කරගන්නා කාලයක් බවට පත් කර ගන්නවා. නමුත් බුදුරජාණන් වහන්සේ ගිහි ජනතාව වෙනුවෙන් මේ කාලය පෙන්වා දුන්නේ භික්ෂූන් වහන්සේට දන්පැන් පූජා කිරීමෙන් කරන ආමිෂ පූජාවන්ට වඩා භික්ෂූන් වහන්සේ වස් වසවා ගෙන උන්වහන්සේලා ඇසුරෙන් තමන් තුළ ගුණධර්ම දියුණු කර ගැනීමටයි. ඒ අනුව ඔවුන් බණදහම් පිළිබඳ දැනුම දදියුණු කර ගනිමින් සීලමය ප්‍රතිපදාවන්ට හා භාවනාවට යොමු වී සතියෙන් කල් යවා ආශ්‍රවයන් හීන කරගැනුමට උනන්දු වීම වැදගත් කොට සලකා තිබෙනවා. ඇතැම් අවස්ථාවක සිවුපසයෙන් උපස්ථාන කිරීමේ අවශ්‍යතාවෙන් ම බුදුරජාණන් වහන්සේ වෙත ලැබුණු වස් ආරාධනා භාර නො ගත් අවස්ථා ද තිබෙනවා. එපමණක් නොව බුදුරජාණන් වහන්සේ දවස සිට එම පිරිස් ද සීල භාවනා වඩමින් අධිගමයන්ට පවා පත්වූ බව අපේ බෞද්ධ කථාවන්හි සඳහන් වෙනවා.

මහාචාර්ය
**තුඹුල්ලේ**
**ශ්‍රී සීලක්ඛන්ධ නා හිමි**



# අරුත් දැන නිතියෙන පහන් සුවඳ දුම් පුදමු සැදැහෙන

ඝන සාරප්ප දිත්තෙන දීපෙන තම ධංසිනා
තිලොක දීපං සම්බුද්ධං පූජයාමි තමොනුදං

තුන්ලෝකයට ප්‍රදීපායමාන වූ, මොහඳුර වනසාලන
බුදුරජාණන් වහන්සේ කපුරු පහනින් පුදමි.

**සුවඳ පූජා කිරීම**

සුගන්ධිකාය වදනං
අනන්ත ගුණ ගන්ධිනා
සුගන්ධිනාහං ගන්ධෙන
පූජයාමි තථාගතං

අපමණ ගුණ සුවඳ ඇති, සුවඳවත් මුඛය හා ශරීරය
ඇති තථාගතයන් වහන්සේ මේ සුවඳින් පූජා කරමි.

**සුවඳ දුම් පූජා කිරීම**

ගන්ධ සම්භාර යුත්තෙන
ධූපෙනාහං සුගන්ධිනා
පූජයෙ පූජනීයන්තං
පූජා භාජන මුත්තමං

සුවඳ සම්භාරයෙන් යුක්ත වූ සුගන්ධ ධූමයෙන්
(සුවඳ දුමෙන්) ඒ උතුම් පූජාවට භාජන වූ සර්වඥයන්
වහන්සේ පුදමි.

## පිහිට පතයි

වාරිමාර්ග නිලධාරියෙකු වූ සුභාෂන ජයවර්ධන (59) දරුණු වකුගඩු රෝගයකින් පෙළෙන බව කියයි. ඔහුට ඕ හෝ බී පොසිටිව් හෝ බී හෝ ඕ නෙගටිව් වර්ගයේ වකුගඩුවක් බද්ධ කළයුතු බව වෛද්‍ය නිර්දේශය බව ද කියයි. පරිත්‍යාගශීලියෙකු වේනම් 0772277657 දුරකතනයෙන් විමසිය හැකි ය.

ශ්‍රී ලංකා නාවික හමුදාවේ සේවයේ නියුතු එම්.ආර්.බී. මධුරසිංහ (52) දරුණු වකුගඩු රෝගයකින් පෙළෙන බව කියයි. ඔහුට ඕ පොසිටිව් හෝ ඕ නෙගටිව් වර්ගයේ වකුගඩුවක් බද්ධ කළයුතු බව වෛද්‍ය නිර්දේශය වී ඇති බවද ඔහු කියයි. 0718103276 හෝ 0112929285 දුරකතනයෙන් විමසිය හැක.

නුගේගොඩ, තලපත්පිටිය, වැටකෙයියාවල පාර, අංක 20/14 බී හි පදිංචි ඒ.පී. ජී. අබේධීර (60) දරුණු වකුගඩු රෝගයකින් පෙළෙන බව කියයි. ඔහුට බී හෝ ඕ පොසිටිව් වර්ගයේ වකුගඩුවක් බද්ධකළ යුතු බව වෛද්‍ය නිර්දේශය බවද කියයි. ඒ සඳහා පරිත්‍යාගශීලියෙක් වෙත්නම් දුරකතන අංක 0766704797 අමතන ලෙස ඉල්ලීමක් කෙරේ.

## 02වන පිටුවෙන් පුණ්‍ය මහිමයෙන්

අපට සුගති උප්පත්තිය ලැබී තියෙනවා. එය ප්‍රධාන වාසනා ගුණයක්. අපට ඇතැම් විට නැති බැරිකම්, අගහිඟකම් ඇතිවිය හැකි යි. එය ගැන දුක් නොවී සුගතියේ උපත ලැබූ අපට එයම සතුටට කාරණයක්. ඒ නිසා පින් දහම් රැස්කර ගන්නට, ගුණ ධර්ම දියුණුවට මහන්සි ගත යුතු යි. උත්සාහයෙන් නැඟී සිටිය යුතු යි. කාල විපත්තිය අටලෝ දහමට අනුව කැරකෙනවා, පෙරළෙනවා. ඒ නිසා ඒ ගැනත් අමුතුවෙන් දුක් නොවිය යුතු යි. මොකද? බුද්ධ ශාසනයක් මනු ලොව පවතින කාලයේ අපේ උප්පත්තිය සිද්ධ වුණේ. ඒ නිසා යහපත් ගති ගුණ ඇති කරගෙන (ප්‍රයෝග සම්පත්තිය) අප හැමදෙනාට ම ලැබූ උතුම් මිනිස් දිවිය අයහපතට, නපුරට, අවැඩට ඉඩ නොදී ශාසනය තුළ බුදුවරු දේශනා කළ ආකාරයට, රහතුන් පෙන්වා වදාළ ආකාරයට, ඉතා හොඳ යහපත් ගුණ ධර්ම ඇති කරගෙන සැම දෙනාටම සම්මා සම්බුද්ධ ශාසනය තුළදීම උතුම් චතුරාර්ය සත්‍ය ධර්මාවබෝධය ලැබේවා.

## පෝය ලබන සහ ගෙවෙන වේලාවන්

**නිකිණි අව අටවක**

අගෝස්තු 11 අඟහරුවාද පූර්වභාග 09.07න් අව අටවක පෝය ලබා 12 බදාද පූර්වභාග 11.16 න් ගෙවේ. අඟහරුවාද සිල්

**නිකිණි අමාවක**

අගෝස්තු 18 අඟහරුවාද පූර්වභාග 10.39 න් අමාවක පෝය ලබා 19 බදාද පූර්වභාග 08.11 න් පෝය ගෙවේ. අඟහරුවාද සිල්.

**බිනර පුර අටවක**

අගෝස්තු 25 අඟහරුවාද අපරභාග 12.22 පුර අටවක පෝය ලබා 26 බදාද පූර්වභාග 10.39 න් ගෙවේ. අඟහරුවාද සිල්

**බිනර පුර පසළොස්වක**

සැප්තැම්බර් 01 අඟහරුවාද පූර්වභාග 09.39 න් පසළොස්වක පෝය ලබා 02 බදාද පූර්වභාග 10.51 න් ගෙවේ. අඟහරුවාද සිල්.

## ප්‍රහේලිකා අංක 14

බුදුසරණ
ත්‍යාග අනුග්‍රහය
සමස්ත ලංකා බෞද්ධ මහා සම්මේලනය

**බුදුසරණ ප්‍රහේලිකාව ඉදිරිපත් කිරීම මහාචාර්ය කිවුලේගෙදර නාරද හිමියන්ගේ අනුශාසකත්වයෙන් කේ. එල්. ඒ. රණසිංහ විසිනි.**

| | | | | | |
|---|---|---|---|---|---|
| 1 | 2 | ■ | 3 | ■ | 4 |
| ■ | | ■ | 5 | | |
| 6 | | | | ■ | ■ |
| ■ | | ■ | ■ | 7 | 8 |
| 9 | | 10 | ■ | ■ | |
| | ■ | 11 | | | |

**හරහට**

1. තම රූ සපුව ගැන මානයෙන් බුදුරදුන් ඉදිරියට යාමට මැලි වූ කුමරියයි.
5. දායකයින් මාසික ව ගමේ විහාරස්ථානයට පුදනු ලබන දානය මෙනමින් හැඳින්වෙයි.
6. ගමේ බෞද්ධයින් පුදපූජා සඳහා රැස්වන මධ්‍යස්ථානයයි.
7. හින්දු ආගමේ සඳහන්වන ප්‍රධාන දෙවිකෙනෙකුගේ නමයි
9. ආයුර්වේදයෙහි එන දියර ප්‍රතිකාරකයකි.
11. බුදුන් වහන්සේ සුර අසුර යුද්ධය ගැන මෙම සූත්‍රයෙහි දී සඳහන්කර වදාරති.

**පහළට**

2. තම රූ සපුව ගැන පලකළ මතය ගැන මෙම බමුණු දියණිය බුදුරදුන් කෙරෙහි වෛර බැඳගත්තා ය.
3. රජ මැදුරට යෙදෙන නමකි.
4. බුද්ධාදී අටතැනක් ගැන මෙවන් සිතිවිලි ඇතිවීම ද නීවරණයකි.
8. "පරිච්ජේද" යන්න සඳහා භාවිත කරන තවත් නමකි.
9. දාගැබක බිම් මට්ටමේ ඇති වළලු තුන මෙනමින් හැඳින්වෙයි.
10. අකුසල්වල විපාක වශයෙන් නිරයෙහි දී මේවා විඳින්නට සිදුවෙයි.

**පිරුවානා පොත් වහන්සේ, සප්ත බොජ්ඣංගය, මහාචාර්ය වල්පොළ රාහුල හිමියන් විසින් රචිත බුදුන් වදාළ ධර්මය ඇතුළු ධර්ම ග්‍රන්ථ කට්ටලයක් පිරිනැමේ.**

**බුදුසරණ කර්තෘ, ලේක්හවුස්, ඩී. ආර්. විජයවර්ධන මාවත, කොළඹ ලිපිනයට ප්‍රහේලිකාව පුරවා තැපැල්පතක අලවා, එහි දුරකතන අංකයක් ද සඳහන් කර එවීමට අමතක නොකරන්න.**



# දිළිඳු පුණ්ණ ධනවතකු වූ හැටි

**රජගහ නුවර පුණ්ණ නම් දුගී පුද්ගලයෙක් ජීවත්වුණා. ඔහුගේ බිරියටත්, දියණියටත් තිබුණේ එකම නමක් ඒ උත්තරා.**

ඒ කාලයේ රජගහ නුවර වැසියන් නැකැත් සැණකෙළියට සූදානම් වුණා. ඉතාමත් උත්සවශ්‍රීයෙන් ඔවුන් එය සතියක් පුරා පවත්වනවා.

මේ දුගී පුණ්ණ ගොවිතැන් කළේ සුමන නම් සිටුවරයාට අයත් ඉඩමක යි. එදින පුණ්ණ සිටුතුමාගේ නිවසට ගොස් ගොවිතැන් කරන්න කුඹුරට යන බව කීවා. එවිට සුමන සිටුතුමා අසනවා

"පුණ්ණ, අද නැකැත් සැණකෙළියට මුළු ගම ම සූදානම් වෙනවා. අද ඔබ කැමැතිනම් නිවාඩු ගන්න. කැමැති නම් වැඩ කරන්න"

"අනේ සිටුතුමනි, නැකැත් සැණකෙළිය උරුම පොහොසත් අයට යි. අපේ ගෙදර කැඳටවත් සහල් ටිකක් නැහැ. මට මේ නැකැත් සැණකෙළියෙන් වැඩක් නැහැ. ඔබතුමාගේ ගොනුන් දුන්නොත් මට පුළුවනි කුඹුර හාන්න"

සිටුතුමාගේ අවසරයෙන් පුණ්ණ ගවයන් දක්කාගෙන කුඹුරට යන අතර දී තම බිරියට කිව්වා,

"සොඳුර, අද මුළු නගරයේ ම අය නැකැත් සැණකෙළියට යනවා. ඒත් අපි දුප්පත් නිසා මම සිටුතුමාගේ කුඹුර සාන්නට යනවා. අද මට වෙනදට වඩා රසවත් ව කෑම පිළියෙළ කරගෙන එන්න" කියා.

අපගේ සැරියුත් මහ රහතන් වහන්සේ සත් දිනක් නිරෝධ සමාපත්තියට සමවැදී එදා උදෑසන සමාපත්තියෙන් නැගිට "අද කවරෙකු සඳහා ද මම උදව් කළ යුත්තේ ද?" කියා දිවැසින් බලන විට, පුණ්ණ නම් දුගියා දුටුවා. ඔහුට උදව් කරමියි සිතා ඔහු සීසාන තැනට වැඩම කර දිය වළක් සමීපයේ ඇති එක් පඳුරක් දෙස බලාගෙන සිටියා. පුණ්ණ, තෙරුන් වහන්සේ දැක සී සෑම නවතා උන්වහන්සේ වෙත ගොස් වන්දනා කර තෙරුන් වහන්සේට දැහැටි වුවමනා වී ඇතැයි සිතා පඳුරකින් කෝටුවක් කපා පිරිසුදු කර සැරියුත් මහරහතන් වහන්සේට පූජා කළා. එවිට තෙරුන් වහන්සේ පාත්‍රයත්, පෙරහන් කඩයත් ඔහුට දුන්නා. ඔහු පැන් පෙරා පාත්‍රය පුරවා තෙරුන් වහන්සේට පූජා කළා.

පුණ්ණගේ බිරිය ස්වාමියාට කෑම පිළියෙල කරගෙන එන බව දුටු උන්වහන්සේ ඇයට ද උපකාර කරමියි සිතා ඇය එන මාවතට වැඩම කළා. සැරියුත් තෙරුන් වහන්සේ මාවතේ වඩිනවා උත්තරා දුටුවා. ඇය සිතනවා,

"මට සමහර අවස්ථාවල තෙරුන් වහන්සේලා මුණ ගැසෙනවා. නමුත් මගේ ළඟ දෙන්න දෙයක් නැහැ. දෙන්න දෙයක් තිබෙන විට තෙරුන් වහන්සේලා මුණ ගැසෙන්නේ නැහැ. අද තෙරුන් වහන්සේ වැඩ සිටිනවා. දීමට දෙයකුත් මා අත තිබෙනවා. මේ අවස්ථාව මඟ හරවා ගන්න හොඳ නැහැ. සිතා හිස තිබූ බඳුන බිම තබා තෙරුන් වහන්සේට වන්දනා කර,

"ස්වාමීනි, හොඳ නරක නො බලා මට පින් උපදවා ගැනීමට මේ දානය පිළිගනු මැනයි" කියා සිටියා. තෙරුන් වහන්සේ පාත්‍රය ඇයට දුන්නා. ඇය එක අතකින් පාත්‍රය අල්ලාගෙන අනෙක් අතින් දානය බෙදුවා. පාත්‍රයෙන් බාගයක් බෙදන විට තෙරුන් වහන්සේ අතින් පාත්‍රය වැහුවා. එවිට උත්තරා කියන්නේ "ස්වාමීනි, මේ එක් අයෙකුට පිළියෙල කළ ආහාරයි. මෙය දෙකට බෙදන්න දෙයක් නැහැ. ස්වාමිනි, දුප්පත් මට මෙලොවටත්, පරලොවටත් පින් පිණිස මේ දානය පිළිගනු මැනවයි" කියා සම්පූර්ණයෙන් පාත්‍රය පිරෙන්නට දානය බෙදුවා. පාත්‍රය තෙරුන් වහන්සේට පිළිගන්වා "ස්වාමිනි, ඔබ වහන්සේ දන්නා ලද යම් ධර්මයක් වේ ද එය මට ද හිමිවේවා" යි ප්‍රාර්ථනයක් කළා. තෙරුන් වහන්සේ "එසේම වේවා" යි අනුමෝදනා කොට පහසු ස්ථානයකට සිට දානය වැළඳූ සේක.

පුණ්ණගේ බිරිය නැවත නිවසට ගොස් නැවතත් බත් පිස වහා වහා කුඹුරට ගෙන ආවා. පුණ්ණට මහත් වූ කුසගින්නක් ඇතිවුණා. වෙනදට මේ වෙලාවට බත රැගෙන එන තම බිරිය තවම ප්‍රමාද ඇයි" යැයි සිතමින් පුණ්ණ ගවයන් මුදා හැර ගසක් මුල වාඩි වී ගිමන් හරිමින් සිටියා.

"මෙතරම් වෙලා තී කුමක් කළාද"? කියා කිපී ස්වාමියා දෙස් නැගුවොත් තමන් අද කළ මහා පිනෙන් වැඩක් වන්නේ නැහැ. එනිසා මා ඉක්මණින් ඒ පින ස්වාමියාට කිව යුතුයි සිතා උත්තරා ඇත තියාම

"හිමියනි, ඔබ සිත පහදවා ගන්න. මම උදෑසනම බත ගෙන ආවා. නමුත් අතර මඟදී දම් සෙනෙවි සාරිපුත්තයන් වහන්සේ හමු වූ නිසා ඔබට ගෙන ආ බත මම උන්වහන්සේට පිදුවා.නැවත බතක් පිසගෙන ආවේ. ඔබ ඒ ගැන හිත පහදවා ගන්න.

"සොඳුරිය ඔබ කළ පින ඉතා වටී. මම ද අද උදෑසන උන්වහන්සේට දැහැටි පැන් පූජාකර ගත්තා. ඔබදෙ ඒ පින අනුමෝදන් වන්න" පුණ්ණ කිව්වා.

දවල් ආහාරය ගෙන පුණ්ණ ටික වේලාවක් ගිමන් හැරියා. ඔහු අවදි වී කුඹුර දෙස බලන විට මුළු කුඹුර රන්වන් පාටට පෙනුණා. ඔහු බිරිඳට කිව්වා

"සොඳුරිය මගේ දැස අමුතුවෙලා වගේ. මුළු කුඹුරේ ම මැටි රත්‍රං වගේ පෙනෙනවා"

"හිමියනි, මට පෙනෙන්නේත් එසේම යි" ඔවුන් කුඹුරට ගොස් එක මැටි කැටියක් කඩා ගත්විට ඒවා රන් බවට පත් වී තිබුණා. "අහෝ ආර්යයන් වහන්සේට දුන් දානයේ විපාකය අදම අපට ලැබිලා" යැයි මහත් සතුටට පත්ව, මෙ තරම් ධනයක් අපට පරිහරණය කරන්න බැහැ. අපි මෙය බිම්බිසාර රජුට කියමු" දෙදෙනා කතිකා කොට රජ මාළිගයට ගොස්,

"දේවයන් වහන්ස, මගේ කුඹුරේ පස් සියල්ලත් රන් බවට පත් වී තිබෙනවා. ඒවා රජ මාළිගයට ගෙන්වා ගනු මැන" පින ගැන දන්නා රජු අසනවා 'පුණ්ණ, මේ වගේ ධනයක් ලැබෙන්න ඔබ අද මොනවගේ පිනක් ද කළේ"

" දේවයන් වහන්ස, මම අද උදෑසන සාරිපුත්තයන් වහන්සේට දැහැටි හා පැන් පිදුවා. මගේ බිරිය මට ගෙන ආ ආහාරය උන්වහන්සේට පූජා කළා"

" පුණ්ණ ඔබලා කළ පිනට ලැබුණ ත්‍යාගයක් මේ. එයට දැන් මම කුමක්ද කළ යුත්තේ?"

"රජතුමනි, බොහෝ ගැල් යවා ඒ රන් මාළිගයට ගෙන එනු මැන"

"රාජ පුරුෂයෝ ඒ කුඹුරට ගොස් "මේ රජතුමාට අයත් රන් " යැයි කිව්වා. එසැණින් ඒවා මැටි වුණා. රාජ පුරුෂයෝ ඒ බව රජතුමාට කිව්වා. රජතුමා ඔවුන්ට කිව්වා "මේ පුණ්ණට අයත් රත්‍රං" යැයි කියන්න කියා එසේ කී විට රත්තරන් එසේම තිබුණා. රාජ පුරුෂයෝ ඒ සියල්ල ගෙනවිත් රජ මිදුලේ ගොඩ ගැසුවා. අසූ රියනක් උසට රන් ගොඩවුණා.

රජතුමා නුවර වැසියන් සියල්ලම කැඳවා

"මේ නුවර මේ ප්‍රමාණයට වඩා වැඩි රත්තරන් කාට හෝ තිබෙනවා ද?" ඇසුවා.

"දේවයන් වහන්ස" කාටවත් නැහැ" නුවර වැසියන් කිව්වා.

"දැන් අප මේ පුණ්ණට කුමක් ද කළ යුත්තේ."

" දේවයන් වහන්ස, ඔහුට සිටු තනතුරක් දෙන්න" වැසියන් කිව්වා. රජතුමා "පුණ්ණ අද සිට "බහු ධන සිටු තනතුර ඔබට පිරිනමනවා" කියා සිටු තනතුරක් පිරිනැමුවා.

ඔහු නිවසක් තනවා එයට ගෙවදීමේ දී බුදුරජාණන් වහන්සේ ප්‍රමුඛ මහා සඟ රුවන වඩමවා සතියක් පුරා දන් පිළිගැන්වූවා. අවසානයේ බුදුරජාණන් වහන්සේ වදාළ දහම් අසා පුණ්ණ , උත්තරා සෝවාන් ඵලයට පත්වුණා.

නයනා නිල්මිණී

# ජන කවි

ජන කවි යනු පරම්පරාවෙන් පරම්පරාවට පැමිණ ආරක්ෂා වී පැවත එන මාධ්‍යයකි. බොහෝමයක් උගතුන් කියන්නේ සම්භාව්‍ය සාහිත්‍යයන් බිහිවීමට පෙර මෙම ජන කවි බිහි වූ බවයි. ගැමියන් තමන්ගේ අදහස් රටට කියන්නට ද මෙම ජන කවි යොදා ගෙන ඇත. ජන කවි මිනිසාගේ විවිධ සිතිවිලි ඉදිරිපත් කරන්නට හැකි සාහිත්‍යයකි. ජනකවි යනු අපගේ උරුමයකි. එය නො නැසී පවත්වාගෙන යෑමට අප වෙහෙස ගත යුතු යි.

**රන්දෙනිගොඩයායේ**
**කුමාරකාශ්‍යප හිමි**
04 වන ශ්‍රේණිය
ශ්‍රී සුමන සාමණේර ආයතනය
හඳපානාගල

# ලෝකයම සුවපත් වේවා

චීනයේ වූහාන් වලින්
ආවානේ වෛරසයක්
කොවිඩ් කියා ලොවම දන්න
මහ විසාල වෛරසයක්

වෛද්‍යවරු හෙද හෙදියන්
රෝගීන් සුව කරන්නේ
පොලිසියෙ හමුදාවෙ අයත්
රට ආරක්ෂා කරන්නේ

ගොවි ගෙවිලියෙන් මහන්සි වී
දැයට සහල් බෙදන්නේ
පන්සල් කෝවිල් වලිනුත්
සිත සුවපත් කරන්නේ.

කොරෝනාව දුරු වේවා
ජනතාවට සුව වේවා
සියලු දෙනට සෙත් වේවා
ලෝකෙම සුවපත් වේවා

**එච්.ඒ. අශේන් ඉමංශ**
07 වන ශ්‍රේණිය
මහින්ද රාජපක්ෂ විද්‍යාලය
මාතර

# ආනන්ද මහ රහතන් වහන්සේ

ආනන්ද තෙරුන් වහන්සේ බුදුරදුන්ගේ අග්‍ර උපස්ථායකයාණන් වහන්සේවේ. උන්වහන්සේ මෙලොව බිහි වුණේ අප සිද්ධාර්ථ කුමරු බිහි වූ දම ය. ගෞතම බුදු සසුනේ ධර්ම භාණ්ඩාගාරික තනතුර උන්වහන්සේ ලබා ගත්හ. උන්වහන්සේ බුදුරජාණන් වහන්සේට මහත් ගෞරවයෙන් උපස්ථාන කළහ. බුදුරජාණන් වහන්සේ පිරිනිවන්පාන බව පළමුව වදාළේ ආනන්ද තෙරුන් වහන්සේ ට බව ඉතිහාස පොත්වල සඳහන් ව ඇත.


**මධුශානී සෙව්මිණි**
7 වන ශ්‍රේණිය
ශ්‍රී රේවත දහම් පාසල, රත්වත්ගුහාව



# සදහම් අරණ

සංස්කරණය
**නයනා නිල්මිණි**

# ළමා ප්‍රහේලිකා අංක 20




**ප්‍රථම ජයග්‍රාහකයා සඳහා බෞද්ධ කටයුතු දෙපාර්තමේන්තුවේ ත්‍රිපිටක ග්‍රන්ථ සම්පාදක මණ්ඩලයේ ලේකම් කේ.කේ. සුගතපාල මහතාගේ අනුග්‍රහයෙන් වටිනා ත්‍යාගයක් පිරිනැමේ.**

## හරහට

1. මෙම ඉන්දියානු ලෙන් විහාර බෞද්ධ චිත්‍ර සඳහා ප්‍රසිද්ධ ය.
4. සිදුහත් කුමරුන්ට නම් තැබීමට පැමිණි බමුණන්ගෙන් පළමුවැන්නා ය.
6. ත්‍රිපිටකයෙන් එකකි
8. බුදුන් වහන්සේ මේවා දසයකින් ශක්තිමත් වූ බව කියැවේ.

## පහළට

2. ඈත පෙරදිග පිහිටි බෞද්ධ රටකි
3. ලංකාවෙන් ගෙනගිය මෙම දෙවඟනගේ අගනා ප්‍රතිමාවක් ලන්ඩන් කෞතුකාගාරයේ ඇත.
5. බුද්ධ පරිනිර්වාණය සිදු වූයේ මෙම රජුන්ගේ රාජ්‍යයේ දී ය.
6. නියමිත වේලාවෙන් පිටත ආහාර ගැනීම මෙම භෝජනය ලෙස දැක්වේ.
8. දේව ධර්මය ලෙස හඳුන්වන ගුණාංග දෙකෙන් එකකි.



# මගෙ අම්මා

එගොඩ ගොඩෙත් රත්තරං
මෙගොඩ ගොඩෙත් රත්තරං
එගොඩ මෙගොඩ
රන් කුමටද?
මගෙ අම්මා රත්තරං

**ජෙත්මි සේසදී ජයසේකර**
06 වන ශ්‍රේණිය
ශ්‍රී සුධර්මවර්ධන දහම් පාසල
අවිස්සාවේල්ල

# අපේ උරුමය

අප බුදුපියාණන් වහන්සේගේ අසූහාර දහසක් ධර්මස්කන්දයෙන් ස්පර්ශ ලැබූ වාම ශ්‍රී දළදා වහන්සේ වැඩ සිටින මහනුවර ශ්‍රී දළදා මාළිගාව ප්‍රධාන විෂ්ණු කතරගම, සමන්, පත්තිනි දේවාල සහභාගිත්වයෙන් වාර්ෂික ව ඇසළ මස පැවැත්වෙන පූජා මංගල්‍යය සෙංකඩගල පුර දළදා පෙරහර යි.

මෙය අපේ බෞද්ධ සංස්කෘතික අනන්‍යතාවන් එකම ස්ථානයක දී ප්‍රදර්ශනය කරන පුණ්‍යෝත්සවයකි. කසකරුවාගේ පටන් සංදර්ශනයේ අවසානය දක්වා ලක්දිවට ආවේණික වූ නැටුම්, ගැයුම්, වැයුම් විවිධ සම්ප්‍රදායන් ඔස්සේ පෙළ ගැසී ඇත. කොඩි, සේසත් හා පංචතූර්ය නද මැද ශ්‍රී දළදා කරඬුව හිස මත වැඩමවාගත් මංගල හස්ති රාජයා සිය ගණනක් අලි, ඇතුන් පිරිවරා උඩු වියන් සහිත ව පාවඩ පිට පියවර තැබීම හා රාජ සභාව සංකේතවත් කරමින් දියවඩන නිලමේ ප්‍රධාන නිලතල දරන්නන් සම්ප්‍රදායික නිල ඇඳුමින් සැරසී ගමන් කිරීම පෙරහරේ ගාම්භීරත්වය විදහා දක්වයි. චාරිත්‍රානුකූල ව අඩ මසකින් මෙම පූජෝපහාර මංගල්‍යය නිමා වන්නේ මුළු රටටම ආශිර්වාද පතා දිය කැපීමේ මංගල්‍යයෙනි.

**සඳලි උමේෂා කරුණාතිලක**
10 වන ශ්‍රේණිය
ශ්‍රී සද්ධර්මෝදය දහම් පාසල
තලකිරියාව

# මගේ පාසල

මගේ පාසලේ නම බප/ගම්/ හේමමාලි මහ විද්‍යාලය යි. එය බස්නාහිර පළාතේ ගලහිටියාව ග්‍රාමයේ පිහිටා ඇත. මගේ පාසල ඉතා දර්ශනීය යි. ළමා ක්‍රීඩා පිටියක්, සෙල්ලම් මිදුලක්, පුස්තකාලය, බුදු මැදුරක් මගේ පාසලේ ඇත. මගේ පාසලේ විදුහල්පතිතුමා සී. හෙට්ටිආරච්චි මහතා ය. නියෝජ්‍ය විදුහල්පතිවරු දෙදෙනෙක් මගේ පාසලේ සිටිති. සියලුම ගුරු මව්පියවරු අපට ආදරයෙන් ඉගෙනුම් කටයුතු සිදු කරති. අපි ද ඔවුන්ට ඉතා ගරු කරමු. ආදරය කරමු. මගේ පාසලේ එක ශ්‍රේණියේ සිට දහතුන ශ්‍රේණිය දක්වා ශ්‍රේණි ඇත.

මම මගේ පාසල් මාතාවට ඉතා ගෞරවයක්, ආදරයක දක්වමි.

**එස්.කේ. යෙහෙනි සමාධි**
05 වන ශ්‍රේණිය
බොල්ලත ධර්මකීර්ති දහම් පාසල,
ගණේමුල්ල


B පොසිටිව් වර්ගයේ වකුගඩුවක් අවශ්‍යයි.
076-6375366, 071-3036079



අවු. 13 අඩු දරුවන් පිරිවෙනෙහි ඉගනීමට හෝ පැවිදිවීමට සියලුම වියදම් විහාරස්ථානයෙනි.
වැඩිහිටි අයද පැවිදි කිරීමට.
T.P. 0771945524


# පැන විසඳුම්

දයාවංශ ජයකොඩි සහ සමාගම

**පහත සදහම් ප්‍රශ්නයට පිළිතුර පැහැදිලි ව ලියා අප වෙත එවන්න.**

අපි පරිසරයට ආදරය කරමු යන මතෘකාව යටතේ කෙටි රචනාවක් නිර්මාණාත්මක ව ලියා අපවෙත එවන්න.

.................................................................

ජයග්‍රාහී දරුවෙකුට දයාවංශ ජයකොඩි සහ සමාගමෙන් දහම් පඩුරක් පිරිනැමේ.

## බුදුසරණ සදහම් අරණ ළමා සමාජයේ සාමාජිකයෝ


645 බී.එච්. හෙෂානි සෙව්මිණි - 7 වන ශ්‍රේණිය
ශ්‍රී ධර්මාරාම දහම් පාසල - දෙඩන්දූව
646 ජෙත්මි සේසිදී ජයසේකර - 6 වන ශ්‍රේණිය
ශ්‍රී සුධර්මවර්ධන දහම් පාසල -අවිස්සාවේල්ල
647 එස්.කේ. යෙහෙනි සමාධි - 05 වන ශ්‍රේණිය
බොල්ලත ධර්මකීර්ති දහම් පාසල -ගණේමුල්ල
648 එච්. ඒ. අශේන් ඉමංශ - 07 වන ශ්‍රේණිය
සිරිසුමනතිස්ස දහම් පාසල මාතර
649 මරදන්කඩවල සුධම්ම හිමි - 1 ශ්‍රේණිය
විද්‍යාවාස මහා පිරිවන මීරිගම

## බුදුසරණ සදහම් අරණ ළමා සමාජය

සම්පූර්ණ නම :- ..........................................
පාසල / දහම් පාසල :- ..........................................
ඉගෙනුම ලබන ශ්‍රේණිය :- ..........................................
ලිපිනය :- ..........................................
දුරකථන අංකය :- ..........................................

අව අටවක, අමාවක, පුර අටවක, පසළොස්වක පෝය දිනකම ඔබේ නිර්මාණ සදහම් අරණ පිටුවේ පළවේ. සංස්කාරිකා, සදහම් අරණ
ළමා සමාජය, බුදුසරණ කර්තෘ මණ්ඩලය, ලේක්හවුස්, කොළඹ.

# සම්බුදු සසුන එකලු කළ
# හික්කඩුවේ ශ්‍රී සුමංගල නා හිමි



**සියවස් ගණනාවක් පුරාම ලක්වැසියන්ට ගත කිරීමට සිදු වූයේ පෘතුගීසි, ඕලන්ද, ඉංග්‍රීසි ජාතිකයන්ට යටත් ව ඔවුනගේ සැහැසිකම්වලින් බොහෝ සෙයින් ම පීඩිත දුර්භාග්‍ය සම්පන්න වටපිටාවක් තුළ ය. නිදහසේ අරුණලු උදාවන සේයාවක් පෙනෙනතෙක් මානයකවත් නොතිබුණි.**

වසර දෙදහසක් ස්වාධිපත්‍යයෙන් පැවති රටක් ඉක්බිතිව පරාධීන හස්තයකට යටත්ව ජීවත්වීමට ලැබීම ලක්වැසියෝ කිසිසේත් ම නො ඉවසූහ. ඔවුහු මෙකී මහා ව්‍යසනයෙන් රට, ජාතිය, ආගම බේරා ගැනීමේ මහ සටන් ඇරඹූ හ. එහෙත් ඒවා අඛණ්ඩ ව පවත්වාගෙන යා නොහැකි විය. මෙම තත්ත්වයෙන් රට මුදවා ගැනීමට සමත් පුත් රුවනක් ලක් පොළොවේ ජනිත වේවා යි, ශාසන පාලක දෙවියන් යැදීම හැර කළ හැකි අන් දෙයක් ඔවුනට නොතිබුණි. එහි ප්‍රතිඵලයක් නිසාදෝ රටේ වාසනාවකට මෙන් වැලිවිට අසරණසරණ සරණංකර සංඝරාජෝත්තමයාණන් වහන්සේ උඩරට වැදගත් පරපුරක ජන්ම ලාභය ලැබූ හ. ඉතා දුක සේ ධර්ම විනයත්, භාෂා ශාස්ත්‍රයත් මැනවින් හදාළ උන් වහන්සේ චිරරාත්‍රඥ බහුශ්‍රැත මහා පඬිවරයෙකු බවට ද පත්ව ශාසනයත්, ජාතියත්, භාෂාවත්, පුනර්ජීවනයෙහිලා ස්වකීය කාර්යභාරය ඉතා මැනවින් සම්පූර්ණ කළ හ. එහෙත් සඟරජ මා හිමියන් ගේ අභාවයෙන් පසු එම ආලෝකය ටික කලෙකින් පහව ගොස් අන්ධකාරයේ සෙවණැලි පහළ වන්නට විය.

එම හිඩැස පිරවීමට දෝ 19 වැනි ශත වර්ෂයේ මුල් භාගයේ සිරිලක දකුණු පළාතේ ගාලු නගරයට නුදුරු හික්කඩුව නම් රමණීය ගම් පියසේදී 1827 වසරේ ජනවාරි මස 20 වැනිදා තවත් ශ්‍රේෂ්ඨ කුල කුමරුවෙකු ගේ ජන්ම ලාභය සිදු විය. උපතින් තෙළෙස් වන වියේදී එනම් වර්ෂ 1840දී "හික්කඩුවේ සුමංගල සාමණේර" නමින් උතුම් වූ ප්‍රව්‍රජ්‍යාභාවයට පත් විය. හික්කඩුවේ තිලකාරාමයේ වැඩවිසූ අරුග්ගමුවේ රේවත හිමියන්ගේ ආචාර්යත්වයෙන් ප්‍රව්‍රජ්‍යාභාවයට පත් මෙම සාමණේර හිමියෝ එවකට පළාතේ වැඩ සිටි විද්වත් යතිවරයෙක් වූ පන්නම්ගොඩ ජේතුත්තර මහ තෙරුන් වහන්සේ වෙත ගොස් සිංහල, පාලි ඉගෙනීම ආරම්භ කළහ. පුරාකෘත පුණ්‍ය මහිමයේ බලය මේ යැයි ප්‍රකට කරමින් ගුරුන් එක්වරක් කී දෙයක් සිය ගුණයෙන් තේරුම් ගැනීමට මේ ශිෂ්‍යයා සමර්ථ විය.


කාලයාගේ ඇවෑමෙන් සුමංගල සාමණේරයන් උසස් පඬිවරයෙකු වෙත භාරදී ධර්ම ශාස්ත්‍ර විෂයෙහි පරිණත වියතෙකු කිරීමට පළාත්වාසී ප්‍රභූ බෞද්ධයෝ සූදානම් වූ හ. ගුරු හිමියන් ද සමග සාකච්ඡා කොට එවකට ලංකාවේ සිටි ශ්‍රේෂ්ඨ පඬිවරයෙකු වූ රත්මලානේ පරමධම්මචේතිය විහාරාධිපති වලානේ ශ්‍රී සිද්ධාර්ථ මහා ස්වාමීන්ද්‍රයන් වහන්සේ වෙත සාමණේර නම භාර කෙරිණි. වර්ෂ කිහිපයක් උන් වහන්සේ වෙතින් සිප්සතර ද හොඳින් ප්‍රගුණ කළ සුමංගල හිමියෝ පසුව කාසිනාථ නම් බමුණු පඬිවරයෙකුගෙන් සංස්කෘත තර්ක න්‍යාය, නක්ෂත්‍රය ආදී විෂයයන් ද උගත්හ. මහනුවර මල්වතු මහා විහාරයීය උපෝසථාගාරයේදී උපසම්පදාව ලැබූ සුමංගල හිමියෝ එහි ධර්මඥණය පරීක්ෂා කිරීමේදී පරිවාර පාලිය සම්පූර්ණයෙන් කටපාඩම් දී වෙනත් ප්‍රශ්නවලට ද නිසි පිළිතුරු දී සංඝ සභාව ප්‍රබෝධවත් කළ හ. එසේම කලින් පිළියෙල කරගෙන ආ පාලියෙන් රචිත දළදා වන්දනාවට සුදුසු අෂ්ටකයන් ද සංඝ සභාව මධ්‍යයෙහි කියවූ හ. මෙම සෑම සමත්කමක් කෙරෙහි ම සංඝ සභාවේ බලවත් ප්‍රසාදය පළ වූ අතර මහ නාහිමියෝ ස්වකීය සොම්නස පළකරනු වස් හෙරණ නමට අටපිරිකරක් පරිත්‍යාග කොට මංගල සූත්‍රයෙන් පිරිත් සජ්ඣායනා කොට සෙත් පැතීම ද කළහ.

කල් ගතවෙත් ම හික්කඩුවේ සුමංගල ස්වාමීන්ද්‍රයන් වහන්සේගේ පාණ්ඩිත්‍යය ලංකාවේ ලොකු කුඩා සෑම අතර බලවත් සේ ප්‍රකට විය. ඉන් වඩාත් පිළිගැනීම වූයේ කාලයට අනුරූප ව නිසි නායකත්වය දැරීමට පරිපූර්ණ සුදුසුකම්වලින් අනූන ශ්‍රේෂ්ඨ යතිවරයෙකු ලෙසයි. මෙකල කොළඹ නගරයේ විසූ බෞද්ධ ප්‍රභූහු බුදු දහමත්, සිංහල ජාතියත්, භාෂා ශාස්ත්‍රයත් නගා සිටුවීමට අවශ්‍ය කරුණු ගැන සාකච්ඡා කරමින් සිටිය හ. බෞද්ධයන්ගේ අවශ්‍යතාවන් සම්පූර්ණ කිරීමත්, මිෂනාරී ව්‍යාපාරවලින් රට බේරා ගැනීමත් ඔවුන්ගේ මූලික පරමාර්ථයක් විය. සුමංගල හිමි පිළිබඳ කරුණු දත් ඔවුහු හික්කඩුවේ තිලකාරාමය වෙත ගොස් උන් වහන්සේ බැහැදැක ධර්ම ශාස්ත්‍ර ඉගැන්වීමට සුදුසු ආයතනයක් කොළඹ පිහිටුවන ලෙස ඉල්ලීමක් කළහ. උන්වහන්සේ ආරාධනය පිළිගෙන කොළඹ කොටහේනේ පරමානන්ද විහාරස්ථානයට වැඩම කර එහි කලක් නේවාසික ව සිටිමින් කටයුතු ආරම්භ කළහ. මේ වෙනුවෙන් දොන් පිලිප්පු සිල්වා ඇපා අප්පුහාමි, දොන් කරෝලිස් හේවාවිතාරණ මුදලිතුමා ඇතුළු 13 දෙනෙකු ගෙන් යුත් සභාවක් මගින් මරදාන ප්‍රදේශයේ අප්‍රසිද්ධ ව පැවති භූමි භාගයක් මිලයට ගත්තේ ය. එහි ශ්‍රී සුමංගල හිමියන්ගේ මූලිකත්වයෙන් විද්‍යෝදය පිරිවෙන ආරම්භ වුණි.

ශ්‍රී සුමංගල හිමියන් සතුව පැවති ප්‍රාමාණික ප්‍රඥා ශක්තිය තුළින් සමස්ත ලෝකයේම පාලි භාෂාවත්, ථෙරවාදී බුද්ධ ධර්මයත් පැතිරවීමට මෙය ඉතා හොඳම තෝතැන්නක් විය. මේ කාලය වන විට ශ්‍රී සුමංගල යන නාමය යුරෝපයේ පවා පැතිර පැවතියේ ය. විද්‍යෝදය පිරිවෙන ඇරඹීමත් සමගම පෙර අපර දෙදිසාවෙන් ම ධර්ම ශාස්ත්‍ර හැදෑරීමටත්, පාලි භාෂාව ඉගෙනීමටත් බොහෝ ශාස්ත්‍රවන්තයින් මෙරටට පැමිණියේ එබැවිනි. ලංකාවේ ද සියම්, අමරපුර හා රාමඤ්ඤ නිකායත්‍රයේ ම භික්ෂූන් වහන්සේ ශ්‍රී සුමංගල නාහිමි වෙත පැමිණ ධර්ම ශාස්ත්‍ර පිපාසය දුරුකර ගත් හ. ගිහි සාධු ජනයා වෛද්‍ය, නක්ෂත්‍ර ඇතුළු විෂයයන් ද, භාෂාවන් ද ඉගෙන පරිහානිය කරා ගමන් කරමින් තිබූ අපේ පැරණි ශාස්ත්‍රවලට නව ආලෝකයක් ගෙනදුන් හ.



ඌරුගමුවේ
අස්සජී හිමි



## බුදු රැස් විහිදෙන්නේ

දැගැබ් පන්සල් වෙහෙර ඉදිවුණා ලක්දිව බුදු සුවඳින් නැහැවී
කුල මල අතහැර බුදු සුවඳින් බොදු හදවත් සුවපත් වී
අපා දෙපා සිව්පාවුන් සමඟින් බුදු බණ ඇසුමට එක්රොක් වී
මිහින්තලාවේ ගල්කුල මුදුනේ බුදු රැස් විහිදේ පින් පුබුදවී

**අත්තනායක මුදියන්සේලාගේ සුමනාවතී**
අරලගංවිල

## ජය ශ්‍රී මහ බෝ සමිඳුන්

**බෝපත් පවන් සිලි සිලි ගා නැළවෙන්නේ**
**තිසා වැවෙන් එන සුළඟින් සිසිල ගෙනෙන්නේ**
**රුවන් වැලි සෑ රජුන්ගේ තේජස පැතිරෙන්නේ**
**පිහිටයි සැමට ජය සිරිමා බෝ සමිඳුන්නේ**

**ඇල්. ජේ. ආනන්දශීලී පෙරේරා**
උණවටුන



මෙවර ජයග්‍රාහී කවිය

## අබිනික්මන

සතර පෙර නිමිති දුටු ගිහි දිවියෙ දැක නුහුරු
නොතිර ජීවිතයෙ තතු හැඳින සිදුහත් කුමරු
අතැර තමනට උරුම රාජ සම්පත් ඉසුරු
එතෙර විය ගං තෙරෙන් ඡන්න සමඟින් මිතුරු

පැළැඳ අභරණ සේල හතික පොදිබැඳ එකට
කරුණු පැහැදිලි කරන් දුණි ඡන්න මැති අතට
ගමන දෙස බලා සිටි කුමරු යන මග එපිට
පිනැති කන්ථක එතැන මියැදුණා ලද දුකට

වට්ටාරම **ටී. ඇම් . පොඩිරාලහාමි**

## සිත නිවන දහම

රාග සිතිවිල සසල වූ විට
වේදනා දුක් දෙයි කසළ පව
කුසලයේ නිකසල පියුම් කෙමි
නිසල සිත් විල යැ'යි පිපී ඇත
සවන් සැනසෙයි නුවන් දිදුලයි
මනස් විල පිවිතුරුව සැරසෙයි
නිවුණු සිත මා නිවා සනසයි

**වික්‍රමසිංහ අතපත්තු**
තලවත්තේගෙදර



# පහන් සිතක කවි

## අනගි මෙහෙයක්

ධර්ම දානය උතුම් බව අප බුදුරජුන්ගේ දෙසුම වූවා
කිරම හිමිගෙන් ලැබෙන පොත පත කිවිඳු සතුටට හේතු වූවා
කවි පිටුවෙන් , පැන විසඳුමෙන් අනගි මෙහෙයක් කෙරෙනවා
මෙපින් බලයෙන් ඔබ හැමෝටම නිවන් පුරයේ දෙර ඇරේවා

**ශ්‍රද්ධාවතී කරන්නාගොඩ**
හොරණ



## සැනසුම ලැබේ

කෙනෙකුට එපා කිසිවිට දෙස් නගන්නට
සැලසුම් කරමු ඔහුගේ ගුණ දකින්නට
ගැරහුම් කුමට කරමුද සිත් තලන්නට
සැනසුම ලැබේ මෙත් කරුණා දයාවට

**කුසුමා ප්‍රේමරත්න**

## මරු යටතේ

ආශ්වාදය නිසා ආදීනවය දුක එහි අතුරු එලයයි
නිසරණය අරුත එහි නම් සියලු දේ අත් හැරීමයි
ධනය වතු පිටි දරුවො මම මගේ නොව හොඳ දැකීමයි
යථාබෝධය වඩනු මිස භෞතිකව ඒවා වුවමනාමයි

පුත් රුවන් ඇත ධනය මට ඇත උදව් ලෙස අප සිතන්නේ
අමනයන් ලෙස නිතර වෙහෙසෙති දුකෙන් සතුටයි ලබන්න්
නෑ කමක් හට තමන්වත් හිමි මරුගෙ යටතෙයි සිටින්නේ
මරු තමන් ගෙන නික්ම යන විට දරුවො මොනවද කරන්නේ

**ආර්. එම් . කරුණාරත්න බෝගමුව**
දේවාලේගම



සංස්කරණය
**ජම්මික ප්‍රබෝධනී වැලිකල**

## කාලය

**අතීතේ**
**අනාගතේ**
**වත්මනේ**
**සිතිවිල්ලක්**
**කාලයක් නැහැ**
**කාලයම**
**මිථ්‍යාවක්**

පරගම්මන – **නන්ද**

## සුරලොවත් නැති සැනසීම

ඇසි දිසි තුළින් දෙසූ සදහම් මෙනෙහි කර
නොතිර පස් කඳක් ගෙන ආ ගමන දුර
සිහිකර මම කියා පුහුලකු නොමැති වර
කුමටද රකිනු ජරපත් කය නොමැති තිර

පොදි ගහගෙන තදට තණ්හා සහ ආසා
නැත තේරුමක් ගත කර දවසක් පාසා
මියැදෙන එකා යළි ඉපදෙන තැන නාසා
සුරලොව ගිය ද සැනසීමක් නැත මේසා

මහනුවර අම්පිටියේ
**ඒ. කේ. ඩබ්ලිව්. පෙරේරා**

## උවදුරක උපදෙස

නොසිතු ලෙස සපැමිණී
රෝබියෙන් රට ඇලළුණි
කර්මයක පල වැනි
විපත වයිරසයක් ව වැළඳුනි

පස් පව් නොකර මින්
පිළිවෙත් හොඳට රකිමින්
සිටින විට දැහැමින්
නොවේ උවදුරු කිසිත් සැබවින්

මිරිජ්ජවිල **සිරි දන්තනාරායන**

## කවි කිවිඳියනට සතර පෝදාට ම දහම් තුටු පඬුරු

**බුදුසරණ 'පහන් සිතක කවි' නිර්මාණ පිටුව සරසන ලේඛකයන් ඇගයීම පිණිස දෙහිවල නැදිමාල බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය සහ කොළඹ සම්බුද්ධත්ව ජයන්ති මන්දිරයේ අධ්‍යක්ෂ කිරම විමලජෝති නා හිමියන්ගේ අනුග්‍රහයෙන් දහම් පඬුරු තිළිණ කෙරේ. සතර පෝදට ම හොඳම නිර්මාණ එවන ජයග්‍රාහකයන් සතර දෙනෙකුට එම තිළිණ පිරිනැමෙනු ඇත.**

## නොලද පැතුම

කොරෝනා නිසා සිදුවන දේ ලොවට
අති දුක්බර යි ඉවසනු බැහැ කිසිම විට
ලක්ෂ ගණන් ජීවිත මහ පොළොව යට
වැළලෙන සැටි දකින විට බුදු බණ එයි සිතට

ලෝකෙට රෝග දුක එක ලෙස පවතිද්දී
තව ලොකු දුකක් ඇත වයසට පත් වෙද්දී
දඹදිව් තලය සුවපත් වී පෙර පරිදී
කවද වේ ද? පැනයකි නෙත් තෙත් වෙද්දී

**කරුණා අමරකෝන්**
වැලිගල්ල

## සිත් නිවේවා

කිසිම සතෙකුගෙ පණ නසන්නට නොවන ලෙස සිත නිවේවා
තමන් සතු නැති දේ ගැනීමට සිතේ ආශා ඇති නොවේවා
පෙම පුදු පර අඹු සැමියන් කරන පව්කම් නිසරු වේවා
මේ ලෙසින් පින් කරන අය හට නිවන් මැඳුරේ දෙර ඇරේවා

**ජී. පියදස**
ගාල්ල

**බුදුසරණ**
**පහන් සිතක කවි**

BCC

**සම්පූර්ණ නම** :- ...............................................
**ලිපිනය** :- ...............................................
**දුරකථන අංකය** :- ...............................................

**අව අටවක, අමාවක, පුර අටවක, පසළොස්වක පෝය දිනකම ඔබේ නිර්මාණ 'පහන් සිතක කවි' පිටුවේ පළවේ. ඔබගේ කාව්‍ය නිර්මාණ කූපනය සමඟ පහත ලිපිනයට යොමු කරන්න. සංස්කාරිකා,පහන් සිතක කවි, බුදුසරණ කර්තෘ මණ්ඩලය, ලේක්හවුස් - කොළඹ.**

## කවරයේ කතාව



ඒහි භික්ෂු භාවයෙන් පැවිද්ද ලැබූ යස භික්ෂූන් වහන්සේ කැටුව බුදුරජාණන් වහන්සේ සිටු මැදුරට වැඩිය කල්හි යස භික්ෂූන් වහන්සේගේ මව වූ සුජාතා සිටු දියණියත්, පෙර ගිහි කල භාර්යාවද පැමිණ භාග්‍යවතුන් වහන්සේ වැඳ එක් පසෙක උන්හ.දාන කථා, සීල කථා ස්වර්ග කථාදි පිළිවෙළ කථායෙන් භාග්‍යවතුන් වහන්සේ ඔවුනට දහම් දෙසූ සේක. දහම් ඇසීමෙන් ප්‍රසන්න වූ ඔවුහු සෝවාන් ඵලයට පැමිණ තෙරුවන් සරණ ගියහ.

# පියාට කීකරු වූ දියණිය

**ඇය සැවත් නුවර ධනවත් කුලයක උපන් රූප සම්පත්තියෙන් අගතැන්පත් කුමාරිකාවකි.**

ඇයගේ දෙනුවන් නිලුපුල් පෙති පැහැයෙන් යුක්ත වූ බැවින් උප්පලවණ්ණා යන නාමය තබන ලදී.

ඇයගේ මෙම සිත් ඇදගන්නා සුළු රූප සම්පත්තිය නිසාම සැවැත්නුවර බොහෝ ධනවත් රාජ කුමාරවරු,සිටු කුමාරවරු ඇගේ අත පතා මංගල යෝජනා ගෙන එන්නට විය.


යම් හෙයිකින් එක් කුමරෙකුට සිය දූ කුමරිය විවාහ කර දුනහොත් අන් කුමාරවරු තමන් සමග උරන වන බව ඇගේ පියාණන් සිතන්නට විය.

අනතුරුව එකී ගැටුම්කාරී තත්වයක් ඇති නොවීමට නම් තම දියණිය මෙහෙණි ආරාමයක් වෙත භාරදීමට කටයුතු කළ යුතු බව උප්පලවණ්ණා කුමරියට සිය පියාණන් පැවසූ විට,ඇය ඊට එකඟ විය.

පැවිදි බවට පිළිපන් උප්පලවණ්ණා භික්ෂුණියට පොහොය ගෙය ඇමදීම,පහන් දැල්වීම යනාදී වතාවත් කිරීමටද සිදුවිය.

දිනක්,දැල්වෙන පහන් සිළුව නිමිතිකොටගෙන තේජොකසිණාරම්මරණය වඩා ද්‍යාන උපදවා රහත් භාවයට පත්විය.

ඒත් සමගම සෘද්ධි ප්‍රාතිහාර්ය පෑමේ හැකියවක් ද ඇතිවිය.දිනක පිඬුසිගා වැඩ සිටි උප්පලවණ්ණා තෙරණිය නැවත ආරමය කෙරෙහි පැමිණ තම කුටියට ප්‍රවේශ වනවාත් සමග සැඟව සිටි දූර්තකයෙකු විසින් ඇයගේ පාරිශුද්ධ භාවය කෙලෙසීමට තැත්කරන ලදී.ඒ ගිහිකල ඇගේ රූප සම්පත්තියෙන් මත්ව සිටි නන්ද නම් තරුණයෙකි.



එදා මහ රහතන් තෙරණියක් කෙලෙසීමට තැත් කිරීමේ පව නිසා ඔහු නිරයට ඇද වැටුණි.

අවසන තෙරණියගේ පූර්ව ජන්මයෙහි වූ ප්‍රාර්ථනයක් සපත වෙමින් භික්ෂුණී ශාසනයේ අග්‍ර ශ්‍රාවිකා තනතුරද හිමි විය.

**පී.ඩී.හර්ෂ විරාජ්**
*දහම් පාසල් ආචාර්ය*
*ශ්‍රී සීලරතන දහම් පාසල*
*නාලවලාන*

# කරුණා ගුණය පුරුදු කරමු

**සෙනෙහස, ආදරය, මෛත්‍රියෙන් පිරි සිතක් අපට සකසා ගන්නට හැකි නම් අද සමාජයේ පවතින බොහෝ විෂමතාවයන්ට, ප්‍රශ්නවලට පිළිතුරු සොයා ගැනීමට හැකියි. පසුගිය සතියේ මේ පිළිබඳව ඔබට දීර්ඝ විස්තරයක් කළා.**

> **ආදරය, කරුණාව, දයාව, මෛත්‍රිය, මුදිතාව නැති ජීවිතය නිශ්ඵලයි.**

ඉතින් සංවේදීශීලී හදවතක්, ආදරයෙන් මෛත්‍රියෙන් පිරුණු හදවතක් නිර්මාණය කර ගැනීමට හැකිනම් අද අප දැවෙන නේකවිධ ප්‍රශ්නවලට පිළිතුරු සොයා ගන්නට හැකිවේවි. අද ජීවත්වෙන බොහෝ දෙනෙකු තුළ මේ සංවේදි කාරණාවන් හරිම අඩුයි. ඒ නිසා කුඩා දේටත් අප කේන්තිගන්න, පළිගන්න, වෛර කරන්න හුරු වෙලා. එයින් වෙන බේදය නිතර සමාජය තුළ අත්දකිනවා.



මාලබේ ඔස්ටියෝ රෝහලේ මහාචාර්ය
**සාගර කරුණාතිලක**

එසේනම් එයින් මිදෙන්නට අප කළ යුත්තේ කුමක්ද? බුදුපියාණන් වහන්සේ දේශනා කළ ඒ මහා සද්ධර්මය අද මේ විශ්වයේ ශක්තියක් බවට පත්ව තිබෙනවා. අන්න ඒ විශ්වයේ ඇති ආශීර්වාදාත්මක මෛත්‍රියට එකඟ වෙන්න අපට හැකිනම් මේ සමාජයට රටට ලෝකයටම අපිට සෙත් පතන්නට පුළුවන්.

අද මේ ඇති ගෝලීය වසංගත තත්ත්වයන්ට, ලෝකයේ විවිධ රටවල ඇති වර්ගවාදී සටන්වලට, දැවෙන සිත් ඇති මිනිසුන්ට, මේ මහා මෛත්‍රියෙන් සෙත් පතන්නට පුළුවන්. ඇත්තටම මෙය ඔබට මට අපි හැමෝටම කරන්නට හැකි සරල අභ්‍යාසයක් කියලයි මම දකින්නේ. අභ්‍යාසය සැහැල්ලු වූවාට ප්‍රතිඵලය සුවිශාලයි.

මෙතැන දී එක දෙයක් කිවයුතුයි. විශ්වයේ ඇති මහා මෛත්‍රියට එකාග්‍ර වෙන්න සංයෝග වෙන්න ප්‍රධාන කරුණු කිහිපයක් වැදගත් වෙනවා. ඉන් පළමු දේ මේ පිළිබඳ අප තුළ ඇති වුවමනාව. දැවෙන වුවමනාව. තමන් වෙනුවෙන් ලෝකයේ ජීවත්වෙන මිනිසුන් වෙනුවෙන් ස්වභාදහම, ගහකොළ සතා සිව්පාවට කරුණාව, දයාව, ආදරය, මෛත්‍රිය පතුරුවන්න අප තුළ වුවමනාව ඇති කර ගැනීමයි වැදගත්. දෙවැන්න මහා කරුණාවට, මෛත්‍රියට, ආදරයට ඒකාග්‍ර වීම.


කතාවක් තියෙනවා විශ්වයේ සියලු අභිරහස් දැනගැනීමට තරම් මහා ඥානවන්තයෙක් වුණත් සක්විති රජු වුණත් ආදරය, කරුණාව, දයාව, මෛත්‍රිය, මුදිතාව නැතිනම් නිශ්ඵලයි කියලා.

ඒ නිසා මේ විශ්වයේ මහා කරුණාව දයාව අපට ලබා දී ඇත්තේ එය මනුෂ්‍යයින් විදිහට පතුරුවන්න. මෙය අප එකිනෙකා විසින් කළ යුතු සරල අභ්‍යාස ක්‍රමයක්. මුලින්ම අප තුළ ඇති වැරැදි නිවැරැදි කර ගැනීම හා අවබෝධ කර ගැනීම ඉතාම වැදගත්. තමන්ගේ සිතුවිලි තුළ කෙනෙකුට ඇති වෛරය, ඊර්ෂ්‍යාව, ක්‍රෝධය අප ඉවත් කර ගැනීම සිදු කළ යුතුම දෙයක්. තමන් තුළ මෛත්‍රිය ඇති කර ගැනීම අප කළ යුතුයි.

මෙම අභ්‍යාසය සඳහා සුදුසුම වේලාව රාත්‍රී නින්දට යන කාලය හා උදෑසන අප අවදිවෙන කාලයයි. මේ කාල සීමාවල පරිසරයේ ඇති නිස්කලංක බව මෙහිදී ඉතාම වැදගත්. තමා සන්තකයේ ඇති දූරකතන විසන්ධි කර මේ නිස්කලංක බවට අප එකතුවිය යුතු යි. මානසික මෙන්ම කායික නිදහස ඇතිව අපි මෛත්‍රියට එකඟ වෙන සරල ක්‍රමවේදයේ පියවර ලබන සතියේ කතා කරමු.







තිස් වසරක යුද්ධය මැද නාගදීපය රැකගත් නා හිමියන්ගේ කතාව

12 කොටස

# සාමණේර හිමිවරු ගම්මඩු බලන්නට යති

'විමල ධර්මදූත මධ්‍යස්ථානයේ සිට සාරානන්ද පිරිවෙනට කිලෝමීටර් 4ක් පමණ දුරක් තිබුණු නමුත් පදුමකිත්ති හිමියෝ ඒ දුර පයින්ම වැඩම කළහ. ප්‍රමාද වූ දිනක දී හෝ වර්ෂාව පැවැති දිනක දී හැරෙන්නට පදුමකිත්ති හිමියන් උදෑසන බස් රථයෙන් වැඩම කෙළේ නැත.'

නවදගල පදුමකිත්ති හිමියන් නාගදීපයේ දෙමළ තරුණයින් හා එක්ව විවිධාකාර ක්‍රියාකාරකම්වලට සහභාගි වීම ගැන නාහිමියන් එතරම් කැමැත්තක් දැක්වූයේ නැත. උතුරේ මතුව ඇති දෙමළ තරුණයින්ගේ යම් යම් උද්ඝෝෂණ කළ බලකාරීත්වයන්ට එය හොඳ සංහිඳියාවක් වුවත් පදුමකිත්ති හිමියන් වැඩි වශයෙන් තරුණයින් හා එක්වුවහොත් අධ්‍යාපන කටයුතු අඩපණ කර ගනු ඇතැයි උන් වහන්සේ සිතූහ.

එහෙත් පදුමකිත්ති හිමියන් සතුන්ට දැඩි සේ කරුණාවෙන් කටයුතු කරනු දැකීම නම් නාහිමියන්ගේ සතුටට හේතු විය. විහාරස්ථානයේ සිටි සුනඛයෙක් පවා පදුමකිත්ති හිමියන්ට දැක්වූයේ පුදුමාකාර ආදරයකි. පදුමකිත්ති හිමියන් කොතැන ද එම සුනඛයා ද උන් වහන්සේ පසුපස ය. පදුමකිත්ති හිමියන්ද එසේම ය. එසේ වුවත් අධ්‍යාපන කටයුතු උදෙසා පදුමකිත්ති හිමියන් අනුරාධපුර ගුවන් තොටුපොළ ආසන්නයේ පිහිටි ශ්‍රී විමලධර්මදූත මධ්‍යස්ථානයට යොමු කරන්නට නාගදීප විහාරාධිපති නා හිමියෝ කටයුතු කළහ. එයට තවත් හේතුවක් තිබුණි. ඒ වන විට නාගදීපයේ නා හිමියන් විසින් පැවිදි කළ සාමණේර හිමිවරුන් කිහිප නමක් ම සිවුරු හැර ගොස් තිබුණි. ඒ නිසා පදුමකිත්ති හිමියන් රැක ගැන්ම ද නාහිමියන්ගේ අරමුණ විය.

විමලධර්මදූත මධ්‍යස්ථානයෙහි විහාරාධිපති මාතර විමලරතන හිමියන් විසින් පදුමකිත්ති හිමියන් සාරානන්ද පිරිවෙන් විහාරාධිපති ගිරාඹේ ආනන්ද හිමිට බාර කළහ.

එතරම් දියුණු තැනක් නොවූ විහාරස්ථානයේ පදුමකිත්ති හිමියන් ඇතුළු සාමණේර හිමිවරුන් නේවාසික ව සිටියේ වට වූ ධර්මශාලාවක ය. නා හිමියන් වැඩ සිටියේ පොල්අතු සෙවිලි කළ කුඩා කුටියක ය.

නා හිමියන් වහන්සේ වෙනුවෙන් වෙනම කුටියක් ඉදි කර දෙන්නට යුද හමුදාව විසින් කටයුතු කරන ලදී.

විමලධර්මදූත මධ්‍යස්ථානයේ සිට සාරානන්ද පිරිවෙනට කිලෝමීටර් 4ක් පමණ දුරක් තිබුණු නමුත් පදුමකිත්ති හිමියෝ ඒ දුර පයින්ම වැඩම කළහ. ප්‍රමාද වූ දිනකදී හෝ වර්ෂාව පැවැති දිනක දී හැරෙන්නට පදුමකිත්ති හිමියන් උදෑසන බස් රථයෙන් වැඩම කළේ නැත.

අවට තිබුණු ගුවන් විදුලි සංස්ථාව මෙන්ම ගුවන් හමුදා කඳවුර උන් වහන්සේගේ සිත් ගත් ස්ථාන අතර විය.

නාගදීපයේ නා හිමියන් විසින් මාසික ව රුපියල් 250.00ක මුදලක් ධම්මකිත්ති නා හිමියන්ට එවන ලදී. ඒ පදුමකිත්ති හිමියන්ගේ විය පැහැදම් වෙනුවෙනි. එසේම යම් යම් අවශ්‍යතාවන්ට මුදල් අවශ්‍ය වූ විට ඒවා සපයා ගැන්ම ද පදුමකිත්ති හිමියන්ට තරමක් ගැටලු මතු කරන්නක් විය. උන් වහන්සේ පමණක් නොව නේවාසික ව වැඩ සිටි සියලුම සාමණේර හිමිවරුන් තම අනෙකුත් අවශ්‍යතා වෙනුවෙන් මුදල් සපයා ගත්තේ උන් වහන්සේට ලැබුණු පිරිකර අලෙවි කරගෙන ය. එම පිරිකර අලෙවිය ශාසනයට කරනු ලබන කැප කිරීමක් වන හෙයින් එයින් කිසිදු ආකාරයක පාපයක් වේ යැයි පදුමකිත්ති හිමියෝ ද නොසිතූහ. පිරිවෙනේ සිට විහාරස්ථානයට පැමිණෙන මාසික බස් ගාස්තු සඳහාද පදුමකිත්ති හිමියන්ට වැය වූයේ රුපියල් 10.00ක මුදලක් පමණි.

නාගදීපයේ නා හිමියන්ගෙන් ඉල්ලා සිටියහොත් ඕනෑම මුදලක් අධ්‍යාපනය වෙනුවෙන් ලබාදෙන බව දනිතත් පදුමකිත්ති හිමියෝ ඒ ගැන නා හිමියන්ට කරදර කරන්නට අකමැති වූහ.

එහි නැවතී සිට අධ්‍යාපන කටයුතු සිදු කළ දෙදෙනෙක් ද විය. ඒ සරත් හා සුනිල් ය.

මේ දෙදෙනා ම වැඩිකලක් නොගොස් පදුමකිත්ති හිමියන්ගේ සමීප මිතුරන් බවට පත් විය. දිනක් සරත් පැමිණ පදුමකිත්ති හිමියන්ට යෝජනාවක් කෙළේ ය.

"හාමුදුරුවනේ ගම්මඩු උලෙළක් තියෙනවා බලන්න යමු ද?"

"ගම්මඩුවක්....." පදුමකිත්ති හිමියෝ පුදුම වූහ. කිසි දිනෙක ගම්මඩු උලෙළක් නරඹා නොතිබූ පදුමකිත්ති හිමියෝ එයට එකඟ වූහ. එහෙත් උන් වහන්සේ ඒ සම්බන්ධ ව මඳක් විපරම් කෙළේ එයට සහභාගි වන්නේ කවුරුන්ද යන්න සොයා බැලීමටයි. එයට එහි සිටි අනෙක් සාමණේර හිමිවරුන් තිදෙනා ම සහභාගි වන බව දැනගත් පදුමකිත්ති හිමියෝ ද කැමැත්ත පළ කළහ.

නායක හිමියන් සැතපෙන්නට ගිය පසුව සාමණේර හිමිවරුන් සිවු නම සරත් හා සුනිල් සමඟ එක්ව ගම්මඩුව බලන්නට ගියහ. බස් රථයේ නැඟී සැලකිය යුතු දුරක් යාමට සිදුවූ අතර ඇතැම් අය හුලු අතු පත්තු කරගෙන පැමිණියේ මඟ දෙපස අඳුරු නිසා ය. බස් රථයෙන් බැස පිරිස ගම්මඩුව භූමියට යන විට අවට සිටි ඇතැම් පිරිස් සාමණේර හිමිවරුන් දෙස බැලුවේ අමුතු බැල්මකිනි. සෙසු සාමණේර හිමිවරුන් ඒ දෙස බලමින් තරමක් තැති ගැන්මකින් යුතුව ගමන් කළ ද පදුමකිත්ති හිමියෝ ඒ කිසිවක් ගණනකට නොගත්හ.

සරත් හා සුනිල් සමඟ සාමණේර හිමිවරුන් එදින අලුයම විහාරයට පැමිණ හොර රහසේ ම නවාතැන්වලට ඇතුළු වූ අතර උදෑසනම අවදි වූයේ පෙරදින හොරෙන් ගිය ගමන ගැන නායක හිමියන් දැන ගන්නට ඉඩ ඇති නිසා ය.

මේ ලෙසින් අනුරාධපුර අවට පැවැත්වූ ගම්මඩු මෙන්ම සැණකෙළි කිහිපයක්ම නැරඹීමට පිරිස කටයුතු කළහ. දිනක් අනුරාධපුර අසල පැවැති සැණකෙළියක් නැරඹීමට ගොස් සිටි අවස්ථාවේ දී එය දුටු අයෙක් විහාරය අසල සිටි දායක මහතකුට ඒ බව පවසා තිබුණි. ඒ ඔස්සේ නා හිමියන්ට මේ බව සැල කෙරුණේ 'ගමරාල කපුටු පිහාටුවක් වමනය කිරීම කපුටන් 7 දෙනකු වමනය කළ' අයුරිනි.

"විහාරවාසී සාමණේර හිමිවරුන් රාත්‍රියේ හොරෙන් ගොස් චිත්‍රපට බලනවා" යනුවෙන් නායක හිමියන්ට පැමිණිල්ලක් ආවේ ය.

නායක හිමියන් ඒ සම්බන්ධ ව එතරම් සැලකිල්ලක් දැක්වූයේ නැත. එහෙත් දින දෙක තුනකින් පසුව යළිත් සැණකෙළි මේලාවක් නරඹන්නට පිරිස ගිය පසු, පසු දිනම නායක හිමියන්ට කතාව ඇදී ගියේය. ඒ සමඟම විහාරස්ථානයේ ප්‍රධාන දායකයන් තිදෙනකු විහාරස්ථානයට පැමිණියහ. ඔවුහු නායක හිමියන්ට පවා දෙස් තඟමින් විහාරස්ථානයේ සිට කෑ මොර දෙන්නට වූහ.

"ශාසනේ විනාශ කරන්න ආපු කාපාලුවො, මොකට මහණ කළාද?"

"නායක හාමුදුරුවොත් ඇහැ කන පියාගෙන ඉන්නවා, හෙට අනිද්දට මෙතන තව හොඳ හොඳ සෙල්ලම් වෙයි"

ඒ ප්‍රකාශ හමුවේ වුවද නායක හිමියෝ නොසැලී සිටියහ. එයින් පැමිණි පිරිස තවත් ආවේගශීලීව කෑගැසූහ.

"සිවුරු ගලවල ගහල එළවන්න තියෙන්නෙ"

"නායක හාමුදුරුවොත් මේවට වග කියන්න ඕන" එක් අයෙක් ආවේගශීලී ව නායක හිමියන් දෙසට ඇඟිල්ල දිගු කරමින් කෑගැසීය.

මේ සියල්ල දෙස බලා සිටි පදුමකිත්ති හිමියෝ දැඩි සේ කුපිත වූහ. තමන් වහන්සේට කුමන අපහාසය කළත් නායක හිමියන්ට දෝෂාරෝපණ කිරීම නම් උන් වහන්සේ නොඉවසූහ.

"ඇයි උඹලා කන්න බොන්න දීල ද අපව එළවන්න හදන්නෙ, අපේ නායක හාමුදුරුවන්ට බණින්න උඹල කවුද? සිවුරු ගලවල දාන්න හදන්නේ උඹලද, අපිට සිවුරු පෙරෙව්වෙ, මේ සිවුරු දා ගත්තෙ ගලවන්න නෙමෙයි බොල, අපවත් වුණු දාට තමයි මේක ගලවන්න වෙන්නෙ, බැහැපියව් මෙතනින් මගෙන් දෙර පොල්ලෙන් කන්නෙ නැතුව" පදුමකිත්ති හිමියන්ගේ හඬට පැමිණි පිරිස තුෂ්ණීම්භූත වී උඩ බිම බලන්නට වූහ.

නායක හිමියන් ද පදුමකිත්ති හිමියන් දෙස එක එල්ලේ බලා පුදුම වූහ.

පැමිණි පිරිස පසු බැස ගියේ එතැනින් පසු වචනයකුදු නොදෙඩා ය. විහාරස්ථාන භූමියෙන් එළියට බසින තුරු ඔවුහු පසු පස හැරී බැලුවේවත්, අනෙකා සමඟ කතා කෙළේවත් නැත.

එදින වෙනදා මෙන් නොව වැහි අඳුරු දිනයක් මෙන් නිහඬවම ගෙවී යන්නට විය. කිසිවෙක් වැඩි කතාබහක් ද නොවීය.

පසු දින උදෑසන පදුමකිත්ති හිමියන් පිරිවෙනට වැඩම කරන විට නායක හිමියන් පෙනෙන්නට සිටියේ නැත. නා හිමියන්ගේ කුටියේ දොර වසා තිබුණු හෙයින් උන් වහන්සේ උදෑසනම කොහේ හෝ වඩින්නට ඇතැයි උන් වහන්සේ මෙන්ම අනෙක් සාමණේර හිමිවරුද සිතූහ.

(මතු සම්බන්ධයි)

තාරක වික්‍රමසේකර




බුදුසරණ

## පාලි පාඩම

40 - කොටස



සැකසුම
කොටනෙලුවේ
පුඤ්ඤකදානන්ද හිමි

## අම්භාකං ගාමෝ - අපේ ගම

1.අඤ්ඤ = අන්‍ය වූ
2.අත්ථා ය = පිණිස, සඳහා
3.ආසන්නහ = ළං වූ, ළං වූ තැන
4.උගග ණ්හා ති = ඉගෙන ගනී
5.කුල = පවුල
6.ධම්ම සාලා = ධර්මශාලාව
7.ගාමමජ්ඣ = ගමමැද
8.උත්තරපස්ස = උතුරුපැත්ත
9.උන්නජතට්ඨාලන = උස්තැන
10.එකච්ච = ඇතැම්
11.දාරිකා = ගැහැනු ළමයා
12.පටිමාඝර = පිළිම ගෙය
13.පතිට්ඨිත = පිහිටි
14.පතිට්ඨාපිත = පිහිටුවන ලද
15.පදුම = පියුම
16.පුප්ඵති = පිපේ
17.පොක්ඛරණී = පොකුණ 18.බහු = බොහෝ වූ
19.මච්ඡ = මාළුවා
20.මහන්ත = මහත්
21.ද්විසත - මත්ත = දෙසීයයක් පමණ
22.නහානත්ථාය = නෑම පිණිස
23.පණ්ණච්ඡදන = අතු සෙවිලිකළ වහළ ඇති
24.ඉට්ඨකච්ඡදන = උළු සෙවිලි කළ වහළ ඇති

අම්භාකං ගාමෙ බහූනි ගෙහානි සන්ති.
එකස්මිං ගෙහෙ එකෙකං කුලං වසති.
එකච්චානි ගෙහානි මහන්තානි
ඉට්ඨකච්ඡදනානි එකච්චානි ඛුද්දකානි
පණ්ණච්ඡදනානි.
ගාමමජ්ඣෙ එකා පාඨසාලා
පතිට්ඨිතා. තස්ස ද්විසතමත්තා සිස්සා
උග්ගණ්හන්ති. දාරිකානමත්ථාය
අඤ්ඤා පාඨසාලා පතිට්ඨිදතා.
ගාමස්ස උත්තරපස්සෙ
උන්නතට්ඨානෙ එකො විහාරො
පතිට්ඨිතො තස්මිං එකං චෙතියං,
එකං පටිමාඝරං එකා ධම්මසාලා ච
සන්ති.
තස්සාසන්නෙ නහානත්ථාමය එකා
පොක්ඛරණී තස්සං පොක්ඛරණීයං
පදුමානි පුප්ඵන්ති බහූ මච්ඡාපි වසන්ති
.

**මෙම පාඩම මෙම සතියේ සිකුරාදා සහ ඉරිදා රාත්‍රී 8.45ට බෞද්ධයා රූපවාහිනියෙන් ද (The BuddhistTV) සඳුදා සවස 3.30ට බෞද්ධයා ගුවන් විදුලියෙන් ද විකාශනය වේ. ඔබට පසුගිය වැඩසටහන් සියල්ල අන්තර් ජාලයෙන් ද නැරඹිය හැකි ය. ඒ සඳහා පිවිසෙන්න. Magadhi (මාගධී) හෝ Kotaneluwe thero (කොටනෙලුවේ හිමි) යනුවෙන් සොයන්න.**

බුදු සරණ

# වනමන්දාව රාජ මහා විහාරය

කුරුණෑගල දිස්ත්‍රික්කය යනු රාජධානි හතරකින් සමන්විත ලංකාවේ එකම දිස්ත්‍රික්කය ලෙස හැඳින්විය හැකි ය. කුරුණෑගල, දඹදෙණිය, යාපහුව සහ පඬුවස් නුවර ඒ රාජධානි හතරට අයත් ප්‍රදේශයන් ය. මෙම ප්‍රදේශයන් ආශ්‍රිත ව අපේ ඉතිහාසයේ බොහෝ පුරාවෘත්තයන් සැඟව පවතී.







දඹදෙණි රාජධානියට ඉතා සමීප ව පන්නල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් නාරංගොඩ ඇටබේ නම් වූ සුන්දර ගම්මානයෙහි පිහිටි වනමන්ද්‍රව රාජමහා විහාරය හැඳින්විය හැකි ය. මෙම විහාරයේ පුරාවෘත්තය ක්‍රිස්තු පූර්ව 1 වැනි සියවස දක්වා ඈතට දිවයයි. වළගම්බා රජතුමන් සැඟව සිටිමින් සිය සේනාව සංවිධානය කර ඇත්තේ මෙම වනමන්ද්‍රව රාජමහා විහාර භූමියේ සිට බව ජනප්‍රවාදයේ සඳහන් ව ඇත. ඉන්පසු කාලීනව අසරණ සරණංකර සංඝරාජ නා හිමියන් ද මෙම විහාරස්ථානයේ වැඩ වාසය කළ බවට සංඝරාජ සාධු චර්යා නම් වූ ඉපැරැණි ග්‍රන්ථයක සඳහන් වී ඇත. මෙම විහාරස්ථානය පිහිටි ගමට යාබදව ඇත්තේ හමන්ගල්ල නම් වූ පිටිසරබද ගමකි. ඉතිහාසයේ මෙම ගම හඳුන්වා ඇත්තේ සමන්ගල්ල යනුවෙනි.

දඹදෙණි රාජධානියෙහි රජකම් කළ දෙවැනි පරාක්‍රමබාහු රජතුමන්ට දළදා හාමුදුරුවන් වන්දනා මාන කිරීම සඳහා සමන්පිච්ච මල් ලබා දී ඇත්තේ මෙම ගම්මානයෙන් නිසා එම ගම සමන්ගල්ල ලෙස හඳුන්වා ඇති බවත්, අද වන විට එම ගම හමන්ගල්ල නමින් හඳුන්වන බව ත් පැරැන්නෝ සඳහන් කරති.

එසේම වනමන්ද්‍රව රාජමහා විහාරය පිහිටි භූමිය එදා වනමලින් පිරුණ වනාන්තරයක් ව තිබී ඇති අතර, ලැව් ගින්නකින් එම වනය ගිනිගෙන විනාශ වී ඇත. ඒ හේතුවෙන් 'වන මන් දෑව' ලෙස හඳුන්වා ඇති අතර අද එම ස්ථානය වනමන්ද්‍රව ලෙස ප්‍රකට ව ඇති බවද ජනප්‍රවාදයේ සඳහන්ව ඇත. අද වන විට මෙම ඓතිහාසික පුණ්‍ය භූමිය දිවයිනේ දස දෙස විසිරී සිටින බෞද්ධ බැතිමතුන්ගේ වන්දනා මානායට පාත්‍ර වූ විහාරස්ථානයක් බවට පත්ව ඇත.

රමණීය වන පියසකින් හා ගල් තලාවලින් සුසැදි මෙම වනමන්ද්‍රව රාජමහා විහාර භූමිය සියලු විහාරාංග වලින් සමන්විත ය. වළගම්බා රජ දවස ඉදිකළ විහාරමන්දිරය කටාරම් කෙටූ ගල් පර්වතයක් යට අදත් විරාජමානව පවතී. බුදුන් වහන්සේගේ පිරිනිවන විදහා දක්වන සැතපෙන පිළිම වහන්සේ හා සමාධි බුදුරුව මෙන්ම තනි කලුගල මත අඳින ලද සිතුවම් ඉතා කලාත්මක ය. ඉපැරැණි විහාර මන්දිරය ඉදිරිපස බෝධීන් වහන්සේලා දෙනමක් දහම් සිසිල බෙදා දෙයි.

එම බෝධීන් වහන්සේලා පිහිටි භූමියට මදක් ඉහළින් සුදෝ සුදු චෛත්‍ය රාජයාණන් බබළයි. චෛත්‍ය රාජයාණන් ඉදිරි පසින් පිවිසෙන්නේ රමණීය වන පියසකට ය. ගල් පර්වත පුස්වැල් මෙන්ම නුග නා වැනි වෘක්ෂලතාවලින් සෙවන දෙන ගල්තලා මත සුජාතා සිටු දියණිය බුදුන් වහන්සේට කිරිපිඬු පූජා කිරීම, වෙස්සන්තර ජාතකය, 'මහින්දගමනය', බුදුන් වහන්සේගේ දුෂ්කර ක්‍රියාව. වැනි ජීවමාන ප්‍රමාණයේ පිළිරූ ඉතා දර්ශනීය ලෙස මේ සොඳුරු වන උයන පුරා ඉදිකර ඇත. විහාර භූමියට ඇතුළුවන විට වම් පසින් අසූමහා ශ්‍රාවක පිළිම වහන්සේ නිර්මාණය කර ඇති අතර එම දසුන ඇස ගැටෙන විට ඇති වන්නේ සිත් නිවී සැනසෙන හැඟීමකි. සොබා දහමේ අපූරු නිර්මාණයක් වන මෙම වනමන්ද්‍රව, පින්බිම තුළ ස්වභාවික පරිසරයට කිසිදු හානියක් නොවන සේ මේ සියලු නිර්මාණ ඉදිකර ඇත. ඉලිපංගමුවේ සෝමරතන හිමියන් මෙම විහාරයේ ආරම්භක විහාරාධිපතීන් වහන්සේ ය. ඉන් පසුව ඊරියමඩින්නේ සෝනුත්තර හිමි, ඇටබේ සීලරතන හිමි, මං ගෙදර සිරිරතන හිමිවරුන් යන මෙම විහාරස්ථානයේ ආදි කර්තෘවරුන් සේ සඳහන් කළ හැකි ය.



විහාරාධිකාරී ගෞරව ශාස්ත්‍රවේදී නැදගමුවේ සිරිධම්ම හිමි

නාරංගොඩ සංඝානන්ද නාහිමියන් වර්තමාන විහාරාධිපති ධූරය හොබවන අතර උන්වහන්සේගේ මඟ පෙන්වීම හා අනුශාසකත්වයෙන් විහාරාධිකාරී ගෞරව ශාස්ත්‍රවේදී නැදගමුවේ සිරිධම්ම හිමියෝ මෙම පුණ්‍ය භූමිය සීඝ්‍ර දියුණුවක් කරා මෙහෙයවමින් සිටිති.

බුද්ධ චරිතයේ විවිධ අවස්ථා නිරූපණය වන නිර්මාණ කීපයක් මේ වන පියස තුළ ඉදි කිරීමටත් දිවයිනේ දස දෙසින් පැමිණෙන සැදැහැවතුන්ට නවාතැන් ගැනීම සඳහා විශ්‍රාම ශාලාවක් ඉදිකිරීමටත් බලාපොරොත්තු වන බව සිරිධම්ම හිමියෝ සඳහන් කරති. සත් කෝරළයට ආවේනික වූ තුරු ලතාවන්ගෙන් මෙන්ම, සියොතුන්ගේ මිහිරි නදින් මෙන්ම බෝධීන් වහන්සේගේ සිසිලසින් හදවත් සුවපත් කරගන්නට සතියේ විවේක දිනයක මෙම පින්බිමට එන්න.ඇවිත් ඒ නිරාමිස සුවය විඳගෙන ඔබේ පා සටහන් පමණක් මේ පින්බිමේ තබා යන්න.

ඔබ ගිරිඋල්ල දෙසින් පැමිණෙනවානම් කුරුණෑගල මාර්ගයේ මාහරගම හන්දියෙන් හැරී හමන්ගල්ල හරහා (කිලෝ. 04) ක දුර ගෙවා මෙම පුදබිමට පැමිණිය හැකි ය. පන්නල කුලියාපිටිය මාර්ගයෙන් එනවානම් පරගම්මන ඉන්ධන පිරවුම්හල අසල ඇති මාහරගම දක්වා යන මාර්ගයේ (කිලෝමී. 10) ක දුර ගෙවා මෙම පුදබිමට පැමිණිය හැකි ය.

විශේෂ ස්තූතිය - විහාරවාසී හමන්ගල්ලේ සිරි සුජාත හිමියන්ට සහ සෝමවීර පතිරාජ, ජී.ඒ.අයි.නිශ්ශංක මහත්වරුන්ට)

රත්නසිරි පතිරණ

ඡායාරූප
සරත් විජේසූරිය, ගිරිඋල්ල සමූහ



වර්ෂ 2020 ක් වූ අගෝස්තු 11 වනදා අඟහරුවාදා කොළඹ ඩී. ආර්. විජයවර්ධන මාවතේ අංක 35 දරණ ස්ථානයේ පිහිටි ලංකාවේ සීමාසහිත එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම විසින් මුද්‍රණය කරවා ප්‍රසිද්ධ කරන ලදී.